වාර්ෂික කාර්යසාධන වාර්තාව

2019

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය

පෙරවදන

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2019, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් ලබාදී ඇති උපදෙස් අනුව සකස් කර ඇත.

මෙම වාර්තාව මඟින් මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

පටුන

1 වන පරිච්ඡේදය – ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම 01

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 02-03

1.3 ප්‍රධාන කාර්යභාරයන් 04

1.4 සංවිධාන සටහන 05

1.5 මහාමාර්ග අංශය පිළිබඳ හැඳින්වීම

1.5.1 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශයන් 06

1.6 වෙනත් ව්‍යවස්ථාපිත ආයතන 12

1.7 මහාමාර්ග අංශයේ ආයෝජනය 13

1.7.1 විදේශාධාර ව්‍යාපෘතීන්හි සාරාංශය 15

2 වන පරිච්ඡේදය – ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

I වන වෙළුම – විදේශාධාර ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2.1 නව ආයෝජනයන් 17

2.1.1 මහනුවර හා එම තදාසන්න ප්‍රදේශවල මධ්‍යම අධිවේගී මාර්ගය හා සම්බන්ධිත මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 17

2.1.2 කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් 02 ක් ඉදිකිරීම 17

2.1.3 කෝකිලායි පාලම ඉදිකිරීම 18

2.2 අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන 21

2.2.1 අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණය 21

2.2.2 පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය 23

2.2.3 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 25

2.2.4 දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය 28

2.2.5 නව කැලණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණුමත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය 30

2.2.6 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය 32

2.2.7 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 33

2019 වර්ෂයේදී අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සහ ඉලක්ක සපුරා ගැනීමෙහි සාරාංශය 35

2.3 මහාමාර්ග සංවර්ධන වැඩසටහන

2.3.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය 37

2.3.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම (මාර්ග නඩත්තු භාරකාර අරමුදල) 38

2.3.3 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය 39

2.3.4 රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය 41

2.3.5 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (A005) මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය 42

2.3.6 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල II) 44

2.3.7 උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය 45

2.3.8 අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණුකිරීමේ සැලසුම් ව්‍යාපෘතිය 46

2.3.9 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල) 47

2.3.10 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 48

2.3.11 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර I 50

2.3.12 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව) 51

2.3.13 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I 52

2.3.14 දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන 54

2.3.15 රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය 56

2.3.16 ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය 56

2.3.17 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර II 57

2.3.18 බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය- අදියර III 58

2.3.19 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 59

2.3.20 මධ්‍යම හා ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 60

2.3.21 ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය 61

2.3.22 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය 62

2019 වර්ෂයේදී මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සහ ඉලක්ක සපුරා ගැනීමෙහි සාරාංශය 64

2.4 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 67

2.4.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 67

2.5 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම

2.5.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය 73

2.5.2 පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම 74

2.5.3 ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II 74

2.5.4 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම 75

2.5.5 පාලම් 46 ක් නැවත ඉදිකිරීම 77

2.5.6 ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 77

2.5.7 දෙවන නව කැළණි පාලම ඉදිකිරීම 78

2.5.8 පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS) හා පාලම් තක්සේරු ඒකකයක් (BMA) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 79

2.5.9 පෑලියගොඩ- පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම 80

2.5.10 රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල යන ප්‍රදේශවල ගුවන් පාලම් 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 81

පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය 82

2.6 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම 85

2.6.1 ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය 85

2.7 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 89

2.7.1 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය 89

2.7.2 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය 90

2.7.3 රන් මාවත් ග්‍රාමීය මාර්ග නඩත්තු හා ඉදිකිරීමේ වැඩසටහන (අයවැය යෝජනා – 2019) 90

2.8 මූල්‍ය ප්‍රගති සමාලෝචනය 93

2.8.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් 95

2.8.2 සංවර්ධන ක්‍රියාකාරකම් 96

2.8.3 දේශීය බැංකු ණය 108

II වන වෙළුම – ඉදිරි දැක්ම

2.9 අනාගතය සඳහා ඉදිරි දැක්ම 111

3 වන පරිච්ඡේදය – සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 113

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 115

3.4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 116

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 118

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 125

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 125

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 126

4 වන පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

හැඳින්වීම 127

4.1 කාර්යසාධන දර්ශක 127

5 වන පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු (SDGs) අත්පත් කරගැනීමේ කාර්යසාධනය 129

5.2 මාර්ග අංශයේ තිරසර සංවර්ධන අරමුණු අත්පත් කරගැනීම හා මුහුණ දුන් අභියෝග 130

6 වන පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 133

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම 133

6.3 මානව සම්පත් සංවර්ධනය 125

7 වන පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 137

ජායාරූප එකතුව I - VI

ඇමුණුම්

ඇමුණුම 01 2019 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රසම්පාදනයන් VII

ඇමුණුම 02 කෝකිලායි පාලමෙහි පිහිටීම දැක්වෙන සිතියම XII

ඇමුණුම 03 ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය XIII

ඇමුණුම 04 අධිවේගී මාර්ගයන්හි රථවාහන ධාරිතාවය හා ආදායම XIV

ඇමුණුම 05 පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර III XVI

ඇමුණුම 06 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය XVII

ඇමුණුම 07 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය XXI

ඇමුණුම 08 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය XXII

ඇමුණුම 09 ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග ව්‍යාපෘති XXIII

ඇමුණුම 10 බදුල්ල - වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය XXIV

ඇමුණුම 11 පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම XV

ඇමුණුම 12 විගණකාධිපති වාර්තාව XVI

වගු පටුන

වගුඅංක 1.7.1	මහාමාර්ග අංශයේ ආයෝජනය	13
වගුඅංක 2.1.2.1	යෝජිත ගුවන් පාලම්	18
වගුඅංක 2.2.1.1	අධිවේගී මාර්ගයෙහි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය	21
වගුඅංක 2.2.1.2	2019 වර්ෂයේ මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය	22
වගුඅංක 2.2.1.3	දක්ෂිණ අධිවේගි මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයන්හි ආදායම	23
වගුඅංක 2.2.1.4	2019 වර්ෂයේ මාසික අධිවේගී මාර්ග ආදායම	23
වගුඅංක 2.2.2.1	සිවිල් වැඩ සඳහා වූ භෞතික ප්‍රගතිය	24
වගුඅංක 2.2.3.1	නියමු මාර්ග ඉදිකිරීමෙහි ප්‍රගතිය	26
වගුඅංක 2.2.6.1	2019/12/31 දිනට ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්හි භෞතික ප්‍රගතිය	32
වගුඅංක 2.3.1.1	ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය	37
වගුඅංක 2.3.1.2	2019/12/31 වන විට ජාතික මාර්ග ජාලයෙහි “ඒ” හා “බී”ශ්‍රේණියේ මහාමාර්ගයන්හි පළාත්බද වර්ගීකරණය	37
වගුඅංක 2.3.1.3	මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය	37
වගුඅංක 2.3.1.4	2018 වර්ෂයේදී “බී” ශ්‍රේණියේ මහාමාර්ග ජාලය සඳහා අළුතින් එකතු කරන ලද මාර්ග	38
වගුඅංක 2.3.2.1	2019 වර්ෂයේදී සිදුකරන ලද මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය	38
වගුඅංක 2.3.3.1	ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්	40
වගුඅංක 2.3.5.1	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් පැකේජ	42
වගුඅංක 2.3.6.1	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග	44
වගුඅංක 2.3.7.1	උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය (අතිරේක ණය) යටතේ ප්‍රතිසංස්කරණිත මාර්ග	45
වගුඅංක 2.3.9.1	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සහ පාලම්	48
වගුඅංක 2.3.10.1	කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරාගන්නා ලද මාර්ග	49
වගුඅංක 2.3.11.1	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති 3 අදියර I හි මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් භාවිතා කරමින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග	50
වගුඅංක 2.3.11.2	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති 3 අදියර I හි මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් යොදා ගනිමින් 2019 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍යයැයි හඳුනාගත් මාර්ග	51

වගුඅංක 2.3.12.1	දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරනු ලබන මාර්ග	52
වගුඅංක 2.3.13.1	2019 වර්ෂයේ ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් මාර්ග	53
වගුඅංක 2.3.13.2	එක් එක් මාර්ග පැකේජයන්හි පළාත්බද භෞතික ප්‍රගතිය	53
වගුඅංක 2.3.13.3	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් ජාතික මාර්ග	54
වගුඅංක 2.3.14.1.	දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග	54
වගුඅංක 2.3.15.1	ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග කොටස්හි ප්‍රගතිය	56
වගුඅංක 2.3.17.1	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 අදියර II යටතේ 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද මාර්ග පැකේජයන්	58
වගුඅංක 2.3.17.2	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 අදියර II යටතේ 2019 වර්ෂයේදී ආරම්භ කරන ලද මාර්ග පැකේජයන්	58
වගුඅංක 2.3.19.1	බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ තෝරාගත් මාර්ග	59
වගුඅංක 2.3.20.1	මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද මාර්ග සහ පාලම්	61
වගුඅංක 2.3.21.1	2019/12/31 දිනට ප්‍රවාහන ව්‍යාපෘති පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය	62
වගුඅංක 2.4.1.1	2019 වර්ෂයේ මාර්ග හා පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය	68
වගුඅංක 2.4.1.2	2019 සහ 2018 වර්ෂයන්හි පළාත් වශයෙන් අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය	71
වගුඅංක 2.5.1.1	ජාතික මහාමාර්ගයන්හි හානියට පත් / අබලන් වූ පාලම් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සඳහා වාර්තා වූ භෞතික ප්‍රගතිය	73
වගුඅංක 2.5.3.1	ප්‍රාදේශීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරන ලද පාලම්හි භෞතික ප්‍රගතිය	75
වගුඅංක 2.5.4.1	ජාතික මහාමාර්ගයන්හි පාලම් 25ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ I වන පැකේජය යටතේ ඉදිකිරීමට තෝරාගත් පාලම්හි භෞතික ප්‍රගතිය	76
වගුඅංක 2.5.10.1	ඉදිකරන ලද ගුවන් පාලම් පිළිබඳ විස්තර	81
වගුඅංක 2.7.1.1	2019 සහ 2018 වර්ෂයන්හි ඉදිකරන ලද නිර්මිතයන්හි සංසන්දනය	89
වගුඅංක 2.8.1.1	මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය	95
වගුඅංක 2.8.2.1.	අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය	96
වගුඅංක 2.8.2.2.	අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියෙහි එක් එක් ව්‍යාපෘති මඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය	97
වගුඅංක 2.8.2.3	මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය	98

වගුඅංක 2.8.2.4	මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි එක් එක් ව්‍යාපෘති මඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය	99
වගුඅංක 2.8.2.5	මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය	102
වගුඅංක 2.8.2.6	මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය පළාත් වශයෙන්	102
වගුඅංක 2.8.2.7.	පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන සඳහා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය	103
වගුඅංක 2.8.2.8.	පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන සඳහා වූ මූල්‍ය ප්‍රගතිය	103
වගු අංක 2.8.2.9.	ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය	105
වගුඅංක 2.8.2.10.	ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහා වූ මූල්‍ය ප්‍රගතිය	106
වගුඅංක 2.8.2.11.	ආයතනික සහය වැඩසටහන සඳහා වූ මූල්‍ය ප්‍රගතිය	106
වගුඅංක 2.8.2.12.	ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය	107
වගු අංක 2.8.3.1	2019 වසර තුලදී දේශීය බැංකු ණය ආධාර උපයෝජනය	108
වගු අංක 2.8.3.2	දේශීය බැංකු දායකත්වය	109

රූපසටහන්

රූපසටහන 2.2.2.1	පිටත වටරවුම් අධිවේගී මාර්ගය III වන අදියරෙහි භෞතික ප්‍රගතිය	24
රූපසටහන 2.2.3.1	ව්‍යාපෘතිය ආරම්භකළ දින සිට සමස්ත භෞතික ප්‍රගතිය	26
රූපසටහන 2.2.3.2	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි සමස්ත ප්‍රගතිය	27
රූපසටහන 2.2.4.1	I වන අදියරේ සිවිල්වැඩ සඳහා වූ සමුච්ඡිත භෞතික ප්‍රගතිය	28
රූපසටහන 2.2.4.2	ව්‍යාපෘතියෙහි II වන අදියර ආරම්භකළ දින සිට මේ දක්වා වූ සමුච්ඡිත භෞතික ප්‍රගතිය	29
රූපසටහන 2.2.4.3	ව්‍යාපෘතියෙහි III වන අදියර ආරම්භ කළ දින සිට මේ දක්වා වූ සමුච්ඡිත භෞතික ප්‍රගතිය	29
රූපසටහන 2.2.4.4	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක පූර්ණය කිරීමේ ප්‍රගතිය	30
රූපසටහන 2.2.5	ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතියෙහි සාරාංශය	31
රූපසටහන 2.3.2.1	2019 වර්ෂයේ නඩත්තු කරන ලද මාර්ගයන්හි භෞතික ප්‍රගතිය	39
රූපසටහන 2.3.5.1	සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද මාර්ග පැකේජයන්හි සමුච්ඡිත භෞතික ප්‍රගතිය	42
රූපසටහන 2.3.5.2	සංවර්ධන සඳහා වූ ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද මාර්ග පැකේජයන්හි සමුච්ඡිත භෞතික ප්‍රගතිය	43
රූපසටහන 2.3.10.1	කොට්ටාව - තලගල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමෙහි සමස්ත ප්‍රගතිය	49
රූපසටහන 2.3.10.2	කෝට්ටේ - බෝපේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ සමස්ත ප්‍රගතිය	49
රූපසටහන 2.4.1.1	2018 වර්ෂයේදී නිමකරන ලද මාර්ග දුර ප්‍රමාණය	67
රූපසටහන 2.4.1.2	2019 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද මාර්ග දුර ප්‍රමාණය	67
රූපසටහන 2.5.1	ජාතික මහාමාර්ගයන්හි පිහිටා ඇති පාලම් පිළිබඳ සාරාංශය	73
රූපසටහන 2.5.7.1	2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සමඟසැසඳූ කළ කොන්ත්‍රාත් පැකේජ I හා IIහි භෞතික ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය	79
රූපසටහන 2.6.1.1	කොන්ත්‍රාත් ජැකේජ Iහි සිවිල් වැඩ සඳහා වූ භෞතික කාර්යසාධනය	86
රූපසටහන 2.6.1.2	කොන්ත්‍රාත් ජැකේජ IIහි සිවිල් වැඩ සඳහා වූ භෞතික කාර්යසාධනය	86
රූපසටහන 2.8.1	සමස්ත මූල්‍ය ප්‍රගතිය - මහාමාර්ග අංශය	93
රූපසටහන 2.8.2.	2019 සංශෝධිත අයවැය ප්‍රතිපාදනයෙහි සංයුතිය - මහාමාර්ග අංශය	94
රූපසටහන 2.8.3.1	දේශීය බැංකු ණය ආධාරයන්හි දායකත්වය	109

පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය වන මහාමාර්ග අංශයපසුගිය වසර පහලොවක කාලය තුළරටේ ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය උදෙසා කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. මෑත කාලීන වර්ෂයන් හා මෙන්ම 2019වර්ෂය තුළදී ද ජාතික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති රැසක් සාර්ථකව නිම කිරීමට අමාත්‍යාංශය සමත් වී ඇති අතර සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා බලපෑම් ඇති කළ හැකි නව ව්‍යාපෘති රාශියක් ආරම්භ කිරීමටද පියවර ගෙන ඇත.

මහාමාර්ග ජාලය රටක වඩාත් වටිනාම සහ වඩාත් සුවිශාල වූ සාමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික, සාමාජයීය, සංස්කෘතිකමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන් ද සමාජ සුභසාධනය උදෙසා ඉතා වැදගත් වූ අංගයක් ලෙස පිළිගෙන ඇත.ශ්‍රී ලංකාව වර්ග කි.මී. 65,610ක වපසරියකින් ද මිලියන 21කට ආසන්න වූ ජනගහණයකින් ද යුක්ත රටක් වන අතර වර්ග කි. මීටරයකට කි. මී. 1.76 ක මාර්ග ඝනත්වයකින් ද (මහ බැංකු වාර්ෂික වාර්තාව - 2019) සමන්විත වේ.මේ අනුව මාර්ග ඝනත්වයන් එකිනෙක සලකා බැලීමේදී බොහෝ දකුණු ආසියානු රටවල් අභිබවා යාමට වත්මන් ශ්‍රී ලංකාවට හැකි ව ඇත. ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය, ප්‍රමුඛතම ප්‍රවාහන ක්‍රමය බවට පත්ව ඇති අතර බොහෝ සාධක සැලකීමේ දී දුම්රිය ප්‍රවාහනයට වඩා තාක්ෂණික හා ආර්ථික වාසි රැසක් එමඟින් අත්පත් වන හෙයින් මගී ප්‍රවාහනයෙන් 94% ක් සහ භාණ්ඩ ප්‍රවාහනයෙන් 98% ක්ම මාර්ග ඔස්සේ සිදු කෙරේ. එහෙයින් මාර්ග ප්‍රවාහනය, දුම්රිය ප්‍රවාහනය අභිබවා මහජන උපයෝගීතාවයට ලක් ව ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග නඩත්තු භාර අරමුදල, මහනැගුම ඉදිකිරීම් සමාගම, මහනැගුම උපදේශන සේවා සමාගම, මහනැගුම ඉංජිනේරු සමාගම සහ අධිවේගී මාර්ග ප්‍රවාහන පෞද්ගලික සමාගම මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයයටතට ගැනෙන ප්‍රධාන ආයතන ලෙස හැඳින්විය හැකි අතරඒ අතරින් මාර්ග සංවර්ධන අධිකාරිය දිවයිනේ මහාමාර්ග හා සම්බන්ධ ප්‍රමුඛ බලධරයා ලෙස ජාතික මහාමාර්ග ජාලයේ නඩත්තුව සහ වැඩිදියුණු කිරීමෙහිලා වගකිව යුතු දායකත්වයක් සපයනු ලැබේ.

මාර්ග සංවර්ධන අධිකාරිය මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිතව පිහිටවූ ආයතනයක් වන අතර 1981 අංක 73 දරණ පනත් කෙටුම්පත අනුව අමාත්‍යාංශය යටතට පවරාගෙන ඇති අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අනුප්‍රාප්තිකයා බවට පත් විය.

ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය 2019 වසර අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී. 12, 438කින් යුත් වන අතර එය ඒ ශ්‍රේණියේ මහාමාර්ග දුර කි.මී. 4,215කින් ද බී ශ්‍රේණියේ මහාමාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 8,005කින් ද අධිවේගී මාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 217කින් ද පාලම් 4,662කින් ද සමන්විත වේ.

මේ අනුව මෙම වාර්තාවෙහිමාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි විස්තරාත්මක කාර්යසාධනය දක්වා ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරිය යටතේමෙන් ම ව්‍යාපෘති කළමනාකරණ ඒකක මඟින් ක්‍රියාත්මක කරන ලද ඒ ඒ ව්‍යාපෘතීන්හි කාර්යසාධනයන් ද සවිස්තරාත්මක ව දක්වා ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

"කාර්යක්ෂම, ආරක්ෂිත හා නව තාක්ෂණය මත පදනම් වූ මාර්ග ජාලයක් සතු මහාමාර්ග ක්ෂේත්‍රයේ අද්විතීය සේවා සපයන්නා වීම"

1.2.2. මෙහෙවර


විශේෂඥ දැනුම, අති නවීන තාක්ෂණය සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පුරවැසි අවශ්‍යතාවයන්ට සහ ජාතික සංවර්ධන අභිමතාර්ථයන්ට අනුකූලව මාර්ග ජාලය සංවර්ධනය කර, කළමණාකරණය කිරීම හා නඩත්තු කිරීම

1.2.3 අරමුණු

- ජාතික සංවර්ධන ඉලක්කයන් කෙරෙහි ළඟාවිය හැකි වන පරිදි මහාමාර්ග අංශය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම
- ප්‍රධාන නගර අතර ගමනාගමනය සැපයීම, ආර්ථික මධ්‍යස්ථාන අතර කාර්යක්ෂම සබඳතාවයන් ඇති කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශ වලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම
- තිරසාර සංවර්ධනයට දායක වන ආකාරයට මාර්ග ජාලය උසස් ප්‍රමිතියකින් යුතුව නඩත්තු කිරීම
- කාර්යක්ෂම රථවාහන කළමනාකරණය සඳහා සහ අධිවේගී මාර්ග සඳහා වන පරිගණකගත ප්‍රවාහන මෙහෙයුම් පද්ධතියක් පවත්වා ගෙන යාම
- උසස් මට්ටමේ සේවාවක් සැපයීම සහ පරිශීලක හිතකාමී මාර්ග ඉදිකිරීම සඳහා මහාමාර්ග අංශයේ මානව සම්පත් ධාරිතාවය වැඩිදියුණු කිරීම
- මාර්ග පද්ධතිය ප්‍රවර්ධනය සඳහා දායක වන පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍ර සඳහා ආයෝජනය කිරීම
- මාර්ග භාවිතා කරන්නන් සඳහා මාර්ග ආරක්ෂණ මිනුම් / මාන වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යභාර්යයන්

1. මාර්ග හා මහාමාර්ග සහ ග්‍රාමීය යටිතල පහසුකම් විෂයට සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි (මාර්ග සංවර්ධය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්, මාර්ග නඩත්තු භාරකාර අරමුදල) විෂයයන්ට සහ ජාතික මංමාවත් පනත (2008 අංක 40) මාර්ග සංවර්ධන අධිකාරි පනත (1981 අංක 73) සඳහන් නීති හා අණපනත් වලට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම. හා වෙනත් අමාත්‍යවරයෙකු යටතට නිශ්චිතව පවරා නොමැති උක්ත සඳහන් විෂයන්ට අදාල අනෙකුත් ව්‍යවස්ථාවන් පිළිබඳ කටයුතු සිදුකිරීම
2. *ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.*
3. අධිවේගී මාර්ග සංවර්ධනය, ගාස්තු නියම කිරීම, රැස්කිරීම හා නියාමනය කිරීම
4. පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
5. අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියලුම විෂයන්ට අදාල කටයුතු සිදු කිරීම


ලේකම්
අතිරේක ලේකම් පාලන (ශ්‍රී.ලං.ප.සේ-විශේෂ)
අතිරේක ලේකම් සංවර්ධන (ශ්‍රී.ලං.ප.සේ-විශේෂ)
අතිරේක ලේකම් ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ -විශේෂ)
ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ -විශේෂ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී.ලං.ග.සේ-විශේෂ)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ -I)
අධ්‍යක්ෂ (ව්‍යා.කළ. සහ ප්‍රසම) (ශ්‍රී.ලං.ප.සේ -I)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලංප.සේ-I)
අධ්‍යක්ෂ (මගනැගුම) (ශ්‍රී.ලං.ක්‍ර.සේ-I)
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ඉ.සේ -I)
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ-I)
ගණකාධිකාරී (ව්‍යාපෘති) (ශ්‍රී.ලං.ග.සේ-I)
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ-I)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ-I)
ප්‍රසම්පාදන විශේෂඥ
නීති නිලධාරී
සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප. සේ -III)
සහකාර ලේකම් (ව්‍යා.කළ. සහ ප්‍රසම) (ශ්‍රී.ලං.ප. සේ -III)
සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ - III)
සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර. සේ -III)
ඉංජිනේරු (මගනැගුම) (ශ්‍රී.ලං.ඉ.සේ. III)
සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ඉ.සේ -III)
සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ III)
ගණකාධිකාරී (03) (ගෙවීම්/ගිණුම්/මගනැගුම්) (ශ්‍රී.ලං.ග.සේ -III)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ප්‍රධාන කළමනාකරණ සහකාර
තො.තා.නිලධාරී
වැඩසටහන් සහකාර
සං.නිලධාරී
කළ.සහකාර
මා.සම්.සහකාර
ප්‍රසම්පාදන සහකාර
නිශ්චල ඡායා.ශිල්පි
වීඩියෝ කැමරාකරු
කා.කා.ස
දුරකතන ක්‍රියාකරු
රියදුරු
සං.නිලධාරී
කළ.සහකාර
කා.කා.ස
රියදුරු
වැඩ.සහකාර
තාක්.නිලධාරී
සං.නිලධාරී
සැල.සහකාර
කළ.සහකාර
මා.සම්.සහකාර
ප්‍රසම්.සහකාර
කා.කා.ස
රියදුරු
වැඩ.සහකාර
තාක්.නිලධාරී
සං.නිලධාරී
සැල.සහකාර
කළ.සහකාර
මා.සම්.සහකාර
ප්‍රසම්.සහකාර
කා.කා.ස
රියදුරු
සං.නිලධාරී
සැල.සහකාර
කළ.සහකාර
කා.කා.ස
රියදුරු
අයවැය සහකාර
මූල්‍ය සහකාර
සං.නිලධාරී
කළ.සහකාර
කා.කා.ස
රියදුරු
ප්‍රධාන කළමනාකරණ සහකාර
මූල්‍ය සහකාර
සං.නිලධාරී
කළ.සහකාර
කා.කා.ස
රියදුරු
සං.නිලධාරී
කළ.සහකාර
කා.කා.ස

1.5 මහාමාර්ග අමාත්‍යාංශය සඳහා ප්‍රවේශය

1.5.1 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශ

මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානත්වය අමාත්‍යාංශ ලේකම් සමග අමාත්‍යාංශයීය රාජ්‍ය ලේකම් විසින් දරනු ලබන අතර, අංශ ප්‍රධානීන් 06 කුගේ ද ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරී අංශ 8කින් සමන්විත වේ.



- **මාර්ග සහ මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය**

මාර්ග සහ මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය 2019.12.21 දිනැති අංක 2154/55 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ලබාදී ඇති අධිකාරී බලය යටතේ පිහිටුවා ඇති අතර එහි ප්‍රධානත්වය රාජ්‍ය ලේකම් විසින් දරනු ලැබේ.

1.5.1.1 පාලන අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ පාලන අංශයේ ප්‍රධානත්වය අතිරේක ලේකම් (පාලන) විසින් දරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සහකාර ලේකම් හා පරිපාලන නිළධාරි යන විධායක නිළධාරීන් අංශයේ ක්‍රියාකාරීත්වය සඳහා දායක වනු ලැබේ. තවද ව්‍යාපෘති කළමණාකරණ හා ප්‍රසම්පාදන අංශයද අතිරේක ලේකම් (පාලන) ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමණානකරණ හා ප්‍රසම්පාදන) සහ සහකාර ලේකම් (ව්‍යාපෘති කළමණාකරණ හා ප්‍රසම්පාදන) යන නිළධාරීන් අංශයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකිව යුතු වේ. මෙම අංශය අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරණ අතර අනෙකුත් සියළුම අංශයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන කාර්යාලීය පරිසරය නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ.

2019 වර්ෂය තුළ ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ ඇගයීම

- කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ස්ථාපනය කිරීම උදෙසා එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි ශක්‍යතා වර්ධනය කිරීමට සමස්ත කාර්ය මණ්ඩලයම සඳහා ම දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් ඉලක්ක කළ පරිදි ඉතා සාර්ථකව නිම කරන ලදී.
- තවද, තොරතුරු ලබාදීමේ පනත අනුව මහජනතාව සඳහා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් වර්ෂය තුල නිවැරදි හා කාලීන තොරතුරු ලබාදීම සිදු කරන ලද අතර අදාල කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව වගකීම දැරීම සඳහා තොරතුරු නිළධාරියෙකු නම් කර පත් කරන ලදී. තවද ලබාදෙන ලද තොරතුරු පිළිබඳ අභියාචනා ඉදිරිපත් වන අවස්ථාවන්හි දී මෙම තොරතුරු ලබාදීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳ ඇගැයීම් කටයුතු අතිරේක ලේකම් (පාලන) හරහා සිදු කරනු ලැබිණි.
- ජාතික සංවර්ධන අරමුණු කරා ළඟාවීමේදී අමාත්‍යාංශයීය විෂයානුබද්ධිත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව සහ නිවැරදිව සිදු කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීම සහ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා

එක් එක් අංශය වෙත පැවරුණු රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මහ පෙන්වීම ලබා දීම.

- අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සමඟ කාර්යක්ෂම සහ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් පවරන ද කාර්යයන් ප්‍රධාන විෂය ධාරාවන් වෙත යොමු වෙමින් නිරවද්‍යව සම්පූර්ණ කිරීමට ආයතන අංශයට හැකියාව ලැබී ඇත.
- මීට අමතරව, සේවක කාර්ය මණ්ඩලය සතු පරිසණක භාවිතය පිළිබඳ හැකියාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පරිසරය ගොඩ නැංවීම සඳහා පියවර ගැනීම.

1.5.1.2 ප්‍රසම්පාදන අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රසම්පාදන අංශය එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ මග පෙන්වීම මත පිහිටවනු ලැබීය. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාර්ග සංවර්ධන අධිකාරිය හා ඊට අයත් ව්‍යාපෘති මගින් කරනු ලබන අමාත්‍ය මණ්ඩල හා අමාත්‍යාංශ මට්ටමේ අනුමැතිය ඇතිව සිදුකළ යුතු වූ සියලුම ටෙන්ඩර් කටයුතු සඳහා පහසුකම් සපයන පාර්ශවය ලෙස ක්‍රියා කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දායකත්වය දැක්වීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශයට අයත් වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක මඟින් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර මෙම අංශය වෙත එවනු ලබන අතර මෙම අංශය මඟින් එම සියලුම දත්ත සම්බන්ධීකරණය කර සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කරනු ලබයි. එසේ පිළියෙල කරනු ලබන සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත මූලිකව ම යවනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී වෙනත් රේඛීය අමාත්‍යාංශ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ආදී ආයතන වෙත ද, යැවීමට මෙම අංශය මඟින් කටයුතු කරනු ලබයි.

මෙම අංශයේ මානව සම්පත් දායකත්වය ප්‍රසම්පාදන විශේෂඥ තනතුරු එකකින් ද, ප්‍රසම්පාදන සහකාර තනතුරු එකකින් ද, සංවර්ධන නිළධාරී තනතුරු තුනකින් ද, කළමණාකරණ සහකාර තනතුරු දෙකකින් ද, කාර්යාල කාර්යය සහයක තනතුරු එකකින් ද සමන්විත වේ.

2019 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද අමාත්‍ය මණ්ඩල මට්ටමේ සහ අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන විස්තර **ඇමුණුම 01** යටතේ දක්වා ඇත.

2019 වර්ෂය තුළ ප්‍රසම්පාදන අංශය මුහුණපා ඇති ගැටළු හා අභියෝග.

අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී පහත ගැටළු හා අභියෝගයන් හඳුනාගෙන ඇත.

- මූලික සැලසුම් පාදක කර ගත් ප්‍රමාණ බිල්පත් සකස් කිරීමේ දී ඒවායේ සඳහන් කරන ලද ඇස්තමේන්තු අගයයන්හි නිරවද්‍යතාවය පිළිබඳ සහතික වීමක් ඇගයීම් කමිටු ස්ථාපනයට පූර්වයෙන් ලබා ගැනීමට නොහැකි වීම.
- සැලසුම් සෑදීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, ඉඩම් අත්පත් කරගැනීම හා පාරිසරික අධ්‍යයන ආදී ප්‍රසම්පාදන පෙර සූදානම් වීමේ කටයුතු, ඇගයීම් කමිටු පත් කිරීමට ප්‍රථම අවසන් කළ යුතු වීම.
- ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතීන්හි විෂය පථය වෙනස් කිරීම හා සම්පූර්ණයෙන් ම නව අංගයන් ප්‍රසම්පාදන සැලැස්මට එකතු කිරීම.
- කාර්යය මණ්ඩලවල ප්‍රසම්පාදනය හා සම්බන්ධ දැනුම හිඟවීම. (මෙය ශක්‍යතා ගොඩනැගීමේ වැඩසටහන් මඟින් විසඳාලිය හැක.)
- ලංසු පත්‍රිකා අඩුපාඩු සහිතවීම / ප්‍රසම්පාදන පිරිවිතර හේතුවෙන් ප්‍රසම්පාදන කාලරාමුවට අදාල නොවන ලෙස ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රමාදවීම.

1.5.1.3 ගිණුම් අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය වෙත වාර්ෂික අයවැය මඟින් වෙන්කෙරෙන ප්‍රතිපාදන හැසිරවීම, මෙහෙයවීම හා පාලනය කිරීමේ වගකීම ගිණුම් අංශය වෙත පැවරී ඇත. මෙලෙස වෙන් කෙරුණු ප්‍රතිපාදන කළමණාකරණය කිරීමත්, මෙම ප්‍රතිපාදන කාර්යක්ෂම ව හා ඵලදායීව යෙදවීම තුලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ රජයට ලබාදීම සහතික කිරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක. අමාත්‍යාංශය යටතට ගැනෙන සියළු සංවර්ධන ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන අධිකාරිය, මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය කරමින් අයවැය අරමුදල් නොපමාව සහ බාධාවකින් තොරව උපයෝජනය සඳහා පහසුකම් සැපයීම මෙම අංශයට අයත් වන කාර්යයකි. මේ හැරුණු කොට උපයෝජිත අරමුදල් තුලින් මූල්‍යමය කාර්යසාධනයත් ඊට සමගාමීව සිදුකරණ ලද වැයබරත් නිරීක්ෂණය කොට අංශයේ මූල්‍යමය තත්වය වාර්තා කිරීමත් සිදුකරනු ලබයි.

1.5.1.4 සංවර්ධන අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ සංවර්ධන අංශය; ඉඩම් සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන ලෙස අංශ 02 හි එකතුවකි.

➢ **ඉඩම් අංශය**

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ ඉඩම් අංශය මහාමාර්ග අලුතින් ඉදිකිරීමේදී හා පුනරුත්ථාපනය කිරීමේදී අවශ්‍ය වන ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු හා ඒ සම්බන්ධ ක්‍රියාවලිය හා බැඳී සිටින ආයතන හා පුද්ගලයින් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම සහ ඒ හා අදාළ සියලු කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා වගකිවයුතු ප්‍රධාන අංශය ලෙස හැඳින්විය හැක.

2019 වර්ෂය තුළ අංශයේ ප්‍රධාන කාර්යභාරයන්

- නව මාර්ග ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන කටයුතු වලට අදාල ඉඩම් අත්කර ගැනීම සඳහා, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 2 වන වගන්තියට අනුව අත්පත් යෝජනා සහ 38(අ) අතුරු විධානය යටතේ කඩිනමින් භුක්තිය භාරගැනීමට අදාල ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- අත්පත් කරගත් ඉඩම් වලට අදාල ඉදිරි කටයුතු ඉඩම් අත්කරගැනීමේ පනතට අනුව සිදුකිරීම.

- අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

- ඉඩම් අත්පත් කරගැනීම් හා වන්දි ගෙවීමට අදාල කාර්යයන් ඉටුකිරීමේ දී ඉඩම් අමාත්‍යාංශය, මාර්ග ව්‍යාපෘති, තක්සේරු දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ මුද්‍රණාලය වැනි ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන උක්ත කාර්යයන් සිදුකිරීම.

- ඉඩම් අත්පත් කරගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ විශේෂ කමිටු පැවැත්වීම, කමිටු තීරණ සැකසීම හා කමිටු තීරණ දැනුම්දීම ඇතුළු කාර්යයන් ඉටුකිරීම.

- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පාර්ලිමේන්තු කාරක සභා ආදී ආයතන මඟින් විමසනු ලබන කරුණු සඳහා වාර්තා ඉදිරිපත් කිරීම.

- මහජන දුක් ගැනවිලි විසඳීමට සහය වීම.

- මාර්ග අලුතින් ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීමේ කටයුතු වලදී ඉඩම් අත්කරගැනීම නිසා අවතැන් වන පිරිස් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉඩම් මිලදී ගැනීමට, ඉඩම් මිලදී ගැනීමේ කමිටුව මඟින් කටයුතු කිරීම.

- ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කරගත් එහෙත් මාර්ග සංවර්ධන කටයුතු වලට අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා,ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට සහ 39 (අ) (1) වගන්තිය යටතේ අවසන් කිරීමට අදාලව ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ, ඉඩම් හා

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන කටයුතු වලට අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා, ඉඩම් අත්කරගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ අත්හැරීම සඳහා වන නිර්දේශ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

භෞතික ප්‍රගතිය

- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්පත් යෝජනා 92 ක් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ කඩිනමින් භුක්තිය භාර ගැනීම සඳහා ,ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ 73 ක් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ කමිටු 27 ක් පවත්වා ඇති අතර එම කමිටු වල දී ඉඩම් කැබලි 325 කට අදාලව සාකච්ජා කර තීරණ ලබා දී ඇත.

- ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (අ) (1) වගන්තිය යටතේ අවසතු කිරීමට අදාල ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ 13 ක් සහ 50 වන වගන්තිය යටතේ වන අත්හැරීම සඳහා වන නිර්දේශ 6 ක් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- මාර්ග සංවර්ධන කටයුතු නිසා අවතැන් වන පිරිස් ප්‍රතිස්ථානගත කිරීමට, නව ඉඩම් මිලදී ගැනීම සඳහා , ඉඩම් මිලදී ගැනීමේ කමිටු 04 ක් පවත්වා ඇත.

- ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවන ලද මහජන ගැටළු 33 ක් සඳහා පිළිතුරු ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවා ඇත.

- මහජනතාව විසින් සෘජුව ඉදිරිපත් කරනු ලබන ගැටළු 467 කට අදාලව පිළිතුරු ලබා දී ඇත.

➢ **(මගනැගුම) ග්‍රාමීය මාර්ග සංවර්ධන අංශය**

2004 වර්ෂයේ ආරම්භ වී මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන සමඟින් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන සේ විධිමත් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක වීම ආරම්භ විය.

වර්තමානයේ දී මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයේ එක් ඒකකයක් වන මෙම අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන), අධ්‍යක්ෂ (මගනැගුම), සහකාර අධ්‍යක්ෂ (මගනැගුම), ඉංජිනේරු, සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) යන මාණ්ඩලික නිලධාරීගෙන් හා උපාධිධාරී යෝජනා ක්‍රමවලින් බඳවා ගන්නා ලද සැලසුම් සහකාර, වැඩසටහන් සහකාර, සංවර්ධන නිලධාරී හා රාජ්‍ය කලමනාකරණ සහකාර, ලිපිකරු (මාර්ග සංවර්ධන අධිකාරිය), කාර්යාල කාර්ය සහායකයින් සහිතව කණ්ඩායමක් සේවය කරති.

2019 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදුන් අභියෝග හා ගැටළු

- මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක් මුදල් ලැබීම ප්‍රමාදවීම අවම භෞතික ප්‍රගතියක් ලැබීම කෙරෙහි බලපාන ලදී.

- ප්‍රවේශ පහසුකම් අවම වන ග්‍රාමීය ප්‍රදේශයන්හි පැවති අයහපත් කාලගුණික තත්වයන් නිසාද ප්‍රගතිය අවම විය.

- කෙටි කාලයක් තුල රු.මි.10,000 ක් වැනි විශාල මුදලක් ආයෝජනය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මානව සම්පත් හා තාක්ෂණික පහසුකම් නොමැතිවීම.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ නිසි ක්‍රමවේදයක් නොමැතිවීම.

- නිසි ව්‍යාපෘති අධීක්ෂණ ක්‍රමවේදයක් නොමැතිවීම.

1.5.1.5 අභ්‍යන්තර විගණන අංශය

මූල්‍ය රෙගුලාසි අංක 128 හි දැක්වෙන පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මූල්‍ය රෙගුලාසි අංක 133 දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ඊට අනුකූලව පිහිටුවන ලද්දකි.
වර්ෂය තුළ හඳුනා ගන්නා ලද අවදානම් ඇගයීම් මත අමාත්‍යාංශය හා අනුබද්ධිත ව්‍යාපෘති කාර්යාල තුළ පහත සඳහන් විගණන ක්ෂේත්‍රයන් යටතේ විගණනයන් සිදු කර ඇත.

i. කාර්ය සාධන විගණනය
ii. මූල්‍ය විගණනය
iii. ආයතනික විගණනය
iv. භෞතික ක්ෂේත්‍ර පරීක්ෂාව

අංශය විසින් සකස් කර ඇති විගණන සැලැස්මට අනුව ඉහත ක්ෂේත්‍රයන් යටතේ අඛණ්ඩ විගණනයන් හා ඊට අදාළ ස්වාධීන ඇගයීම් සිදු කර ඇති අතර, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම පිළිබඳව විගණනයට ලක්කර, අවශ්‍ය මග පෙන්වීම් සිදුකර ඇත.

විගණන සැලැස්මට පරිබාහිරව 2019 වර්ෂය තුළ ලේකම්තුමාගේ උපදෙස් පරිදි විශේෂ විමර්ශන ද සිදුකර, ඒ සම්බන්ධයෙන් විමර්ශන වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම අභ්‍යන්තර විගණන පරීක්ෂණ සහ විශේෂ විමර්ශන මගින් අමාත්‍යාංශයට සෘජුව බලපාන අභ්‍යන්තර පාලන ගැටළු පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබේ.

<u>ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය</u>

2019 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එක් එක් විගණන පරීක්ෂණයන් හා විශේෂ විමර්ශනයන් තුළින් එලදායී විගණන පැහැදිළි කිරීම්, නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීමටත්, ඒ තුළින් කාර්ය මණ්ඩල කළමනාකරණය, වත්කම් කළමනාකරණය, පරිපාලන සහ ගිණුම්කරණ දුර්වලතා, වාහන අවභාවිතයන්, ප්‍රසම්පාදන කටයුතු සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවල පවතින දුර්වලතා ඉවත්කර එහි ශක්තිමත් භාවය ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කිරීමෙන් දායකත්වය ලබාදීමටත් අභ්‍යන්තර විගණන අංශයට හැකියාව ලැබී තිබේ.

1.5.1.6 ඉංජිනේරු අංශය

ශ්‍රී ලංකාව තුල මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ සියළු වගකීම් මහාමාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් දරනුයේ එහි ඉංජිනේරු අංශයයි. අංශ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතිරේක ලේකම්තුමාගේ (ඉංජිනේරු) පූර්ණ අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

එසේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා ඊට අදාල තාක්ෂණික විගණනයන් සිදුකිරීම ද ඉංජිනේරු අංශය මඟින් සිදු කරනු ලබයි.

<u>ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය</u>

- අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් වර්ෂය තුල ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති මඟින් ඉදිකෙරුණු මාර්ග හා පාලම් ආදියෙහි ප්‍රගතිය හා තත්වය අධීක්ෂණය කරන ලද අතර අදාල කාර්යසාධන වාර්තා ද පරීක්ෂාවට ලක් කරන ලදී. එමෙන්ම, ඊට සමගාමීව ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු ද පවත්වන ලදී.

- 2019 වර්ෂය තුල මාර්ග මිල ගණන් ලේඛණය (HSR) පෙබරවාරි මාසය තුල නිකුත් කරන ලදී.

- 2019 වර්ෂය තුල මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද,මහාමාර්ග ඉදිකිරීම් වලට සම්බන්ධ මහජන පැමිණිලි, ස්ථානීය පරීක්ෂණයන්ද සිදු කරමින් විමර්ශනය කරන ලදී. ඒවාට අදාල ප්‍රතිකර්ම ක්‍රියාවන් ද ගන්නා ලදී.

- 2019 වර්ෂය තුල පහත සඳහන් මාර්ග ජාතික මහාමාර්ග ලෙස උත්ශ්රේණිගත කිරීම් සිදු කරන ලදී.

1. අන්දරවැව - හම්බන්තොට මාර්ගය
2. බරවකුඹුක - මත්තල මාර්ගය
3. පිටත වටරවුම් මාර්ගය

1.5.1.7 සැලසුම් හා මෙහෙයුම් අංශය

සැලසුම් හා මෙහෙයුම් අංශය මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැකසීම සහ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, එහෙයවීම සහ ඇගයීම හා සම්බන්ධිත අධීක්ෂණය හා සම්බන්ධීකරණය හා බැඳුණු ප්‍රධානතම වගකීම් දරණ්නා වූ අංශය වේ.

සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් 2019 වර්ෂය තුල ඉටු කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර,එම කාර්යයන්හි ප්‍රගතිය පහත පරදි දැක්වේ.

<u>ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය</u>

- 2019 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට 2018 දෙසැම්බර් මස 28 වැනි දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, 2019 වර්ෂයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2019 නොවැම්බර් මස 20 වැනි දින ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

- 2018 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කොට 2018 ජූනි මස 25 වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2019 වර්ෂය තුල අයවැය විවාදය නොපැවැත් වූ බැවින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් දන්වන ලද පරිදි ඒ සඳහා සකසනු ලබන අයවැය වාර්තාව සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනැඟුණි.

- 2019 වර්ෂයේදී ව්‍යාපෘති කළමණාකරන අංශ 23ක් නියෝජනය කරමින් ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 61 ක් සාර්ථක ලෙස පවත්වා ඇත.

- මීට අමතර වශයෙන් සැලසුම් හා මෙහෙයුම් අංශය විසින් වර්ෂය තුල මුදල් අමාත්‍යාංශය (එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා) ,විද්‍යා, තාක්ෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය(ශිල්පසේනා) හා ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය (ටෙක්නෝ ශ්‍රී ලංකා) මඟින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන 05 සංවිධානය කළ අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය වන මහපෙන්වීමද ලබා දෙන ලදී.

- රජයේ මූල්‍යාධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා විද්‍යාත්මකව විශ්ලේෂණය කොට එම ව්‍යාපෘති වාර්තාවලට අදාල සංකල්ප වාර්තා 14ක් අදාල අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- තවද, වර්ෂය තුල ව්‍යාපෘතීන්හි 2019 වර්ෂය සඳහා විශ්ලේණය කරන ලද මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුලත් කාර්තුමය, මාසික වාර්තා හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු විවිධ වාර්තා නිසි පරිදි සකස් කොට ඉදිරිපත් කරන ලදී. තවද ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රගති වාර්තාවන් තවදුරටත් ඇගයීමට ලක් කිරීමද, වර්ෂය තුල අංශය විසින් සැලසුම් කල සියළුම කාර්යයන් හා අරමුණු ද සාර්ථකව හා කාර්යක්ෂමව ඉටුකිරීමට වර්ෂාවසානය වන විට සමත් වී ඇත.

1.6 වෙනත් ව්‍යවස්ථාපිත ආයතන

1.6.1 මාර්ග සංවර්ධන අධිකාරිය

දැක්ම

"විශිෂ්ඨ මහාමාර්ග ජාලයක්

සැපයීම පිළිබඳ සමාජයේ

අපේක්ෂාවන් ඉටුකරන,


මහාමාර්ග ඉංජිනේරු

විද්‍යාවේ බහු විෂයික

විශිෂ්ඨත්වයෙන් යුත්, ප්‍රමුඛ

ජාතික ආයතනය ලෙස

ඇගයීමට ලක්වීම."



මෙහෙවර

"මාර්ග අංශයේ ප්‍රමුඛ

ජාතික ආයතනය ලෙස

මහජනතාව හා භාණ්ඩ

ප්‍රවාහනය සහ ජාතියේ

සාමාජීය ආර්ථික සංවර්ධනය

සඳහා මග පාදමින්, පිළිගත

හැකි මට්ටමක, ආරක්ෂාව හා

පහසුව සලසමින් පරිසර

හිතකාමී අයුරින්,

සංචලතාවය හා

ප්‍රවේශකත්වය සහතික කිරීම

සඳහා ප්‍රමාණවත් හා

කාර්යක්ෂම ජාතික

මහාමාර්ග ජාලයක් සැපයීම."

ශ්‍රී ලංකාවේ මහාමාර්ග ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතම ආයතනය ලෙස සැලකෙන මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය යටතට ගැනෙන ප්‍රධාන ආයතනය මාර්ග සංවර්ධන අධිකාරිය ලෙස හැඳින්විය හැකිය. 1981 අංක 73 දරණ පනත් කෙටුම්පත මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්කෙරුණු අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අනුප්‍රාප්තිකයා බවට පත්විය.

එතැන් සිට මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මාර්ග ජාලයට අයත් මහාමාර්ග සහ පාලම් නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සිදු කිරීමට බැඳී සිටී.

පවතින මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා අධිවේගී සහ ඒ හා බී ශ්‍රේණියේ මහාමාර්ග නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීමේ ද නව මාර්ග, පාලම් හා අධිවේගී මාර්ග සැලසුම්කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීමේ ද වගකීම මහාමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතුවේ.

1.7 මහාමාර්ග අංශයේ ආයෝජනය

ශ්‍රී ලංකා රජය විසින් නිරන්තරයෙන් රට තුල ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාම අපේක්ෂා කරනු ලබන අතර එහිදී සිය සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේදී ශක්තිමත් මාර්ග ජාලයක් පවත්වා ගෙන යාම ඉතා අත්‍යවශ්‍ය සාධකයක් වන බව හඳුනාගෙන ඇත.රට තුල ජීවත් වන ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම උදෙසා රජය විසින් නිරන්තරයෙන් ආයෝජනයන් සිදු කරනු ලබන අතර, ප්‍රවාහන අවශ්‍යතායන් වෙනුවෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලීම උදෙසා මහාමාර්ග අංශය සඳහා සමස්තයක් ලෙස ඉහළ ආයෝජනයක් සිදු කරනු ලැබේ.

මගී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම,මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මෙම අංශය සඳහා සිදු කරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය ඵලදායකමක් උත්පාදනය කරනු ලබන බව නිරීක්ෂණය වී ඇත. 2007 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මහාමාර්ග අංශය සඳහා සිදුකරන ලද ආයෝජනයන්හි උපයෝජනයන් පහත වගුවේ දැක්වේ.

වගු අංක 1.7.1 මහාමාර්ග අංශයේ ආයෝජනය (2007-2019)

වර්ෂය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු. බිලියන)	වියදම (රු. බිලියන)	සමුච්චිත වියදම (රු. බිලියන)
2007	44.8	37.6	37.6
2008	63.2	56.8	94.4
2009	88.9	76.1	170.5
2010	89.5	84.7	255.2
2011	121.1	100.9	356.1
2012	136.0	134.1	490.2
2013	133.3	131.1	621.3
2014	148.0	148.0	769.3
2015	196.8	178.0	947.35
2016	172.6	141.7	1,089.08
2017	206.3	192.0	1,281.11
2018	196.4	166.7	1,448.03
2019	256.6	156.8	1,604.58

මහාමාර්ග අංශයේ ආයෝජනය සම්බන්ධව 2007 වර්ෂයේ සිට නිරූපිත දත්ත නිරීක්ෂණය කිරීමේදී ඉහළම ආයෝජනය 2019 වර්ෂයේදී ද, අඩුම අගය 2007 වර්ෂයේදී ද පෙන්නුම් කර ඇත.


වගුවේ දක්වා ඇති කාලපරිච්ඡේදය තුල , රට තුල ගමනාගමන හා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණුකිරීමේ අරමුණින් ජාතික වශයෙන් ඉතා වැදගත් අධිවේගී මාර්ග, ජාතික මහාමාර්ග ඉදිකිරීම, ජාතික මාර්ගවල පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමට අවශ්‍ය පියවර ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේදී පෙන්වූ විචලනය හැර සෙසු සෑම වර්ෂයකදීම මෙම අංශය සඳහා වෙන් කෙරුණු අයෝජන ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරනු ඇත.

දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ගයන් හි ඉදිකිරීම් සාර්ථකව නිම කිරීම තුලින් නගරබදව ගොඩනැගෙන වාහන තදබදය අවම කිරීම මෙන්ම ග්‍රාමීය ජනතාවට සිය නිෂ්පාදන ආර්ථික මධ්‍යස්ථාන වෙත ගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීමද සිදු කරනු ලද අතර ඒ තුලින් ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාදේශීය සංවර්ධනය වැඩිදියුණු වීම තුලින් මෑතකාලීනව දළ දේශීය නිෂ්පාදිතය සඳහා පළාත්බදව දක්වනු ලබන දායකත්වය ඉහළ ගොස් ඇත.

2009 වර්ෂයේදී දෙමළ ඊලාම් ත්‍රස්ත්‍රවාදීන් විසින් ගෙන ගිය ත්‍රස්ත්‍රවාදය අවසන් කරමින් සිවිල් යුධමය තත්වය නිම කිරීමත් සමඟ, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සංවර්ධන කටයුතු වෙනුවෙන් වූ ආයොජනය සඳහා ඉල්ලුම වර්ධනය වූ අතර එහි සීඝ්‍ර වර්ධනයක් දක්නට විය.

මෙම පළාත්වල හානියට පත් මාර්ග යටිල පහසුකම් නැවත යථා තත්වයට පත් කිරීමට අවධානය යොමු වූ අතර එය ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට ද පත් විය. මෙම හේතුව ද මහාමාර්ග අංශය සඳහා වෙන් වූ ආයෝජනයේ වර්ධනය සඳහා බලපාන ලදී.මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය සඳහා වූ අංක 117 වූ අයවැය ශීර්ෂය යටතේ 2019 වර්ෂය සඳහා මූලික අයවැය ප්‍රතිපාදනය ලෙස රු.මි.185,280 ක් වෙන් කරන ලද අතර වර්ෂාවසානය වන විට

අතිරික්ත ප්‍රතිපාදන හේතුවෙන් එම අගය රු.මි.256,584 ක් දක්වා වර්ධනය විය. 2019 වර්ෂය සඳහා ආයෝජනය ඉහළ ගොස් තිබුණද, සංවර්ධන ව්‍යාපෘතීන්හි නිම කරන ලද වැඩ වලට අදාල බිල්පත් ගෙවීම් අවසාන ගිණුම් තුල වියදම් ලෙස ගිණුම් ගත නොවීම මත හා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විදේශාධාර ව්‍යපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම සම්බන්ධයෙන් සීමා පනවා තිබීම මත වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය 75% ඉක්මවා ගොස් නොතිබිණි.



1.7.1 විදේශාධාර ව්‍යාපෘතීන්හි සාරාංශය

අංකය	ව්‍යාපෘතිය	අරමුදල් සපයන ආයතනය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි)	ව්‍යාපෘති කාලසීමාව
අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන				
1	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 1	චීන ආනයන හා අපනයන බැංකුව	171,405	2016-2022
2	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 2	දේශීය බැංකු අරමුදල්	148,520	2017-2021
3	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3	මෙතෙක් නිශ්චය කර නොමැත	148,767	2018-2021
4	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 4	මෙතෙක් නිශ්චය කර නොමැත	165,383	මාස 42
5	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය – අදියර 1	චීන ආනයන හා අපනයන බැංකුව	113,589	2016-2020
6	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය – අදියර 2		55,200	
7	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය – අදියර 3		31,574	
8	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය – අදියර 4		52,156	
9	පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III	චීන ආනයන හා අපනයන බැංකුව	78,700	2016-2020
10	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	මෙතෙක් නිශ්චය කර නොමැත	286,000 (වෙනස් වියහැක)	මෙතෙක් නිශ්චය කර නොමැත
11	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය	ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, භාරදීම පදනම යටතේ ක්‍රියාත්මක කෙරේ.	134,506 (මෙතෙක් නිශ්චය කර නොමැත)	මෙතෙක් නිශ්චය කර නොමැත
12	කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	55,915	2019-2025
මහාමාර්ග සංවර්ධන වැඩසටහන				
13	බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර III (ඉඩම් අත්පත් කරගැනීම පමණි)	දේශීය බැංකු අරමුදල්	3,500	
14	පේරාදෙණිය - බදුල්ල - වෙන්කලාඩි මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඕපෙක් අරමුදල	21,000	2017-2021
15	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල (SFD)	9,055	2018-2020
16	උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය (අතිරේක ණය)	ආසියානු සංවර්ධන බැංකුව	12,026	2019-2020

අංකය	ව්‍යාපෘතිය	අරමුදල් සපයන ආයතනය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි)	ව්‍යාපෘති කාලසීමාව
17	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල	6,625	2017-2020
18	කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය (ඔපෙක් II)	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල	13,526	2017-2021
19	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 3 අදියර I	චීන සංවර්ධන බැංකුව	52,500	2014-2020
20	බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල	6,046	2017-2020
21	දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	13,400	2014-2021
22	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	ආසියානු සංවර්ධන බැංකුව	120,000	2015-2024
23	දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	ආසියානු සංවර්ධන බැංකුව	135,000	2017-2027
24	උඟව හා මධ්‍යම පළාත් වල පිහිටා ඇති පාලම් හා මහාමාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය	චීන අපනයන ආනයන බැංකුව - හුනාන් ශාඛාව	14,000	2018-2020
25	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 3 අදියර II	චීන සංවර්ධන බැංකුව	20,000	2016-2020
26	ප්‍රවාහන ව්‍යාපෘති පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	1,697	2017-2023
27	ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය	ලෝක බැංකුව	2,610	2018-2023
පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම				
28	ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II	බ්‍රිතාන්‍ය එච්.එස්.බී.සී.බැංකුව	12,042	2013-2020
29	පාලම් 25ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය	අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල	5,070	2015- 2021
30	පාලම් 46ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රංශ ආධාර)	ප්‍රංශ රජයේ අරමුදල් (NATIXIS බැංකුව)	7,721	2015-2019
31	ජාතික මහාමාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය	14,900	2013-2021
32	නව කැලණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය	ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය	55,313	2014-2020
හදිසි ආපදා උපකාරක වැඩසටහන				
33	ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ වියසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය	ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය	16,201	2012-2020

පරිච්ඡේදය 2

ප්‍රගතිය හා ඉදිරිදැක්ම

වෙළුම I

විදේශආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

2.1 නව ප්‍රවේශයන්

නව ප්‍රවේශයන් යටතේ පහත සඳහන් ව්‍යාපෘති ත්‍රිත්වය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගෙන ඇත.

2.1.1 මහනුවර හා එම නගරාසන්නප්‍රදේශවල මධ්‍යමඅධිවේගී මාර්ගය හා සබන්ධිත මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහනුවර දිස්ත්‍රික්කය කඳුකර ප්‍රදේශයක පිහිටා ඇති අතර බොහෝ කඳු වලින් වටවී තිබෙන බැවින් අවශ්‍ය කරන අධිවේගී මාර්ග නිවැරදි ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීමට හා නඩත්තු කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර එය මූල්‍යමය වශයෙන් අහිතකර තත්ත්වයක් පෙන්නුම් කරයි. එබැවින් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලද පුළුල් අධ්‍යයනයකින් අනතුරුව කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගයේ (ඒ 10) ගලගෙදර දක්වා අධිවේගී මාර්ගයක් ලෙස ඉදිකිරීමට සහ මහනුවර නගරය හා ප්‍රධාන වශයෙන් සම්බන්ධිත මාර්ග නිවැරදි ප්‍රමිතීන්ට අනුව ඉදිකිරීමටත් පවත්නා ප්‍රධාන මාර්ග කිහිපයක් දියුණු කිරීමටත් තීරණය කර ඇති අතර එමඟින් මහනුවර නගරය අධිවේගී මාර්ග ජාලය හා සම්බන්ධ කිරීමට අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් මාර්ග 06 වැඩිදියුණු කිරීම සඳහා තෝරා ගෙන ඇත.

1 වන පැකේජය

- **කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය කටුගස්තොට සිට ගලගෙදර දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (0+30 – 13+500) (මංතීරු 04)**

2 වන පැකේජය

- **ඒ009 මාර්ගය සහ ඒ 010 මාර්ගය කටුගස්තොට නගරය හා සම්බන්ධ කරමින් කටුගස්තොට නගරයේ අතුරු මාර්ගයක් ඉදිකිරීම (මංතීරු 04කින් යුත් නව මාර්ගය)**
- **අලදෙනිය -ඊරියගම මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම. (බී 005)**

3 වන පැකේජය

- **බරිගම - හල්ඔළුව මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (බී 537) (0+000 - 5+750)**
- **අරඹකඩේ - බොක්කාවල - අඹතැන්න මාර්ගයේ (බී 015) අරඹකඩේ - බොක්කාවල - පූජාපිටිය දක්වා වූ කොටස පුළුල් කර වැඩිදියුණු කිරීම**
- **අලවතුගොඩ - පූජාපිටිය මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (බී 377)**

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වසරේ අයවැය ප්‍රතිපාදන වෙන් වී නොතිබුණ ද2018 වර්ෂය තුලදී මූලික අදියරවලට අයත් වූ ක්‍රියාකාරකම්සඳහා කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා කැබිනට් අනුමැතිය සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමි වී ඇත.

2.1.2කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් 02ක් ඉදිකිරීම

සමස්ත මාර්ග ජාලයේ ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රමෝපායික වැදගත්කමකින් යුත් මංමාවත්වල අන්තර් කොටස් හා ඒවායේ විවිධ මට්ටම් වැඩිදියුණු කිරීම අවශ්‍යතාවයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය, හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහත සඳහන් කළ වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ.ඒ අනුව, කොහුවල සහ ගැටඹේ යන ස්ථාන වල හංගේරියානු ආධාර යටතේ නව ගුවන් පාලම් ඉදිකිරීමටකටයුතු කරමින් පවති.

කොළඹ - හොරණ මාර්ගයේ (බී 84) කොහුවල මංසන්ධියේ කොහුවල ගුවන් පාලම ඉදිකිරීමට යොජනා කර ඇති අතර එම මාර්ගය කොළඹ නගරය සඳහා අවතීර්ණ වීමට හැකි ප්‍රධාන මාර්ග අතුරින් එකක් ලෙස හැඳින්විය හැකිය. තව ද බී 84 මාර්ගය අධික ජනගහනයකින් යුත් අර්ධ නාගරිකප්‍රදේශයක් වන එම ප්‍රදේශ කොළඹ නගරය හා සම්බන්ධමෙකී මංසන්ධිය පිළිබඳව සලකා බැලීමේදී කොළඹ - හොරණ මාර්ගයේ (බී84) කොහුවල මංසන්ධිය හරහා අධික රථවාහන තදබදයක් ඇතිවනඅතර ප්‍රධාන වශයෙන් ඇතුල්කෝට්ටේ - මිරිහාන - කොහුවල මාර්ගය (බී120) හා කොහුවල - දෙහිවල මාර්ගය (බී229) යන මාර්ග හරහා පැමිණෙන රථවාහන හා බී 229 මාර්ගය ඔස්සේ බී84 මාර්ගය දෙසට රථවාහන හැරවීමේදී මේ තත්ත්වය උද්ගත වේ. උක්ත තත්ත්වය හේතුවෙන් මෙම ස්ථානයේ ගුවන් පාලමක් ස්ථාපනය කිරීම මඟින් බී84 මාර්ගය ඔස්සේ සෘජුවම පවතින රථවාහන තදබදය නිසා උද්ගත වන ගැටලු බොහෝ දුරට විසඳා ගැනීමට හැකිවන අතර බී84 මාර්ගය ඔස්සේ රථවාහන ප්‍රවාහය අවහිරයකින් තොරව ගමන් කිරීම සඳහා අවකාශ සැලසෙනු ඇත.

මහනුවරට ප්‍රවේශ වීමට හැකි ප්‍රධාන මාර්ගයන් 02ක් ලෙස විලියම් ගොපල්ලව මාවත (ඒබී42) සහ ඒ1 මාර්ගයේ අන්තර් කොටසක් වන ගැටඹේ මංසන්දිය හැඳින්විය හැක. ඒබී042 විලියම් ගොපල්ලව මාවතේ දැනට පවතින හරස් මාර්ගයගැටඹේ සිටමීටර් 120 ක් දුරින් පිහිටා ඇත. යෝජිත ගුවන් පාලම මහනුවර දක්වා දිවෙන ඒ1 මාර්ගය ඔස්සේ ඒබී42 මාර්ගය හරහා ඉදිකරනු ලබයි. මීට අමතරව යෝජිත ගුවන් පාලම ඒබී42 මාර්ගයේ ඇති හරස් මාර්ගය හරහා ඉදිකිරීම තුළින් අතුරු මාර්ගය ඔස්සේ මහනුවර නගරය සිට පැමිනෙනරථවාහන සඳහා දුම්රිය ධාවනය හේතුවෙන් මාර්ගයේ ඇතිවන රථවාහන තදබදයකින් තොරව ගමනාගමනය සඳහා ඉඩ සැලසෙනු ඇත.

ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන හංගේරියානු සහන මූල්‍යකරණ යෝජනා ක්‍රමය යටතේ මේ සඳහා පූර්ණ මූල්‍යමය දායකත්වය සපයන අතර ඒ සඳහා වන මූල්‍යමය එකඟතා රාමුව සඳහා 2017 දෙසැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකා රජය සහ හංගේරියානු රජය විසින් අත්සන් කරන ලදී.

හංගේරියානු රජය මෙම මූල්‍යාධාර සපයනු ලබන්නේ චීන අපනයන හා ආනයන බැංකුව මඟින් ලබා දෙන ණය ආධාරයක් ලෙසිනි. ඒ අනුව, 2019 ජූනි මාසයේදී M/s Betonupitepito PLC සමාගම සමඟ අදාල කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කල අතර ඊට අදාල ණය ගිවිසුම 2019 වර්ෂයේ ඔක්තොම්බර් මාසයේදී අත්සන් කරන ලදී.

වගුඅංක2.1.2.1 - යෝජිත ගුවන් පාලම් 03

ගුවන් පාලමේ නම	ගුවන් පාලමේ දුර	බැඹුමේ දුර	ආරුක්කු ඩෙ සැකැස්ම	ගුවන් පාලමේ විස්තර
කොකුඹල	මීටර් 229	මීටර් 97.6	ආරුක්කු 3- මීටර් 132	මීටර් 9.4
ගැටඹේ	ප්‍රධාන ගුවන් පාලම - මීටර් 396.7 ඒ01 දක්වා වන ශාඛාව - මීටර් 432.4	ප්‍රධාන ගුවන් පාලම මීටර් 116.7 ශාඛාව මීටර් 147.4	ප්‍රධාන ගුවන් පාලම ආරුක්කු 8, ශාඛාව ආරුක්කු 8	මංතීරු 3ක් සහිත කොටස මීටර් 13.4 මංතීරු 2ක් සහිත කොටස මීටර් 9.4 තනි මංතීරුවක් සහිත ශාඛාව මීටර් 5.4

2.1.3කෝකිලායි පාලම ඉදිකිරීම

නැගෙනහිර පළාත හා උතුරු පළාත අතර වෙරළබඩ තීරයේ අඛණ්ඩ සම්බන්ධතාවයක් ඇතිකිරීම සඳහා මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ කෝකිලායි කලපුව හරහා මීටර් 1050ක දිගින් යුතුසංයුක්ත පාලමක් ඉදිකිරීම යෝග්‍ය බවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර ජාතික මහාමාර්ග ජාලයේ,පුල්මුඩේ ඉක්මවා වෙරළ තීරය ඔස්සේ අඛණ්ඩ සම්බන්ධතාවයක් මේ වන විට නොමැති බව ද නිරීක්ෂණය වී ඇත.

මෙම ගැටළුවට විසඳුමක් ලෙස චීනයේ අපනයන හා ආනයන බැංකුවේ මූල්‍යාධාර මත උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ මුලතිව් - කෝකිලායි මාර්ගය (බී297) කි.මී 42.4 ක දුරක් පුල්මුඩේ දක්වා දීර්ඝ කර වැඩිදියුණු කරනලද අතරමෙම මාර්ගය උතුරු පළාත සමඟ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සම්බන්ධ කරන ලබන ප්‍රධාන මාර්ගයකි.

මෙය පවතින රථවාහන තදබදය මහඟැර නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල සිට උතුරු සීමාවේ මුලතිව්, කිලිනොච්චි හා යාපනය යන දිස්ත්‍රික්ක වලට ලහාවිය හැකි කෙටිම මාර්ගය ද වේ. මෙම මාර්ගය නායරු කලපුව සහ කෝකිලායි කලපුව ලෙස නම්කරන ලද ප්‍රධාන සමුද්‍රීය හරස් මාර්ග 02කින් සමන්විත වේ. එසේවුවද ඉහත සඳහන් කළ මාර්ග ව්‍යාපෘතිය මඟින් නායරු කලපුව හරහා පාලමක් ඉදිකරනු ලැබුවද ව්‍යාපෘතියේ පැවති මූල්‍යමය සීමාවන් නිසා කෝකිලායි කලපුව හරහා පාලමක් ඉදිකිරීම එම ව්‍යාපෘතිය යටතට නොගැණිනි.

මෝසම් කාලයේදී කෝකිලායි කලපුවේ මීටර් 1025ක පමණ දියකපොල්ලක් නිර්මාණය වන අතර වියළි කාලයේදී එය මීටර් 800ක් දක්වා අඩුවේ. මෙම මාර්ගයේ රථවාහන තදබදය වැඩී වී ඇති අතර වර්තමානය වනවිට එය පළාත් හා ප්‍රාදේශීය සභා මාර්ගයන් ඔස්සේ කි.මී. 25ට වඩා වැඩි ප්‍රමාණයක් දක්වා වර්ධනය වී ඇත. මෙම අතුරු මාර්ග බොහෝමයක් බොරළු අතුරන ලද මාර්ග හෙයින් ඉතා අඩලන් තත්ත්වයේ පවතින අතර වැසි සහිත කාලයන්හීදී ගමනාගමනය සඳහා වඩාත් අපහසු වේ.

තවද, පුල්මුඩේ සිට කෝකිලායි දක්වා වූ මුහුදු තීරය ටොන් මිලියන 04ක් පමණ වූ ඛනිජ වැලි නිධියකින් සමන්විතය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම මූලාශ්‍ර ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකිවනු ඇත. කෝකිලායි කුරුළු උද්‍යානය ද පිහිටා ඇත්තේ කෝකිලායි කලපුව ආසන්නයේය. එමනිසා, කෝකිලායි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් සංචාරක කර්මාන්තය සංවර්ධනය මෙන්ම එම ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය සඳහා ද දැවැන්ත රුකුලක් වනු නියතය.

මේ අනුව මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ උපරිම ප්‍රයෝජනය ලබාගැනීම සඳහා කෝකිලායි කලපුව හරහා පාලමක් ඉදිකිරීම ඉතා වැදගත්වේ.

එසේම,මාර්ග සංවර්ධන අධිකාරිය මඟින්2013 හා 2014 වසරවලදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇති නමුත් ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුවීම හේතුවෙන් එය 2014 දී අත්හිටවූවද 2018 වර්ෂයේදී එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලීමට යොමු කරන ලදී.

වෙකොස්ලෝවෙන්ස්කානු ජනරජයේ Bilfinger MCE Slanys.r.o. විසින් ව්‍යාපෘති සම්පාදකයෙකු ලෙස භාරකාර පදනම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සිය කැමැත්තෙන්ම ව්‍යාපෘති යෝජනාවක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා වෙකොස්ලෝවෙන්ස්කාවේසී.එස්.ඕ.බී. බැංකුව (CSOB) මඟින්යුරෝ මිලියන 48.8කකොන්ත්‍රාත්වටිනාකමක්ලබාදීඇතිඅතරඉ න්යුරෝමිලියන 41.5 ක් සී.එස්.ඕ.බී බැංකුව (CSOB) මඟින් සපයන අතර ඉතිරි යුරෝ මිලියන 7.3හැටන්නැෂනල්බැංකුව (HNB) විසින් ලබා දෙනු ඇත.

මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම 2019 ජූනි මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරිය සහවෙකොස්ලෝවෙන්ස්කානු Bilfinger MCE Slanys.r.o. අතර අත්සන් තැබූවද විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඊට අදාල ණය ගිවිසුමෙහි සංශෝධන කිහිපයක් සිදු කිරීමට උපදෙස් ලබා දීම හේතුවෙන් එම යෝජිත වෙනස්කම් සිදු කර සංශෝධනය කරන ලද ණය ගිවිසුම බැංකුව විසින් නැවත භාර දෙන ලදී.

කෝකිලායි පාලමේ පිහිටීම දැක්වෙන සිතියම ***ඇමුණුම 02*** හි දක්වා ඇත.

2.2 අධිවේගී මාර්ග සංවර්ධනය

ඕනෑම රටක පුද්ගල ජීවන තත්වය වැඩිදියුණු කිරීමට සහ වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කරලීමට කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය පූර්ව අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. පවතින මාර්ග ජාලය ඉතා පුළුල් වුවද බොහෝ ජාතික හා පළාත් මාර්ග ඉදිකර ඇත්තේ දැනට අවුරුදු 50 කටත් බොහෝ කලකට පෙර වන අතර එමඟින් පහසුකම් සලසා ඇත්තේ එකී කාලයේ පැවති රථවාහන ධාරිතාවය සහ වාහනවල වර්ගයන් සහ අදාල වේග සීමාවන්ට අනුවය.

එමනිසා දිවයිනේ සියලුම ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කරමින් එහා මෙහා යා හැකි උසස් තත්වයකින් යුත් මාර්ග ජාලයක අවශ්‍යතාවය මේ වන විට හඳුනාගෙන ඇති නිසා ජාතික මාර්ග ජාලය වර්ධනය උදෙසා සියලුම ආර්ථික මධ්‍යස්ථාන ආවරණය වන පරිදි කි.මී. 800 කින් යුත් අධිවේගී මාර්ග ජාලයක් ඇති කිරීමට සැලසුම් කර ඇත.

වර්තමානයේදී, උසස් තත්ත්වයෙන් යුත් අධිවේගී මාර්ග ජාලයක් නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් අධිවේගී මාර්ගයන් පහත පරිදි වේ. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය විදහා දැක්වෙන සිතියම **ඇමුණුම 03** හි දක්වා ඇත.

2.2.1 අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරියේ, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය සතු වගකීම වන්නේ මෙහෙයුම් කටයුතු, නඩත්තු කිරීම් කටයුතු සහ කළමනාකරණය යන කාර්යයන් ඉටුකිරීම මඟින් අධිවේගී මාර්ගයන්හි කටයුතු බාධා රහිතව පවත්වාගෙන යාමයි.

මෙම අංශයේ ප්‍රධාන වගකීම් ලෙස අයවැය කරණය සහ විගණනය කිරීම ද ඇතුළත්ව රථවාහන ගමනාගමන කටයුතුවල මූලික සැලසුම් කිරීම්, කළමනාකරණය කිරීම් සහ මෙහෙයවීම, ගාස්තු අයකිරීමේ කාර්යයන් සහ අධිවේගී මාර්ගයන්හි අදාල නඩත්තු කටයුතු සිදු කිරීම ද දැක්විය හැකිය.

රථවාහන ගමනාගමන තත්ත්වය

දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ රථවාහන ගමනාගමන ධාරිතාවය පිළිබඳ විස්තර වගු අංක 2.2.1.1 හි දක්වා ඇත.

උක්ත අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවයන්හි සංසන්දනාත්මක නිරූපණයක් ***ඇමුණුම 4(අ)*** මඟින් ප්‍රස්ථාරිකව නිරූපණය කර දක්වා ඇත.

වගු අංක 2.2.1.1 - අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය

වර්ෂය	දක්ෂිණ අධිවේගී මාර්ගයසහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය
2011	**8,531**	**-**
2012	**9,458**	**-**
2013	**11,737**	**15,194**
2014	**19,095**	**18,401**
2015	**27,736**	**20,782**
2016	**44,384**	**23,974**
2017	**52,977**	**25,844**
2018	**60,524**	**27,971**
2019	**65,246**	**27,640**

වගු අංක 2.2.1.1 හි ඇති දත්ත මඟින් දැක්වෙන පරිදි 2019 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගයසහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය 2018 වර්ෂය සමඟ සැසඳූ විට 8%කින් වර්ධනය වී ඇත.උක්ත අධිවේගී මාර්ගයන්හි මඟී භාවිතය සංඛ්‍යාත්මකව ඉහළ යාම මීට බලපෑ ප්‍රධාන හේතුවයි.

එනමුදු උක්ත අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය 2017 වර්ෂය සමඟ සැසඳූ විට 2018 වර්ෂයේදී 14%කින් වර්ධනය වී ඇත. එම නිසා සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය 2018 වර්ෂය සමඟ සැසඳීමේ දී සුළු වර්ධනයක් පෙන් වූව ද වර්ධිත වූ ප්‍රමාණය ප්‍රතිශතාත්මකව සලකා බැලීමේ දී 2019 දී අඩු අගයක් පෙන්නුම් කර ඇත.

උක්ත අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය පහත පරිදි දැක්විය හැක.

වගු අංක 2.2.1.2 2019 වර්ෂයේ මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය

මාසය	රථවාහන ගමනාගමන ධාරිතාවය	
	දක්ෂිණ අධිවේගී මාර්ගයසහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය
ජනවාරි	1,968,851	938,744
පෙබරවාරි	1,829,626	818,175
මාර්තු	2,065,081	902,457
අප්‍රේල්	1,881,299	721,590
මැයි	1,825,645	669,836
ජූනි	1,859,452	743,355
ජූලි	1,944,818	833,049
අගෝස්තු	2,142,340	890,506
සැප්තැම්බර්	1,948,019	851,603
ඔක්තෝබර්	1,958,877	869,221
නොවැම්බර්	1,939,430	846,093
දෙසැම්බර්	2,451,272	1,003,973
එකතුව	23,814,710	10,088,602

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී ආසන්න වශයෙන් 8% වර්ධනයක් පෙන්නුම් කර ඇත. නමුත් 2019 වර්ෂයේදී අදාල වර්ධනය වීමේ ප්‍රවණතාවය 1%කින් පමණ පසුබෑමකට ලක්වී ඇත.

මීට ආසන්නතම හේතුව ලෙස සඳහන් කළ හැක්කේ පිටත වටරවුම් අධිවේගී මාර්ගය - අදියර - III මහජනතාව වෙත විවෘත කිරීමත් සමඟ සිදුවූ මාර්ග භාවිතයේ වෙනස්වීම සහ 2019 අප්‍රේල් මාසයේදී සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් පසු මගීන් මෙම අධිවේගී මාර්ග භාවිතා කිරීම අඩු මට්ටමක පැවතීමයි.

2019වර්ෂයේදී උක්ත අධිවේගී මාර්ගයන්හි උපරිම රථවාහන ගමනාගමන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ දෙසැම්බර් මාසයේදී වන අතර අවම අගය වාර්තා වී ඇත්තේ මැයි මාසයේදීය.

2018 වර්ෂයේදී ද රථවාහන ගමනාගමනයේ උපරිම අගය වාර්තා වී ඇත්තේ 2019වසරේ වාර්තා වූ ලෙසින්මය. ඒ අනුවමෙය සෑම වසරකදීම සමාන රටාවකට සිදුවන්නක් බව නිරීක්ෂණය වන කරුණකි. එසේ වූවද රථවාහන ගමනාගමනයේ අවමඅගය 2019 වර්ෂයේ දී හැර අන් සෑම වර්ෂයක දීම පෙබරවාරි මාසයේදී වාර්තා වී ඇත.

2019 වර්ෂයේ දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ගමනාගමන ධාරිතාවයන්හි සන්සන්දනාත්මක විස්තරයක් ***ඇමුණුම 04 (අ)*** මඟින් දක්වා ඇත.

ආදායම් තත්ත්වය

දක්ෂිණ අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ ආදායම 2017 වසර සමඟ සැසඳූ විට 2018 වර්ෂයේදී 13%ක වර්ධනයක් පෙන්නුම් කළ ද 2019 වර්ෂයේදී, මෙම ආදායමෙහි ප්‍රතිශතාත්මක වර්ධන අගය වූයේ 5% කි.

ඉහත සඳහන් කරන ලද අධිවේගී මාර්ගයන්හි ආදායම 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වාර්තාගත ලෙස ඉහළ යාමක් පෙන්නුම් කළ අතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ පළමු අදියර 2011 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ජනතා අයිතියට පත්වීම මීට ආසන්නතම හේතුව ලෙස දැක්විය හැකිය.

2012 වර්ෂය ආරම්භයේ සිට දෙසැම්බර් දක්වා උපයන ලද ආදායම දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතයෙන් පමණක් වූ අතර කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ ප්‍රථම අදියර දෙසැම්බර් මස මගී ජනතාව සඳහා විවෘත වීමත් සමඟ එහි භාවිතයෙන් එක්වන ආදායම ද ඊට එක්විය.

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාර්ෂික ආදායම 2017 වර්ෂය හා සැසඳුකළ 2018 වර්ෂයේදී 8% ක වර්ධනයක් පෙන්වා ඇති නමුත් 2019 වර්ෂයේදී 2018 වර්ෂයට සාපේක්ෂව එම අගය 5% ක් දක්වා පසුබෑමකට

ලක්ව ඇත. මේ අනුව, පෙර ඡේදයන්හි සඳහන් කර තිබූ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි රථවාහන ගමනාගමන ධාරිතාවය පසුබෑමට ලක්වීමට හේතු වූ සාධකයන්ම එහි ආදායම පසුබෑමට ලක්වීම සඳහා ද බලපා ඇති බව පෙනී යයි.

වගුඅංක 2.2.1.3 – දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ආදායම

වර්ෂය	දක්ෂිණ අධිවේගී මාර්ගයසහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි)	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි)
2011	83.19	-
2012	1,017.02	-
2013	1,256.65	282.16
2014	2,141.35	1,887.73
2015	3,128.89	2,163.27
2016	4,550.89	2,496.81
2017	5,214.20	2,606.75
2018	5,893.92	2,821.78
2019	**6,192.18**	**2,744.82**

තව ද කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම 2014 වර්ෂයේදී වාර්තා ගත ලෙස ඉහළ යාමක් පෙන්නුම් කලේ එය 2013 ඔක්තොම්බර් මාසයේදී ජනතා අයිතියට පත්වීම හේතුවෙනි.

උක්ත අධිවේගී මාර්ගයෙහි ආදායම් ඉපැයීම පිළිබඳ සංසන්දනාත්මක විස්තරයක් ***ඇමුණුම 04 (ඇ)*** මඟින් දක්වා ඇත.

ඉහත සඳහන් කළ අධිවේගී මාර්ගයන්හි ගමන් කරන ලද වාහන වලින් උපයන ලද ආදායම පිළිබඳ සලකා බැලීමේදී දක්ෂිණ අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සඳහා 2019වර්ෂයේදෙසැම්බර්මාසයේදීවැඩිමආදායම ක්වාර්තාවීඇතිඅතරඅඩුමආදායමවාර්තා වී ඇත්තේ මැයි මාසයේදීය. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය භාවිතා කිරීම මඟින් ද වැඩිමආදායමක්වාර්තාවී ඇත්තේ දෙසැම්බර්මාසයේදී වන අතර අඩුම අගයක් වාර්තා වී ඇත්තේ ද මැයි මාසයේදීය.

2019 වර්ෂය සඳහා උක්ත අධිවේගී මාර්ගයන්හි වාර්තාගත ආදායම **ඇමුණුම අංක 04 (ඇ)** මඟින් තවදුරටත් දක්වා ඇත.

වගු අංක 2.2.1.4 2019 වර්ෂයේ මාසික අධිවේගී මාර්ග ආදායම

මාසය	දක්ෂිණ අධිවේගී මාර්ගයසහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි)	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි)
ජනවාරි	520.09	258.65
පෙබරවාරි	490.32	226.65
මාර්තු	550.50	249.90
අප්‍රේල්	508.21	198.88
මැයි	466.06	182.10
ජූනි	470.94	202.05
ජූලි	499.06	227.58
අගෝස්තු	566.15	244.17
සැප්තැම්බර්	499.93	233.27
ඔක්තෝබර්	497.21	237.86
නොවැම්බර්	487.96	221.91
දෙසැම්බර්	635.75	261.79
එකතුව	**6,192.18**	**2,744.82**

2.2.2 පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය

කොළඹ නගරයට ප්‍රවේශවීම සඳහා නිර්මිත පිටත වටරවුම් මහාමාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මහාමාර්ගයන් (ඒ1,ඒ3,ඒ4) හා සම්බන්ධ වන නව අධිවේගී මාර්ගයකි. කි.මී 29.1ක දිගකින් යුත් මෙම අධිවේගී මාර්ගය පැ.කි.මී. 80 -100 ත් අතර වේග සීමාවන් සඳහා සැලසුම් කර ඇත. මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පහත දැක්වෙන පරිදි අදියරයන් 03කට වෙන් කර ඇත.

- I වන අදියර - කොට්ටාව සිට කඩුවෙල දක්වා කොටස (කි .මී.11)
- II වන අදියර - කඩුවෙල සිට කඩවත දක්වා කොටස (කි.මී. 8.9)
- III වන අදියර - කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස (කි.මී. 9.3)


මෙමව්‍යාපෘතියෙහි පළමු හා දෙවන අදියරෙහි වැඩකටයුතු සම්පූර්ණයෙන්ම නිමාවට පත්කර පිළිවෙලින් 2014 සහ 2015 වර්ෂයන්හීදී මහජනතාව වෙත විවෘත කරඇත.

උක්ත පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෙවන අදියරෙහි සියලු ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂය වනවිට නිමාවට පත් වුවද බිල්පත් ගෙවීම් කටයුතුනිමාවට පත් වූයේ2018 වර්ෂයේදී ය.

III වන අදියර -කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස (කි.මී. 9.63)

පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ III වන අදියර වන කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු 2016ජනවාරිමාසයේදීආරම්භකළඅතර ව්‍යාපෘතියේ මූලික ඉදිකිරීම්කාලසීමාවමාස 42කි. මෙමඅදියරෙහිසම්පූර්ණදිග ප්‍රමාණය කි.මී. 9.63 කි. මෙම ව්‍යාපෘතිය චීන ආනයන හා අපනයන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන අතර මුළු ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 494.03කි.

මෙම අදියරෙහි ඉදිකිරීම් ආරම්භ කළ දින සිට වූ භෞතික ප්‍රගතිය පහත පරිදි සාරාංශකොට දැක්විය හැක.



රූපසටහන 2.2.2.1 පිටත වටරවුම් මාර්ගය අදියර III හි භෞතික ප්‍රගතිය

වගු අංක 2.2.2.1 සිවිල් වැඩ සඳහා වූ භෞතික ප්‍රගතිය

වර්ෂය	භෞතික ඉලක්ක (%)	සැබෑ ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීම %
2015	15	10	67
2016	12	1	8
2017	34	32	94
2018	50	41	82
2019	16	11	95

මෙම අදියරෙහි සිවිල් වැඩ 2019 වර්ෂයේදී නිමකිරීමට සැලසුම් කර තිබුන ද අත්පත් කරගත් භෞතික ප්‍රගතිය 95% කි. 2019 නොවැම්බර් මස 09 වන දින මෙම අධිවේගී මාර්ග කොටස ජනතා අයිතියට පත්කරන ලද අතර ඉතිරිව තිබූ 5% ක භෞතික වැඩ ප්‍රමාණය 2020 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂිතය.ඒ අනුවමධ්‍යම අධිවේගී මාර්ගය අදියර I හි මීටර් 500 ක මාර්ග කොටසෙහි ඉදිරි වැඩ, අධිවේගී මාර්ගය දෙපස ඇති මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කලාපයන්හි වැඩකටයුතු සහ විද්‍යුත් ගාස්තු ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු 2020 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

තවද මෙම ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා තෝරාගත් ස්ථානයන්හි අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම ඇතුළුව නැවත පදිංචි කිරීමේ සියලුම කටයුතු 2018 වර්ෂය අවසානයේදී සම්පූර්ණයෙන්ම නිමාවට පත්විය.2019 දෙසැම්බර් 31 වනවිට ව්‍යාපෘතිය අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘති විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත අයවැය	වියදම (රු.මි)
117-02-03-10	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	650.0	650.0	389.6
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	14,795.0	31,019.7	15,007.9
	එකතුව	**15,445.0**	**31,669.7**	**15,397.5**

2019 වර්ෂයේ සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව මෙම ව්‍යාපෘතිය අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 48% ක් වන නමුත් මූලික සැලසුමට අනුව ව්‍යාපෘතිය 100%ක ප්‍රගතියක් ලභා කරගෙන ඇත.

කෙසේවුවත් ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ අගයක් ගත්ත ද වාර්තා වූ වියදම අවම අගයක් පෙන්නුම් කළේ භාණ්ඩාගාරය විසින් අතුරු ගෙවීම් සහතික (අයි.පී.සී) අනුමත කිරීම ප්‍රමාදවීම හේතුවෙනි. 2019 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ත අතුරු ගෙවීම් සහතිකප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් මිලියන 15,504 කි.

එසේම, සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය 76% ක් ලෙස දැක්විය හැකිය. ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මූලික අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය වසරේ මුල්භාගය වනවිට සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගන්නා ලදී. එහෙයින්, ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී ද තවත් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 3 පිහිටීම දැක්වෙන සිතියමක් ***ඇමුණුම 05***හි දක්වා ඇත.

2.2.3 මධ්‍යමඅධිවේගී මාර්ග ව්‍යාපෘතිය

නව යෝජිතමධ්‍යමඅධිවේගී මාර්ගය මීට ඉහත යෝජනා වී තිබූ කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ හා උතුරු අධිවේගී මාර්ගයේ විෂය පථයන් ඒකාබද්ධ කර නව අධිවේගී මාර්ගයක් ලෙස හඳුන්වා දෙන ලද අතර මෙම නව සැලැස්ම මධ්‍යමඅධිවේගී මාර්ගය ලෙස නම් කරන ලදී.

යෝජිත මධ්‍යමඅධිවේගී මාර්ගයේ ඉදකිරීම් කටයුතු කොන්ත්‍රාත් පැකේජ 04ක් යටතේ සිදු කිරීමට තීරණය කර ඇති අතර ඊට අදාල තොරතුරු පහත දක්වා ඇත.

ඉදිකිරීමට නියමිත සම්පූර්ණ මාර්ග කොටසෙහි ආර්ථික ශක්‍යතා අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර ඇති අතර එය මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ලදී. එසේම, මේ සඳහා වන පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා අනුමැතිය ලබා දී ඇත.

පැකේජ අංක 1: කඩවත සිට මීරිගම දක්වා කොටස

මංතීරු හතරකින් යුත් මෙම කොටසේ සම්පූර්ණ දිග ප්‍රමාණයකි.මී. 37.09 ක් වන අතර එය කඩවත, ගම්පහ, වේයන්ගොඩ සහ මීරිගම-දකුණ යන ස්ථානවල පිහිටි අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 04කින් ද සමන්විත වේ. මෙම අදියර කොන්ත්‍රාත් පැකේජ 02ක් යටතේ සිදු කෙරේ.

I. කොන්ත්‍රාත් පැකේජ 1 - කඩවත සිට කොස්සින්න දක්වා කොටස ඉදිකිරීම
II. කොන්ත්‍රාත් පැකේජ 2 - කොස්සින්න සිට මීරිගම දක්වා කොටස ඉදිකිරීම

කොන්ත්‍රාත් පැකේජ 1සඳහා වනකොන්ත්‍රාත් ගිවිසුම 2016 ජූලි මාසයේ ද, කොන්ත්‍රාත් පැකේජ 2 සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම 2015 අගෝස්තු මාසයේදී ද චීනයේ එම්සීසී (MCC) සමාගම සමඟ අත්සන් කරන ලදී.

2018 වර්ෂයේ අවසානය වනවිට මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය 86% ක් වන අතර ඉන් 6% ක් 2018 වර්ෂය තුලදී අත්පත් කරගන්නා ලදී. මේ අනුව 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා අත්කරගත් භෞතික කාර්යසාධනය30% කි.

එසේවුවද, මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිමා කිරීමට සැලසුම් කර තිබුන ද, එය සිදු කරගැනීමට නොහැකි වූයේ වන්දි ගෙවීමේ ප්‍රමාදය සහ මහජන විරෝධතාවයන් වැනි විවිධ ගැටළු හේතුවෙනි.

එසේම, ඇතැම් අදියරවල ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවී ඇත්තේ ඒවායෙහි වංගු සහිත මාර්ග කොටස් පැ.කි.මී. 110 ක වේගසීමාවකට උචිත වන පරිදි පුළුල් කිරීමේ නිර්මාණ කටයුතු අවසන් අදියරේ පැවති බැවිනි. 2019 වර්ෂයේදී මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සම්පූර්ණයෙන් නිමාකිරීමට සැලසුම් කර තිබුන ද අත්පත් කරගැනීමට හැකිවූයේ 88% කට ආසන්න අගයක් පමණි. එබැවින් සංශෝධිත ක්‍රියාකාරී

සැලැස්මට අනුව සාධනය කරගත් භෞතික ඉලක්කය 14% කි. ඊට බලපෑ ප්‍රධාන හේතුව වූයේ මෙම ක්‍රියාවලිය සඳහා ලබාදුන් අක්මුදල් ප්‍රමාණය අවම වීමයි

මෙම අදියරෙහි සිවිල්වැඩ 2016 සැප්තැම්බර් වනවිට ආරම්භ කෙරුණු අතර 2019වසර අවසන් වනවිට 5.21% ක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. මෙම අදියරෙහි ණය ගිවිසුම අදාල වර්ෂය තුලදී අත්සන් නොකිරීම හේතුවෙන් අත්කරගත් සමුච්ඡිත භෞතික ප්‍රගතිය 5%ක් පමණ වේ. 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අදියර 11%ක සමස්ත ඉලක්කයක් අත්පත් කරගෙන ඇති අතර 2018 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 16%ක් ලෙසිනි.

මේ සඳහා බලපෑ ප්‍රධානතම කරුණ වූයේ මෙම අදියරට අදාල ණය ගිවිසුම 2019 මාර්තු මාසයේදී අත්සන් කෙරුවද කොන්ත්‍රාත්කරු විසින් බැංකු ඇපකරය තැන්පත් කිරීමට ප්‍රමාද වූ හෙයින් එය වසර අවසානය දක්වා ක්‍රියාත්මක නොවීමයි. කෙසේවෙතත් තාවකාලික පාලම් ඉදිකිරීම ඇතුළුව නියමු මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 50% දක්වා නිම කර ඇත.2019 වසර අවසන් වන විට නියමු මාර්ගයේ කි.මී. 14.676ක ඉදිකිරීම් කටයුතු නිමා කර තිබූ අතර එම ඉදිකිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වගු අංක 2.2.3.1 - නියමු මාර්ගය ඉදිකිරීමෙහි ප්‍රගතිය


ස්ථානය	දුර පරතරය		දුර (මී)
	සිට	දක්වා	
කළුවල	5+600	7+100	1,500
ගම්පහ	9+400	10+740	1,340
ගම්පහ	11+030	11+333	303
ගම්පහ	11+377	13+680	2,303
බෙම්මුල්ල	15+520	16+550	1,030
මගලේගොඩ	17+690	18+400	710
මගලේගොඩ	18+530	18+880	350
මගලේගොඩ	19+600	19+750	150
වඳුරුව	22+950	25+200	2,250
ගනේගොඩ	29+400	32+070	2,670
ඉදිපරපේ	32+210	34+280	2,070
සම්පූර්ණ කරන ලද දුර			14,676

පැකේජ අංක2: මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස

මංතීරු 04කින් යුත් මෙම අධිවේගී මාර්ග කොටස දළ වශයෙන් කි.මී. 39.7 ක දිගකින් යුක්ත වන අතර මීරිගම-උතුර, නාකලගමුව, පොතුහැර (භූවමාරු පද්ධතිය), දම්බොක්ක සහ කුරුණෑගල යන ස්ථානවල පිහිටා ඇති අන්තර්භූවමාරු 05කින් ද සමන්විත වේ. ශ්‍රී ලංකා රජය විසින් දේශීය බැංකු හරහා ණය මුදලක් මෙම අදියර සඳහා වෙන් කර ඇත.

2018 වර්ෂය අවසන් වනවිට මෙම අදියර ඉඩම් අත්පත් කරගැනීම සඳහා අත්කරගත් සමස්තප්‍රගතිය 87%කි. 2018 සංශෝධිත ක්‍රියාකාරීසැලැස්මට අනුව මෙම අධිවේගී මාර්ග කොටසෙහි ඉඩම් අත්පත් කරගැනීම සඳහා ආසන්න වශයෙන් 60% ඉලක්කයක් පූර්ණය කරගෙන ඇත.

ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා 2019 වර්ෂය අවසන් වන විට මෙම අදියර 90% භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ සඳහා ලභාකරගත් ඉලක්කගත ප්‍රගතිය වාර්තා වූයේ 33% ක් ලෙසිනි. මේ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ ඉඩම් අත්පත් කරගැනීම සමබන්ධයෙන් වන අංක 38 ගැසට්නිවේදනය පළකිරීමේ ප්‍රමාදය සහ ඇතැම් ඉඩම් කැබලි ප්‍රමාණයන්හි තක්සේරු කිරීම් වලදී ඇති වූ ප්‍රමාදයයි.



රූපසටහන 2.2.3.1 - ආරම්භයේ සිට සමස්ත භෞතික ප්‍රගතිය


2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අදියරෙහි සිවිල්වැඩ ක්‍රියාකාරකම් සඳහා වන ඉලක්ක සාධනය 76% ක් වන අතර වර්ෂය තුලදී අත්කරගත් ප්‍රගතිය 32% කි.

රූපසටහන 2.2.3.1 හි දක්වා ඇති පරිදි මධ්‍යම අධිවේගී මාර්ගය දෙවන අදියර 2017 වර්ෂයට වඩා වේගවත් හා ඵලදායී කාර්යසාධනයක් කරා 2018 දී ළඟා වී ඇති අතර ඒ හා සමාන කාර්යසාධනයක් 2019 වර්ෂයේදී ද පෙන්නුම් කර ඇත.

තවද, 2018 වසර තුළදී ව්‍යාපෘතිය සඳහා කිසිදු මූල්‍යමය බාධාවක් ඇති නොවී ප්‍රමාණවත් පරිදි මූල්‍යමය සහයෝගය ලැබුනේනම් වඩාත් හොඳ කාර්යසාධනයක් අත්පත් කරගැනීමට හැකියාව සැලසෙනු ඇති අතර 2019 අගෝස්තු වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට ද අවකාශය ලැබීමට තිබුණි.

පැකේජ අංක 3: පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස

මංතීරු 04කින් සහ පොතුහැර, පොල්ගහවෙල, රඹුක්කන හා ගලගෙදර පිහිටි අන්තර්හුවමාරු 04කින් ද සමන්විත මේ කොටසේ මුළු දුර ප්‍රමාණය කි.මී. 32.5කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා වූ මුළු කාලසීමාව අවුරුදු 03කි.මෙම අදියරේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 94% ක ප්‍රගතියක් සහිතව මේ වනවිට සිදුකරමින් පවති.



රූපසටහන 2.2.3.2 ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි සමස්ත ප්‍රගතිය

2018 වාර්ෂිකක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉඩම් අත්පත් කරගැනීමේ භෞතික ඉලක්ක පූර්ණය කිරීමේ සමස්ත ප්‍රගතිය 43%කි. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා අපේක්ෂා කරනු ලැබූ ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වූයේ මූල්‍යමය බාධාවන් ඇතිවීම වැනි විවිධාකාරයේ ගැටළු පැනනැඟීම හේතුවෙනි. එසේ වුවද පෙර වර්ෂයන්ට වඩා වැඩි වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වර්ෂයේදී භෞතික ඉලක්ක පූර්ණය කිරීමේ ප්‍රගතිය 63%ක් දක්වා වර්ධනය වී ඇත.

මෙම අදියරෙහි සිවිල් වැඩ මෙතෙක් ආරම්භකර නොමැති අතර මූල්‍යාධාර සපයාගැනීම ද මෙතෙක් නිශ්චිත වී නැත. එසේ වුවද මෙහි ඉදිකිරීම් සඳහා වන අවබෝධතා ගිවිසුමජපානයේ M/S Thaisei Corporation සමාගම සමඟ අත්සන් කරන ලදී.

මෙහි ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන කොන්ත්‍රාත්තුව සඳහා ජපානයේ M/s Katahira & Engineers International ආයතනය තෝරා ගෙන තිබුන ද අදාල කොන්ත්‍රාත්තුව මෙතෙක් පිරිනමා නොමැත. මෙම කොන්ත්‍රාත් ද්විත්වයම 2020 මාර්තු මාසයේදී පිරිනැමීමට සැලසුම් කර ඇත.මෙම අදියරෙහි නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ විස්තරාත්මක ජලවිද්‍යා අධ්‍යනය මේ වනවිට සම්පූර්ණ කර ඇත.

පැකේජ අංක 04: කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටස

මංතීරු 04කින් යුත් මෙම අධිවේගී මාර්ග කොටසෙහි මුළු දුර කි.මී. 60.3 ක් වන අතර රිදීගම, මැල්සිරිපුර, ගලේවෙල, දඹුල්ල (ඒ009) හා දඹුල්ල (ඒ006) යන ස්ථානවල අන්තර් හුවමාරු පද්ධති 05ක් ඉදිකිරීමටද යෝජිතව ඇත.

මධ්‍යමඅධිවේගී මාර්ගයේ සිව්වන අදියරෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA)සඳහා අනුමැතිය ලැබී ඇත.මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය 16%ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි එහි ඉලක්කගත අගය ලෙස සඳහන් කර ඇත්තේ 40%කි. 2018 දෙසැම්බර් 31 වනදින වනවිට

මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ සමුච්චිත භෞතික ප්‍රගතිය 64%කි.

2019 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියසඳහා මෙම අදියර44% ක ඉලක්කයක් සපුරාගෙන ඇති අතර ඉලක්ක කර තිබූ අගය 20%කි. එමනිසා 2019 සිව්වන කාර්තුව අවසානයේදී එම ක්‍රියාවලිය සඳහා 75% ක සමුච්ඡිත භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන ඇත.2018 වසර අවසානයේදී මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අත්කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය 97% ක් වූ අතර 2019 වර්ෂාවසානයේදී එම අගය වාර්තා වූයේ 86% ක් ලෙසිනි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	ව්‍යාපෘති විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)
117-02-03-7	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	3,000.00	2,850.00	2,480.0
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	10,180.0	476.0	394.19
	එකතුව	**13,180.0**	**3,326.0**	**2,874.19**

මධ්‍යමඅධිවේගී මාර්ගයේ පිහිටීම විදහා දැක්වෙන සිතියම **ඇමුණුම 06** හි දක්වා ඇත.

2.2.4 දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම, දකුණු පළාතේ මාර්ග ජාලය පුළුල් කිරීමේ එක් ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ හම්බන්තොට වරාය හා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර සමඟ සම්බන්ධ කිරීමයි.

2015 ජූලි මස 04 වන දින චීන ආනයන හා අපනයන බැංකු අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ අතර එහි සමස්ත ණය මුදල රුපියල් බිලියන 171.52ක් පමණ වේ.


මෙම අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කි.මී. 96ක් වන අතර ගොඩගම - නාගොඩ, අපරැක්ක, බෙලිඅත්ත, කසාගල, අඟුණුකොළපැලැස්ස, බරවාකුඹුක, සූරියවැව, මත්තල, හම්බන්තොට සහ අන්දරවැව යන ස්ථානවල පිහිටි අන්තර්හුවමාරු මධ්‍යස්ථාන 10කින් ද සමන්විත වේ. උක්ත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පහත පරිදි කොටස් 04ක් යටතේ සිදුකෙරෙමින් පවති.

අදියර 1 : මාතර සිට බෙලිඅත්ත දක්වා කොටස (කි.මී 0.0 - කි.මී 30.0)

කි.මී. 30 ක දුර ප්‍රමාණයකින් යුත් දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර 2020 දී නිමකිරීමට අපේක්ෂිතය. ඒ අනුවව්‍යාපෘතියේ කාලසීමාව මාස 42කි.

මෙම අදියරසඳහා 2018වර්ෂයේදීවාර්තා වූ සමස්ත මූලික භෞතික ප්‍රගතිය 82% ක් වුවද සංශෝධිත ප්‍රමාණ පත්‍රයක් (BOQ) ඉදිරිපත් වීම හේතුවෙන් එම අගය 86% ක් දක්වා වෙනස්විය.


2019වර්ෂය අවසානයේදී මෙම අදියරෙහි සිවිල්වැඩ 99% ක් දක්වා සම්පූර්ණ කර තිබූ අතර 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මටඅනුව ඉලක්ක සපුරාගැනීම 94%ක් විය. එසේම 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව එම අගය 70% කි.



රූපසටහන 2.2.4.1 - අදියර I හි සිවිල් වැඩ සඳහා වූ සමුච්ඡිත භෞතික ප්‍රගතිය

අදියර 2 : බෙලිඅත්ත සිට වැටිය දක්වා කොටස (කි.මී 30.0 - කි.මී 56.0)

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ දෙවන අදියර බෙලිඅත්ත සිට වැටිය දක්වා කි.මී. 26ක දුර ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඉදිකිරීම් කටයුතු 2016 ඔක්තොම්බර් මාසයේදී ආරම්භ කෙරිණි. 2019 වර්ෂය අවසානයේදී මෙම අදියර 89% ක සමස්ත භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබූ අතර මෙහි සියලුම ඉදිකිරීම් කටයුතු 2020 අප්‍රේල් මාසයේදී නිම කිරීමට අපේක්ෂිතය.



රූප සටහන 2.2.4.2 - ආරම්භයේ සිට ව්‍යාපෘතිය අත් කරගත් සමුච්ඡිත භෞතික ප්‍රගතිය

මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය 2018 වර්ෂය අවසන් වනවිට 99% ප්‍රගතියක් සහිතව සිදු කෙරුණු අතර 2019වර්ෂයේදී එම කටයුතු සම්පූර්ණයෙන් නිමාවට පත්ව ඇත.

අදියර 3 : වැටිය සිට අන්දරවැව දක්වා කොටස (කි.මී 56.0 - කි.මී 71.0)

කි.මී 15කින් යුතු මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර 2020වර්ෂයේ දී නිමකිරීමට අපේක්ෂිතවේ.

2017 වසරේ අවසානය වනවිට මෙම අදියර අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය 45% ක් වන අතර 2018 වර්ෂය තුළදී මෙම අදියර 44% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඒ අනුව,2018 දෙසැම්බර් මාසය අවසන් වනවිට ව්‍යාපෘතිය අත්පත් කරගත් සමස්ත භෞතික ප්‍රගතිය 89%කි. 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව සිවිල් වැඩ සඳහා 51% ක ඉලක්කයක් සඳහන්ව තිබූ අතර 2018 වර්ෂය සඳහා වන ඉලක්ක පූර්ණය 86%කි.

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා වූ ඉලක්ක පූර්ණය කිරීම 100% ක් ලෙස දක්වා තිබූ අතර 2019 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතියෙහි සියලුම සිවිල් වැඩ ක්‍රියාකාරකම් 99% ක් දක්වා සම්පූර්ණ කර තිබිණි.



රූප සටහන 2.2.4.3 - ආරම්භයේ සිට ව්‍යාපෘතිය අත්කරගත් සමුච්ඡිත භෞතික ප්‍රගතිය


අදියර 4: අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා කොටස (කි.මී 71.0 - කි.මී 96.0)

කි.මී. 25ක දුරකින් යුතු මෙම අදියරේ ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේ ආරම්භ කර 2019 ජනවාරි වනවිට නිමකිරීමට අපේක්ෂා කරන ලදී. නමුත්, අදාල කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිමා කිරීමට නොහැකිවූයෙන් ව්‍යාපෘති කාලසීමාව 2020 දක්වා දීර්ඝ කිරීමට සිදුවිය.

2019 වසර අවසන් වූ විට ව්‍යාපෘතිය අත්කරගෙන තිබූ සමස්ත භෞතික ප්‍රගතිය 98.5% ක් වූ අතර වසර තුලදී 12.5%ක ප්‍රමාණයක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

ඒ අනුව, 2018 වර්ෂයේදී ව්‍යාපෘතිය සත්‍ය වශයෙන්ම අත්කරගත් භෞතික ප්‍රගතිය 24% ක් වන අතර වාර්තා වී ඇති සමුච්ඡිත ප්‍රගතිය 86%කි.

එබැවින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම වසර දෙකෙහි ඉලක්ක පූර්ණය කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් 83%ක් හා 89%ක් ලෙස සඳහන් කළ හැක.



රූපසටහන 2.2.4.4 - සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක පූර්ණය කිරීම

ඊට අමතරව පහත සඳහන් ක්‍රියාකාරකම් 02 හැරුණු විට මෙම අදියරෙහි සියලුම ප්‍රධාන භෞතික ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

තවද ව්‍යාපෘතියෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2017 වර්ෂයේදී නිමාවට පත්විය.

ක්‍රියාකාරකම	අත්කරගත් ප්‍රගතිය (%)
ඒබීසී (ABC)ඇතිරීම	99.9%
තාර ඇතිරීම/ කාපට් ඇතිරීමෙහි වැඩ	99.8%

මෙම ව්‍යාපෘතියේ සියළු අදියරයන් සඳහා 2019 වර්ෂය අවසානයේදී වාර්තා වී ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 46%ක් වූයේ අදියරයන් 04හිම අතුරු ගෙවීම් සහතික (IPC) වාර්තා කරන ලද කාලසීමාවේදී අනුමත වී නොතිබීමයි.

ඒ අනුව ආසන්න වශයෙන් රුපියල් බිලියන 39 ක අතුරු ගෙවීම් සහතික (IPC) ප්‍රමාණයක් ඉහත සඳහන් කල වියදම සඳහා ඇතුලත් වී නොතිබිණි.

එබැවින් ව්‍යාපෘතිය වර්ෂය මුළුල්ලේම සුමට ලෙස ක්‍රියාත්මක වූවද වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය ඉතා අඩුවිය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ඛේදනය	ව්‍යාපෘති විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)
117-2-3-9	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	850.0	850.0	729.9
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	31,850.0	79,631.0	36,213.4
	එකතුව	**32,700.0**	**80,481.0**	**36,943.3**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ පිහිටීම දැක්වෙන සිතියමක් **ඇමුණුම 07** හි දක්වා ඇත.

2.2.5 නව කැලණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණුමත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය

කොළඹ නගරය, අර්ධ නාගරික ප්‍රදේශ සහ අධිවේගී මාර්ගයන් අතර මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණෙන් සහ දැනට කොළඹ හා අවට ප්‍රදේශයන් තුළපවතින රථවාහන තදබදය අවම කිරීමේ පරමාර්ථ සහිත ව උක්ත අධිවේගී මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම මාර්ගය භාවිතා කරන්නන්හට දෙමටගොඩ, රාජගිරිය, බත්තරමුල්ල පාර්ලිමේන්තු සංකීර්ණ පිවිසුම සහ කොස්වත්ත යන ප්‍රදේශවල ඉදිකිරීමට නියමිත අන්තර්හුවමාරු මධ්‍යස්ථානයන් ඔස්සේ මීට ප්‍රවේශ වීමේ පහසුකම් සහිතව ඉදිකරනු ලැබේ. මෙම ව්‍යාපෘතියඉදිකිරීම - ක්‍රියාත්මක කිරීම - මාරුකිරීම (BOT) යන පදනම මත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව(PPP) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියමාර්ග කොටස් 2ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. යෝජිත නව කැළණි පාලමෙන් ආරම්භ වී ඔරුගොඩවත්තදී බෙස්ලයින් මාර්ගයට සම්බන්ධ වී රාජගිරියෙන් අවසන් වන කි.මී. 6.9 පමණ දිගැති මංතීරු 4න් යුත් කණු මත ඉදි වන මාර්ග කොටස මෙහි ප්‍රථම අදියර ලෙස ද රාජගිරිය සිට අතුරුගිරිය ප්‍රදේශයේ දී පිටත වටරවුම් අධිවේගී මාර්ගය හා සම්බන්ධ වන පරිදි කි.මී. 10.4 කින්අතුරුගිරිය දක්වා දීර්ඝකිරීම මෙහි දෙවන අදියර ලෙස ද දැක්විය හැකිය.

පැ.කි.මී. 80 ත් 100 ත් අතර වේග සීමාවන් සඳහා සැලසුම් කර ඇති මෙමඟින් නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා මිනිත්තු 18 කින් පමණ ළඟාවීමේ පහසුව සැලසෙනු ඇත.

ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවති. 2018වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියෙහි ඉඩම් මැනුම් කටයුතු 20% ක ප්‍රගතියක් සහිතව සිදුවූ අතර 2019 වර්ෂය අවසන් වන විට එම කටයුතු සම්පූර්ණයෙන්ම නිමාවට පත්විය.


මෙහි පළමු අදියරෙහි ආයෝජකයන් සඳහා වන ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රගතිය 52% ක් වන අතර 2019 දෙසැම්බර් 31 වන විට ද එය ඒහා සමාන අගයකම පැවතිණි. ආයෝජකයන් සඳහා අභිමතය ප්‍රකාශ කිරීම සිදුකර අදාල ශ්‍රේණිගතකිරීම් සිදු කළ ද ව්‍යාපෘති යෝජනා ඉල්ලීම, කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව විසින් අනුමත නොකිරීම මේ සඳහා බලපෑ ප්‍රධානතම සාධකය ලෙස සඳහන් කළ හැක.

2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳුවිට ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි ඉලක්කය ලෙස එහි 90% සඳහන්ව තිබුනද ඉන් අත්පත් කරගැනීමට හැකිවී ඇත්තේ 22% ක ප්‍රගතියක් පමණක් වන අතර එය වර්ෂය තුල ඉලක්කගත අගයට වඩා අඩු අගයක් වී ඇත.

2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉඩම් අත්පත් කරගැනීම සඳහා වූ ඉලක්කය 70%ක් විය. මේ අනුව ඉලක්ක පූර්ණය කරගැනීමේ අගය 10% ක් වූ අතර වර්ෂ අවසානය වන විට වාර්තා වූ ප්‍රගතිය 7%කි.මෙම අඩු ප්‍රගතිය කෙරෙහි බලපෑ ප්‍රධානතම සාධකය වූයේ අක්මුදල් හිඟය හේතුවෙන් ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් වූ අංක 38 ගැසට් නිවේදනය පල කිරීමේ දී සිදු වූ ප්‍රමාදයයි.

ඊට අමතරව පළමු අදියරෙහි නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ ඉඩම් අත්පත් කරගැනීමේ යෝජනාව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත නැවතත් ඉදිරිපත්කර ඇත.

ව්‍යාපෘතියේ පළමු අදියරෙහි ඉලක්ක අත්පත් කරගැනීමේ සාරාංශයෙහි ප්‍රස්ථාර නිරූපනයක් පහතින් දක්වා ඇත.



රූප සටහන 2.2.5.1 - ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතියේ සාරාංශය

ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි ශක්‍යතා අධ්‍යයනයෙහි උපදේශනය සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා 2018 හා 2019 වර්ෂ වලදී පිළිවෙලින් 20% හා 100% ක්වූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව අදියර II හි ශක්‍යතා අධ්‍යයනය ඉලක්ක කර තිබූ ආකාරයටම 100% වන පරිදි 2019 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ කරන ලද අතර ඉලක්ක අත් පත් කර ගැනීමේ ප්‍රගතිය ද 100% විය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය මාතෘකා විස්තරය		මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	වියදම් (රු.මි)
117-02-03-15	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	100.0	16.0	12.0
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	125.0	112.0	107.2
	එකතුව	**225.0**	**128.0**	**119.2**

2018 වර්ෂයේදී ව්‍යාපෘතියමඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 47% ක්වන අතර 2019වසරේදී එම අගය 93% ක් දක්වා වර්ධනය වී ඇත. 2019වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වියදම් සඳහා වූ ඉලක්කය රුපියල් මිලියන 225ක් වූ නමුත්, සැලසුම් කල ආකාරයට ව්‍යාපෘතියෙහි ඉඩම් අත්පත් කරගැනීමේ වැඩකටයුතු කරගෙන යාමට නොහැකිවීම නිසා අවසන් මාස කිහිපය තුළ එම ප්‍රතිපාදන ප්‍රමාණය අඩු කර ප්‍රතිපාදන අවශ්‍යතාවයන් පැවති වෙනත් ව්‍යාපෘති සඳහා යොදවන ලදී. කෙසේවෙතත් 2018 වර්ෂයේදී ද මීට සමාන කාර්යසාධනයක් වාර්තා වූයේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි සිදු වූ එකී ප්‍රමාදයන් හේතුවෙනි.

2.2.6 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

මාර්ග භාවිතාකරන්නන්හට වඩාත් කාර්යක්ෂම සහ කඩිනම් මාර්ග සේවාවක් ලබාදීමේ අරමුණින් සැලසුම්කර ඇති මෙම ව්‍යාපෘතිය පොළව මට්ටමට ඉහළින් කුළුණු මත ඉදිකරනු ලබන කි.මී. 5.28 දිගැනි ප්‍රවේශ මාර්ගයකි. රු.මිලියන 36,500 ට ආසන්න මූල්‍ය ආයෝජන මත ඉදිවන මෙම මාර්ගය සඳහා මූල්‍ය සහාය ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා දෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත නිමවුම් ලෙස ,

- නව කැළණි පාලමේ සිට ගාලුමුවදොර දක්වා දිවෙන කුළුණු මත ඉදිවන මාර්ගය
- වරාය ඇතුළත ගොඩනැඟිලි ප්‍රතිස්ථාපනය
- උක්ත මාර්ගයට සමාන්තරව පොළොව මතින් දිවෙන මංතීරු 06 කින් යුක්ත මාර්ග කොටස

නිම කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතියතුළින් කොළඹ නගරයේ කාර්යබහුල ප්‍රදේශයන් හරහා වාහන තදබදය අවම කර ගැනීමට හැකිවනු ඇති අතර භාණ්ඩ ප්‍රවාහනය හා මගී ගමනාගමන කටයුතු ද මේ තුළින් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව ඉටුකර ගත හැකි වනු ඇත. තව ද සමුද්‍රීය සේවාවන් හා ප්‍රවාහිත භාණ්ඩ බෙදා හැරීමේදී හා නාවික සේවා සැපයීමේ කාර්යන්හිදී වරාය නාවික පර්යන්තයන් සමඟ කාර්යක්ෂමව සම්බන්ධවීමේ හැකියාවද මෙමඟින් සැලසෙනු ඇත.

2018 වර්ෂයේදී ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ප්‍රසම්පාදනය සහ උපදේශනය සඳහා වන ප්‍රසම්පාදනය සඳහා පිළිවෙලින් 40% සහ 35% ක ප්‍රගතියක්අත්පත් කරගෙන ඇත. මේ අතරින් උපදේශනයසඳහා වූ ප්‍රසම්පාදන කටයුතු 2019 වර්ෂයේ තුන්වන කාර්තුව වන විට සම්පූර්ණයෙන්ම නිමාවට පත් වූ අතර කොන්ත්‍රාත්කරුවන් සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු 2019 වර්ෂය අවසානයේදී නිමාවට පත්විය.

වගු අංක 2.2.6.1 – 2019/12/31 දිනට ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්හි භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ඉලක්කගත සැලසුම	අත්කරගත් ප්‍රගතිය
වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම	**10%**	**3%**
වරාය පහසුකම් මධ්‍යස්ථානයේ කණු ඉදිකිරීමේ කටයුතු	**100%**	**84%**
වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමෙහි අධීක්ෂණ කටයුතු	**10%**	**3%**
වරාය ගොඩනැගිලේලහි ඉදිකිරීම් හා අධීක්ෂණ කටයුතු නිර්මාණය කිරීම	**100%**	**70%**

මෙම ව්‍යාපෘතියෙහි සිවිල් වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුව 2019 අගෝස්තු මාසයේදී

ප්‍රදානය කෙරුනු අතර 2019 සැප්තැම්බර් මාසයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ විය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අංකය ක්ෂේත්‍රය	විස්තරය	මූලික ඇස්තමේන්තුගත වියදම (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත ඇස්තමේන්තුගත වියදම (රු.මි)	වියදම් (රු.මි)
117-02-03-16	2506 යටිතල පහසුකම් සංවර්ධනය	3,550.8	7,050.8	4302.6
	එකතුව	**3,550.8**	**7,050.8**	**4302.6**

2018 වර්ෂයේදී ව්‍යාපෘතිය 95% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර2019 වර්ෂයේදී වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ඉහත පරිදි දක්වා ඇත. ඉහත අගයේ සංයුතිය සඳහා සිවිල් වැඩ සඳහා වූ රුපියල් බිලියන 3.89 ක අත්තිකාරම් ගෙවීම්, කණු සිටුවීම සඳහා වූ රුපියල් බිලියන 0.36 ක ගෙවීම් ඇතුළත් වූව ද එම වියදම් වසර අවසානයට පෙර සිදු කර තිබුණ ද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඒවා ගෙවීම් ලෙස වර්ෂාවසානයේ සකසන සමස්ත වියදම් සඳහා එකතු කර නොතිබිණි.

2.2.7 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

සබරගමුව පළාත, බස්නාහිර හා දකුණු පළාත් සමඟ සම්බන්ධ කිරීම මඟින් පලාත් අතර ප්‍රවාහන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පෙරදැරි කරගනිමින් කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා ඉදිකිරීමට යෝජිත මෙම අධිවේගී මාර්ගය ආසන්න වශයෙන් කි.මී. 74 ක දිගකින් යුතුවේ. මෙම ව්‍යාපෘතිය අදියර 03කින් නිමකිරීමට නියමිත වන අතර එම එක් එක් අදියර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

පළමු අදියර – කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටස (කි.මී 0.00- කි.මී 26.30)

මෙම අදියර මඟින් කහතුඩුව සිට ඉංගිරිය දක්වා කි.මී. 26.3 ක දිගකින් යුත් අධිවේගී මාර්ග කොටස ඉදිකිරීමට නියමිතය. එය කහතුඩුව, හොරණ හා ඉංගිරිය යන ස්ථානවල ඉදිකරනු ලබන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 03කින් යුක්ත වේ.

දෙවන අදියර – ඉංගිරිය සිට රත්නපුර දක්වා කොටස (කි.මී 26.30 - කි.මී 52.50)

දිගින් කි.මී 26.2 කින් සමන්විත වන මෙම අධිවේගී මාර්ග කොටස ඉංගිරිය සිට රත්නපුර දක්වා ඉදිකිරීමට නියමිතය. කිරිඇල්ල, කුරුවිට හා රත්නපුර යන ස්ථාන වල අන්තර් හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර ඇති මෙහි උමං 06 ක්ද තැනීමට සැලසුම් කර ඇත.

තෙවන අදියර – රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා කොටස (කි.මී 52.50 - කි.මී 73.9)

රුවන්පුර අධිවේගී මාර්ගයට අයත් අවසාන අධිවේගී මාර්ග කොටස වන කි.මී 21.4 කින් සමන්විත වන මෙම මාර්ග කොටස රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ආර්ථිකප්‍රතිලාභ :

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය තුළින් මගීන්ගේ ගමන් පහසුව සැලසෙන අතර ප්‍රවාහන පහසුකම් දියුණු වීම තුළින් මැණික් කර්මාන්ත, තේ වැනි අපනයන නිෂ්පාදන මෙන්ම නව කර්මාන්ත වල ව්‍යාප්තියට ද මංපෙත් විවර වනු ඇත. තවද අධිවේගී මාර්ගය ආශ්‍රිතව ඉඩම් වල වටිනාකම ඉහළ යාම හේතුවෙන් මහජනතාවගේ ජීවන තත්ත්වයද ඉහළ යනු ඇත.

2019 වසර අවසන් වනවිට උක්ත අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවසන් කර ඇත. තවද පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව 99% ක ප්‍රගතියක් සහිතවමධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවන අතර එතෙක් අදියර 1 හි ප්‍රසම්පාදන කටයුතු 70% ක ප්‍රගතියක් සහිතව සිදු කෙරෙමින් පවති.ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වාර්තා වූ අගය 2018 වර්ෂයේ සිටම නියත අගයක පැවතියේ 2019 වර්ෂය අවසන් වන තෙක්ම මේ සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ කටයුතු අවසන් නොවීම හේතුවෙනි.

2016 වසරේ අගභාගයේදී ආරම්භ වූ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2018

දෙසැම්බර් 31 වන විට 20% ක ප්‍රගතියක් අත්පත් කරගෙන තිබූ අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ඉලක්කය ලෙස සඳහන්ව ඇත්තේ 5% කි.

ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා 74% ක ඉලක්කයක් අත්පත් කරගෙන තිබුනද 2019 වසර තුල අත්පත් කරගත් භෞතික ප්‍රගතිය 4.5%කි. ඒ අනුව, 2019 වර්ෂය අවසානයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා ව්‍යාපෘතිය අත්කරගත් සමුච්ඡිත ප්‍රගතිය 27%ක් පමණ වේ.

තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින්ව්‍යාපෘතියේ අදියර 03හිම ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද අරමුදල් සැපයීමේ ගැටළුවක් හේතුවෙන් ක්‍රියාත්මකවූයේ අදියර 1 හි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු පමණක් වන අතරව්‍යාපෘතියේ සිවිල් වැඩ මෙතෙක් ආරම්භ වී නොමැත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

ඇවැසි ක්ෂේත්‍රය	විස්තරය	මූලික ඇවැසි පුනිපාදනය (රු.මි)	2019/12/31 දිනට සංශෝධිත ඇවැසිපුනිපාදනය (රු.මි)	වියදම (රු.මි)
117-02-03-13	2105ඉඩම් හා ඉඩම් අත්පත් කර ගැනීම	50.0	15.0	9.35
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	50.0	36.0	35.0
	එකතුව	**100.0**	**51.0**	**43.35**

2019 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 93% ක් වන අතර 2018 වසරෙදී එම අගය 84% ක් ලෙස වාර්තා වී තිබිණි.

එහෙයින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව ව්‍යාපෘතියේ මූල්‍ය ඉලක්ක සාධනය 2018 වර්ෂයට වඩා 2019 වර්ෂයේදී සැලකියයුතු මට්ටමකින් වර්ධනය වී ඇති අතර සතුටුදායක අගයක පැවතිණි.

යෝජිත අධිවේගී මාර්ගයේ විහිදීම දැක්වෙන මාර්ග සිතියම ***ඇමුණුම 08***මඟින් දක්වා ඇත.

2019 වර්ෂයේදී අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සහ ඉලක්ක සපුරාගැනීමෙහි සාරාංශය

2018 වර්ෂය අවසානයේදී පවතින අධිවේගී මාර්ග ජාලය කිලෝමීටර් 169.13 කින් සමන්විත වූ අතර කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය ද ක්‍රියාත්මක තත්ත්වයේ පවතිමින් කාර්යක්ෂම ප්‍රවාහන ජාලයක් සැපයීමෙහිලා දායකව පැවතිණි.

2019 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී, කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ මාර්ගයෙහි සිවිල් වැඩකටයුතු ආරම්භ කර ඇති අතර කඩවත සිට කෙරවලපිටිය දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි කිලෝමීටර් 9.63 වූ කොටස නොවැම්බර් මාසයේදී මහජනතාව වෙත විවෘත කරන ලදි.

එසේවුවද පිටත වටරවුම් අධිවේගී මාර්ග කොටස මහජනතාව සඳහා විවෘත කිරීමෙන් පසුව ඉතිරිව ඇති මාර්ගය ආශ්‍රිත වෙනත් සිවිල් වැඩ කටයුතු 2020 වර්ෂයේ මුල් භාගයේ දී දී නිම කිරීමට අපේක්ෂිතය.

එසේම මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර 2හි ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිමකිරීමට සැලසුම් කර තිබුණ ද දේශීය බැංකු ණය ලබාගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකරය ලබාදීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් සහ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා අක්මුදල් හිඟවීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කළ කාලසීමාව තුලදී නිම කිරීමට නොහැකි විය.

ඒ හැරුණුවිට දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මාර්ග කිලෝමීටර් 38ක ප්‍රමාණයක් ගමනාගමන කටයුතු සඳහා මෙම වසරේ අවසන් මාස කීපයේදී විවෘත කර ඇත. මේ අනුව වසර අවසානය වන විට ලංකාවේ සමස්ත අධිවේගී මාර්ග ජාලය කිලෝමීටර් 217ක් දක්වා ඉහල ගොස් ඇත.

අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය							
අංකය	ව්‍යාපෘතියේ නම	31/12/2017 දිනට සමුච්ඡිත භෞතික ප්‍රගතිය	2018		2019		31/12/2019 දිනට සමුච්ඡිත භෞතික ප්‍රගතිය
			සමස්ත භෞතික ඉලක්ක	සමස්ත භෞතික ප්‍රගතිය	සමස්ත භෞතික ඉලක්ක	සමස්ත භෞතික ප්‍රගතිය	
1	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය					
		අදියර 1-80% අදියර 2-64% අදියර 3-71% අදියර 4-8%	අදියර 1-20% අදියර 2-45% අදියර 3-30% අදියර 4-40%	අදියර 1-06% අදියර 2-23% අදියර 3-13% අදියර 4-15%	අදියර 1-14% අදියර 2-09% අදියර 3-16% අදියර 4-20%	අදියර 1-2% අදියර 2-03% අදියර 3-10% අදියර 4-8.75%	අදියර 1-88% අදියර 2-90% අදියර 3-94% අදියර 4-74.75%
		සිවිල් වැඩ					
		අදියර 1 -01% අදියර 2-07%	අදියර 1 - 25% අදියර 2-50%	අදියර 1 – 4% අදියර 2 – 45%	අදියර 1 – 20% අදියර 2 – 42%	අදියර 1 – 0.21% අදියර 2 – 32%	අදියර 1 – 5.21% අදියර 2 -84%
2	දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය	අදියර 1 - 52%.	අදියර 1-42%	අදියර 1-34%	අදියර 1-14%	අදියර - 13%	අදියර 1- 99%
		අදියර 2- 29%	අදියර 2-46%	අදියර 2-25%	අදියර 2-39%	අදියර 2-28%	අදියර 2- 89%
		අදියර 3-45%	අදියර 3-51%	අදියර 3-44%	අදියර 3-11%	අදියර 3-10%	අදියර 3- 99%
		අදියර 4- 43%	අදියර 4-50%	අදියර 4-41%	අදියර 4-16%	අදියර 4-15.86%	අදියර 4-98.5%
3	කඩවත සිට කෙරවලපිටිය දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	43%	50%	41%	16%	11%	95%
4	කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 18%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 40%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 2%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය – 8%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 7%,	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 27%,
5	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන මාර්ග ව්‍යාපෘතිය		ඉඩම් අත්පත කරගැනීමේ ක්‍රියාවලිය - 10%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 90%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - අදියර I - 10%	ඉඩම් මැනුම් කටයුතුඅදියර I- 70%	ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය - 7%
		ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර I – 50%	ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර I – 50%	ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර I - 02%	ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර I- 48%	ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර - I 0%	ආයෝජකයන් සඳහා වූ ප්‍රසම්පාදනය අදියර I - 70%
6	කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය			විස්තරාත්මක නිර්මාණ කටයුතු - 70%	සිවිල් වැඩ 10% විස්තරාත්මක නිර්මාණ – 30%	සිවිල් වැඩ- 3% විස්තරාත්මක නිර්මාණ – 30%	සිවිල් වැඩ- 3% විස්තරාත්මක නිර්මාණ - 100%

2.3 මහාමාර්ග සංවර්ධනය

2.3.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය

ජාතික මහාමාර්ග ජාලයට සම්බන්ධ අධිවේගී මාර්ග සහ ඒ හා බී වර්ගයේ මහාමාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීමේ වගකීම මහාමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වේ. ඉහත එක් එක් ශ්‍රේණිවලට අයත් මහාමාර්ගයන්හි දැනට පවතින මාර්ග දුර ප්‍රමාණයන් පහත දැක්වේ.

වගු අංක 2.3.1.1 ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය

ජාතික මාර්ග වර්ගය/ ශ්‍රේණිය	මුළු දුර (කි.මී)
'ඒ' ශ්‍රේණියේ මහාමාර්ග	4,215
'බී' ශ්‍රේණියේ මහාමාර්ග	8,005
අධිවේගී මාර්ග	217.8
එකතුව	**12,437.8**

වගු අංක 2.3.1.2 2019.12.31 වන විටජාතික මාර්ග ජාලයේ"ඒ"හා "බී"ශ්‍රේණියේ මහාමාර්ගයන්හි පළාත්බද වර්ගීකරණය

පළාත	ජාතික මහාමාර්ග (කි.මී)		
	"ඒ"ශ්‍රේණියේ මහාමාර්ග	"බී" ශ්‍රේණියේ මහාමාර්ග	එකතුව
බස්නාහිර	374.48	1,229.82	1,604.30
මධ්‍යම	408.57	1,338.41	1,746.98
දකුණ	346.88	1,154.36	1,501.24
උතුරු	734.49	524.97	1,259.46
නැගෙනහිර	619.55	551.13	1,170.68
වයඹ	352.43	1,002.75	1,355.18
උතුරු මැද	492.04	701.74	1,193.78
ඌව	471.04	693.19	1,164.23
සබරගමුව	415.57	808.58	1,224.15
එකතුව	**4,215.05**	**8,004.95**	**12,220.00**

"ඒ"ශ්‍රේණියේ මහාමාර්ග අතරින් වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් උතුරු පළාත තුලද අවම මාර්ග දුර ප්‍රමාණයක් දකුණු පළාත තුලද පිහිටා ඇත. එසේම"බී"ශ්‍රේණියේ මහාමාර්ග අතරින් වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් මධ්‍යම පළාත තුලද අඩුම දුර ප්‍රමාණයක් උතුරු පළාත තුලද පිහිටා ඇත.

ජාතික මහාමාර්ග ජාලය ඉහත වගුවේ දක්වා ඇති පරිදි පළාත් වශයෙන් මෙන්ම මාර්ග ඉදිකිරීම/ නැවත ඉදිකිරීම සඳහා යොදා ගනු ලබන මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය අනුවද පහත පරිදි වර්ග කළ හැකිය.

වගු අංක 2.3.1.3 මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය

මාර්ග ඇතුරුම් වර්ගය	දුර (කි.මී)	දායකත්ව අගය (%)
ගල් මිශ්‍ර තාර ඇතිරීම	8272.3	72.1%
මතුපිට පෘෂ්ඨීය ඇතුරුම	141.7	1.2%
ගල් අතුරා තාර දැමීම	2896.5	25.3%
කොන්ක්‍රීට් ඇතිරීම	98.2	0.9%
බොරළු දැමීම	60.2	0.5%

ඉහත වගුවේ දක්වා ඇති පරිදි ජාතික මහාමාර්ග ජාලය තුල වැඩිම මාර්ග ප්‍රමාණයක් සඳහා යොදා ගෙන ඇත්තේ ගල් මිශ්‍ර තාර ඇතිරීමේ ක්‍රමවේදය වන අතර අඩුම මාර්ග ප්‍රමාණයක් සඳහා බොරළු දැමීමසිදුකර ඇත.

ජාතික මහාමාර්ග ජාලයේ වර්තමාන තත්ත්වය

2018 වර්ෂයේදී විදේශීය හා දේශීය ණය ආධාර යටතේ කි.මී.47.73 ක් මාර්ග වැඩිදියුණු කිරීමේ/ පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර කි.මී.1,050 ක මාර්ග වල වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරමින් පැවතිණි. .ඊට අමතරව, විදේශ ආධාර යටතේ වර්ෂය තුල පාලම් 12 ක නැවත ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලද අතර දේශීය ආධාර යටතේ ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ පාලම් 10 ක නැවත ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී.

එසේම 2019 වර්ෂයේදී ජාතික මහාමාර්ග කි.මී. 267.2 ක වැඩිදියුණු කිරීමේ කටයුතු සහ ග්‍රාමීය මාර්ග කි.මී. 167.2 ක වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකර ඇත. ඊට අමතරව ජාතික මාර්ගයන්හි පිහිටි පාලම් 24 ක වැඩිදියුණු කිරීමේ කටයුතු ද 2019 වර්ෂය තුලදී සිදු කර ඇත.

තවද 2019 වර්ෂය තුලදී අධිවේගී මාර්ග ජාලය කි.මී. 169.8 සිට කි.මී. 217.8 දක්වා වැඩිදියුණු කරන ලදී. එමඟින් ජාතික මාර්ග ජාලය කි.මී. 12,347.8 දක්වා වර්ධනය කිරීම සිදු විය.

වාර්තාකරණ කාලසීමාව තුල "ඒ" හා "බී" ශ්‍රේණියේ මහාමාර්ගයන්හි දුර ප්‍රමාණයන්හි කිසිදු වෙනස්කමක් සිදු වී නොමැති අතර නියමිත ආකාරයෙන් බාධාවකින් තොරව භාවිතයට ගැනීමට හැකිවිණි.

"බී" ශ්‍රේණියේ මහාමාර්ගයන්හි දුර ප්‍රමාණ 2018 වර්ෂයේදී දළ වශයෙන් කි.මී.10කින් වැඩිදියුණු කර ඇති අතර එකතු කරන ලද මාර්ගයන් පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

මෙහි සඳහන් මාර්ග අතරින් අයිතම අංක 01 අලුතින්ම ඉදිකරන ලද මාර්ගයක් වන අතර ඉතිරි අයිතමයනට අයත් මාර්ග 02 මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවූ මාර්ගයන් වන අතර පසුව ඒවා මාර්ග සංවර්ධන අධිකාරිය යටතට පවරා ගන්නා ලදි.

වගු අංක 2.3.1.4 2018 වර්ෂයේදී "බී" ශ්‍රේණියේ මහාමාර්ග ජාලය සඳහා අළුතින් එකතු කරන ලද මාර්ග

අනු අංකය	මාර්ගයේ නම	දුර (කි.මී)
1	පැලවත්ත ආරක්ෂක මූලස්ථානය සඳහා ප්‍රවේශ මාර්ගය(බී 642)	1.255
2	කෑගල්ල අතුරු මාර්ගය (බී 643)	4.400
3	කැලණිමුල්ල - අංගොඩ - කොස්වත්ත මාර්ගය (බී 644)	4.567

ශ්‍රී ලංකාවේ දැනට නිමකරන ලද සහ ක්‍රියාත්මකවන මාර්ග සඳහන් සිතියම ***ඇමුණුම 09*** හි දක්වා ඇත.

2.3.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම (RMTF)

ලංකාව පුරා පිහිටි ජාතික මහාමාර්ග කි.මී. 12,220ක්, පාලම් 4,660කට ආසන්න ප්‍රමාණයක් සහ ගුවන් පාලම් 12ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාර්ෂිකව නඩත්තු කරනු ලැබේ. උක්ත වාර්ෂික නඩත්තු වැඩසටහන යටතේමාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවන් සහ විධායක ඉංජිනේරුවන් විසින් දෛනික, කාලීන සහ හදිසි වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ වැලි මුද්‍රිත තාර ආලේපනය, කඩතොළු පියවීම , මාර්ග උරහිස්වියුහ ඉදිකිරීම්, මාර්ග වැඩිදියුණු කිරීම් , සංඥා පද්ධති ස්ථාපිත කිරීම් හා මාර්ග සලකුණු කිරීම් වැනිවිවිධ පරාසයන්ට අයත් වන මාර්ග නඩත්තු කිරීම් කටයුතු දිවයින පුරා සිදුකරනු ලැබේ.


2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාර්ග කි.මී.227.2 ක පමණ දුර ප්‍රමාණයක්වැලි මුද්‍රිත තාර ආලේපන ද කි.මී. 130.45ක දුර ප්‍රමාණයක් ගල් මිශ්‍ර තාර ආලේපනකටයුතු ද ඍජු ශ්‍රමය හා ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය(ICTAD) යටතේ ලියාපදිංචිය ලැබූ කොන්ත්‍රාත්කරුවන් යොදවා සිදු කරන ලදි.

ඒ අනුව මෙම වැඩසටහන යටතේ සම්පූර්ණ මාර්ග කි.මී. 357.63ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත.

වගු අංක 2.3.2.1 – 2019 වර්ෂයේදී සිදුකළ මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය

පළාත	වැලි මුද්‍රිත කාර
බස්නාහිර පළාත	**77.43**
මධ්‍යම පළාත	**178.53**
දකුණු පළාත	**3.08**
උතුරු පළාත	**28.66**
නැගෙනහිර පළාත	**2.28**
නැගෙනහිර පළාත (අක්කරායිපත්තු)	-
වයඹ පළාත	**37.85**
උතුරුමැද පළාත	**2.00**
ඌව පළාත	**1.35**
සබරගමුව පළාත	**26.45**
එකතුව	**357.63**

2019 වර්ෂය තුල වැලි මුදිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද මුළු මාර්ග දුර ප්‍රමාණය කි.මී. 481.72 ක් වන අතර ඉන් කි.මී. 357.63ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන ලද්දේ වැලි මුදිත තාර ආලේපනය කිරීම මහිනි.වාර්තා වී ඇති ප්‍රතිසංස්කරණිත මාර්ග දුර ප්‍රමාණයන් පිළිබඳව විමසා බැලීමේදී 2018 වර්ෂය තුලවැලි මුදිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද වැඩිම දුර ප්‍රමාණය සබරගමුව පළාතෙන් වාර්තා වී ඇති අතර 2019 වර්ෂයේදී එසේ ප්‍රතිසංස්කරනය කරන ලද වැඩිම දුර ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ මධ්‍යම පළාතෙනි.



රූපසටහන 2.3.2.1 – 2019 වර්ෂයේදී නඩත්තු කරන ලද මාර්ගයන්හි භෞතික ප්‍රගතිය

එසේ ම 2018 සහ 2019 යන දෙවර්ෂයන්හිදීම වැලි මුදිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද අවම දුර ප්‍රමාණය නැගෙනහිර පළාතෙන් වාර්තා වන අතර දුර ප්‍රමාණයන් එකිනෙක සැසඳීමේ දී 2019 වසරේ වාර්තා වූ අගය 2018 වසරෙහි වාර්තා වූ අගය ඉක්මවා ගොස් නොතිබිණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය - 2019	2019/12/31 දිනටප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	ඛියදම්(රු.මි.)
117-02-04-01	2506 යටිතල පහසුකම් සංවර්ධනය	5,000.0	5,000.0	4,961.3
	එකතුව	**5,000.0**	**5,000.0**	**4,961.3**

2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මෙම වැඩසටහනෙහි මූල්‍යප්‍රගතිය 81% වූ අතර 2019 වර්ෂයේදී එය 99% ලෙස වාර්තා විය. මේ අනුව 2019 වර්ෂයේ දී මූල්‍ය ඉලක්ක අත් කර ගැනීම ඉතා සාර්ථකව සිදු වූ අතරසංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ඉලක්කගත මූල්‍යප්‍රගතිය 75% ට වඩා වැඩි අගයක් පෙන්වමින් අත් කර ගැනීමට ව්‍යාපෘතියට හැකියාව ලැබී ඇත.

2.3.3 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය

වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ මාර්ග ආරක්ෂණය වැඩිදියුණු කිරීම සහ උසස් තත්ත්වයෙන් යුත් මාර්ග ජාලයක් සැලසුම් කිරීමයි.මෙම වැඩසටහන යටතේ ප්‍රමුඛ අවධානයක් යොමු කරනු ලබන්නේ මහාමාර්ග ජාලය තුල මාර්ග ආරක්ෂණය ඇතිකිරීම සඳහායි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ඒකකය වනුයේ මාර්ග සංවර්ධන අධිකාරියේ

සැලසුම් අංශයේ ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ඒකකයයි.

ඒ අනුව මෙම ඒකකය මඟින් පදිකයින්ගේ හා වාහන පදවන්නන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මාර්ග ජාලය අනතුරු වලින් නිදහස් තැනක් කිරීමට සිය නිරන්තර උත්සාහයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ විවිධ ක්‍රියාකාරකම් වාර්ෂිකව ක්‍රියාත්මක වන අතර එම ක්‍රියාකාරකම් හි ප්‍රමුඛත්වය මාර්ග ජාලය තුල ඇතිවන හදිසි තත්වයන් මෙන්ම මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් රථ වාහන පොලිසිය හා මහජනතාව විසින් සිදු කරන ඉල්ලීම් මත තීරණය වේ. නමුත් උක්ත වැඩසටහන සඳහා ජාතික අයවැය මඟින් වෙන් කෙරෙන වාර්ෂික අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය හා මාර්ග සංවර්ධන අධිකාරියේ ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ඒකකය සතු මානව සම්පත ප්‍රමාණවත් නොවීම යන හේතු මත ඇතැම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්වයන් උද්ගත වී ඇත.

2019 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

වගු අංක 2.3.3.1 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්

අයිතම	ක්‍රියාකාරකම	ප්‍රගතිය	%
01	ජාතික මාර්ග ජාලයෙහි හඳුනාගත් අනතුරුදායක ස්ථානයන්හි ආරක්ෂක උපකරණ සවිකිරීම.	ආරක්ෂක ප්‍රත්‍යාස්ථ කණු 100ක් සවිකිරීම	100%
02	උපද්‍රවකාරී ස්ථාන සහ අනතුරු බහුලව සිදුවන ස්ථාන වැඩිදියුණු කිරීම	මීපේ - ඉංගිරිය මාර්ගය	100%
03	උසස් රථවාහන අනතුරු ඇහවීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම	ජයවර්ධනපුර රෝහල් මාර්ගය	100%
04	පාසල් සහ කර්මාන්ත කලාප අසල මාර්ග ආරක්ෂණවිධි වැඩිදියුණු කිරීම	මේ සඳහා පාසල් කලාප 5 ක් තෝරාගත් අතර ඒවායේ මාර්ග සංඥා සවිකිරීම සම්පූර්ණ කර ඇත.	100%
05	පදික හුවමාරු ස්ථාපනය කිරීම	කළුතර මහ විද්‍යාලය අසල	100%

මෙම ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව, කොන්ක්‍රීට් ආවරණ ප්‍රතිසංස්කරණය කිරීම, පදිකයන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම, මාර්ගයන් සඳහා අවශ්‍ය අත්වැල් (Hand Rails) සැපයීම සහ ඒවා ස්ථාපනය කිරීම, මාර්ග සලකුණු කිරීම සහ මතුගම පිහිටි යටිබිම් මාර්ගයෙහි භූ විෂමතා සමීක්ෂණ කටයුතු ආදී ක්‍රියාකාරකම් කිහිපයක් 2019 වර්ෂය තුලදී නිමකිරීමට හැකිවී ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී අත්කරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය 31% ක් වූ අතර 2018 එම අගය 86% ක් ලෙස වාර්තා වී ඇත. තවද මෙම ව්‍යාපෘතිය සඳහා වාර්තා වූ වියදම රුපියල් මිලියන 7.73 ක් වූව දළුහි වැඩ වටිනාකම රුපියල් මිලියන 17ක් පමණ වේ. ඒඅනුව මෙම වැඩසටහන අපේක්ෂිත ඉලක්කයන් අභිබවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. බිල්පත් වාර්තා කිරීමේ දී ඇතිවූ ප්‍රමාදයන් හේතුවෙන් ඉහත වෙනස පැනනැගී ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අංශය/ ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය -2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි)	වියදම්(රු.මි)
117-02-04-21	2506 යටිතල පහසුකම් සංවර්ධනය	25.0	25.0	7.73
	එකතුව	**25.0**	**25.0**	**7.73**

2.3.4රථවාහන ගමනාගමන කළමනාකරණව්‍යාපෘතිය

මෙය වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන අතර පාසල්, රෝහල් හා පොදු ස්ථාන අසලපදිකයන්ගේ ආරක්ෂාවසඳහා සහ ජාතික මහාමාර්ග ජාලයෙහි මංසන්ධීන්හි රථවාහන තදබදය අවම කිරීම සඳහා මාර්ගසංවර්ධන අධිකාරියේ මාර්ග නිර්මාණ ඒකකය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.මෙම වැඩසටහන යටතේ පහත සඳහන්ක්‍රියාකාරකම් ද්විත්වය ක්‍රියාත්මක කරනු ලැබේ.

- මාර්ග සංඥා හා මාර්ග සලකුණු කිරීම් නිර්මාණය හා අධීක්ෂණය
- මාර්ග සංඥා සහිත අන්තර්හුවමාරු මධ්‍යස්ථානයන් නිර්මාණය, ස්ථාපනය කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම.

2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණයෙන්ම නිම කරන ලද ක්‍රියාකාරකම්හි ලැයිස්තුව පහත දක්වා ඇත.

- නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි මංසන්දියේ මාර්ග සංඥා පද්ධතියක් ස්ථාපනය කිරීම.
- කාත්තන්කුඩිහී පදික මාරුව සකස් කිරීම
- ගාල්ල බස් නැවතුම් මංසන්ධියේ මාර්ග සංඥා පද්ධතියක් ඉදිකිරීම.
- කඳාන මංසන්ධියෙහිමාර්ග සංඥා පද්ධතියක් ඉදිකිරීම.
- නැගෙනහිර පලාතේ අක්කරායිපත්තු මූලික රෝහල අසල පදික මාරුව සකස් කිරීම
- නැගෙනහිර පළාතේ කල්මුනෙයි අෂ්රොෆ් අනුස්මරණ රෝහල අසල පදික මාරුව සකස් කිරීම
- කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රත්මලාන ගුවන් තොටුපොළ මංසන්දියේ මාර්ග සංඥා පද්ධතියක් ඉදිකිරීම.
- කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ අඟුලාන සොයිසාපුර මංසන්ධියේ මාර්ග සංඥා පද්ධතිය වැඩිදියුණු කිරීම.
- ගල්කිස්ස ශ්‍රේෂ්ඨාධිකරණය අසල පදික මාරුව ඉදිකිරීම.
- හොරණ බස් නැවතුම්පොළ අසල පදික මාරුව ඉදිකිරීම.

කැලණිය විශ්වවිද්‍යාලය අසල පදික මාරුව වැඩිදියුණු කිරීමේ කටයුතු 2019 වර්ෂයේ සිවිවන කාර්තුවේදී ආරම්භ කළ අතර එහි ප්‍රගතිය 1% කි.

මෙම වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී ක්‍රියාකාරකම් 12ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුන ද මේ සඳහා වෙන් කර තිබූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවූයේ ක්‍රියාකාරකම් 11ක් පමණි. මේ අනුව පොල්දූව මංසන්ධියේ හා ඇතුල්කෝට්ටේ මංසන්ධියේ මාර්ග සංඥා පද්ධති ස්ථාපනය කිරීම යන 2019 වර්ෂයේදී ආරම්භ නොකෙරිණි.

2019 වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය 31% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. 2019 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් සංඛ්‍යාව අඩු අගයක් ගත් බැවින් මේ සඳහා වෙන් කර තිබූ මූලික අයවැය ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියක් වෙත මාරු කරන ලදී. ඒ අනුව ප්‍රතිපාදන ක්ෂය වීමක් සිදුවිය. වසර අවසානයේදී නිමකරන ලද වැඩ ප්‍රමාණයෙහි අතැති බිල්පත් වටිනාකම රුපියල් මිලියන 20ක් ලෙස වාර්තා වී ඇත.

මේ පිළිබඳව සංසන්දනාත්මකව විමසීමේදී, 2018 වර්ෂයේදී මේ සඳහා වෙන් වූ මූලික

අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 25ක් වූ අතර සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව පසුගිය වර්ෂයන්හි බිල්පත් පියවීම් සඳහා එම අගය 66% කින් වර්ධනය වී ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදන - 2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-22	2506 යටිතල පහසුකම් සංවර්ධනය	100.0	64.0	20.0
	එකතුව	100.0	64.0	20.0

2.3.5 පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (A005) මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ005) මාර්ගයේමාර්ග කි.මී.147 ක දුර ප්‍රමාණයක් ද්විත්ව මංතීරු ලෙස ඌව පළාතේ බදුල්ල සිට නැගෙනහිර පළාතේ වෙන්කලාඩි දක්වා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගෙන ඇත.

පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ 5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුළු ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 140 කි. සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල හා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 60 ක් බැගින් සමානව අරමුදල් සපයනු ලැබේ. ඉතිරි මුදල වන ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කරනු ලැබේ.

බදුල්ල-වෙන්කලාඩි මාර්ග ව්‍යාපෘතියෙහි කාලසීමාව අවුරුදු 03ක් වන අතර සංරචක 02ක් යටතේ වන කොන්ත්‍රාත් පැකේජ 6 ක් ඔස්සේ ක්‍රියාත්මක වන අතර එම කොන්ත්‍රාත් පැකේජ පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.


වගු අංක 2.3.5.1 පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් පැකේජ

සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් පැකේජයන්හි ප්‍රගතිය

සවුදි අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ'ඒ'		
පැකේජ 01	බිබිලේ-පදියතලාව මාර්ග කොටස	කි.මී. 29
පැකේජ 02	පදියතලාව- තම්පිටිය මාර්ග කොටස	කි.මී. 30
පැකේජ 03	තම්පිටිය- වෙන්කලාඩි මාර්ග කොටස	කි.මී. 27.8
ඔපෙක් අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ 'බී'		
පැකේජ 01	බදුල්ල-පස්සර මාර්ග කොටස	කි.මී. 20
පැකේජ 02	පස්සර-ලුනුගල මාර්ග කොටස	කි.මී. 21
පැකේජ 03	ලුනුගල- බිබිලේ මාර්ග කොටස	කි.මී. 19

සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් පැකේජ 1 හා 2 හි සිවිල් වැඩ 2018 ජූලි මාසයේදී ආරම්භ වූ අතර එය 2018 වර්ෂය අවසානය වන විට 3% ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

කොන්ත්‍රාත් පැකේජ 3 හි සිවිල් වැඩ 2018 වර්ෂයේදී ආරම්භ නොවූ නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සිදුකරන ලද අතර 2019 වසර අවසානයේදී ඉහත සඳහන් පැකේජ 03ම 50%ක සමස්ත ප්‍රගතියක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති.




රූපසටහන 2.3.5.1 - සංවර්ධනය සඳහා සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක වන පැකේජයන්හි සමුච්ඡිත භෞතික ප්‍රගතිය

එසේම ගොඩනැගිලි ප්‍රතිස්ථාපනය හා ඉඩම් අත්පත් කරගැනීම් කටයුතු 90% ක ප්‍රගතියක් යටතේ 2018 වර්ෂය තුල ක්‍රියාත්මක වූ අතර 2019වර්ෂයේදී එම අගය 93%ක් දක්වා වර්ධනය විය.මේ අනුව ඉඩම් අත්පත් කරගැනීම සඳහා 2019 වර්ෂයදී අත් කර ගත් කාර්යසාධනය ඉලක්ක කළ ප්‍රමාණයෙන් 33% ක් විය.

සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් පැකේජයන්හි ප්‍රගතිය

මේ යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් පැකේජ 03හිම වැඩකටයුතු 2018 වසරේදී ආරම්භ කළ අතර 2018 වසර අවසානයේදී 37% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී. 2019 වර්ෂය අවසන් වන විට එම අගය වාර්තා වූයේ 55% ක් ලෙසිනි.

සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද කොන්ත්‍රාත් පැකේජයන්හි ඉඩම් අත්පත් කරගැනීම සහ සිවිල් වැඩ 2017 ජූනි මාසයේදී ආරම්භ වූ අතර 2019 වර්ෂය අවසන් වන විට එම පැකේජ 03 සඳහාම අත්පත් කරගත් සමුච්ඡිත භෞතික ප්‍රගතිය 89% කි. ඒ අනුව මෙම වසරෙහි ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය 45% කි.



රූපසටහන 2.3.5.2 - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන පැකේජයන්හි සමුච්ඡිත භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියෙහි සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක අදියර සඳහා 2019 වර්ෂයේදී 54%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර එය 2018 වර්ෂයේදී වාර්තා වී ඇත්තේ 57% ක් ලෙසිනි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙහි මූල්‍යමය ඉලක්ක සාක්ෂාත් කරගැනීම, 2019 වර්ෂයේදී 2018ට සාපේක්ෂව 3%කින් පහළ ගොස් ඇති බවක් පෙනී යයි.

එමෙන්ම මේ සඳහා වාර්තා වී ඇති වියදම රුපියල් මිලියන 1,013.3ක් වන අතර ව්‍යාපෘතියෙහි සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට වඩා වර්ෂය තුල සිදුකරන ලද වැඩ වටිනාකම වැඩි අගයක් ගෙන තිබිණ.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය (සවුදි අරමුදල)

අයවැය ඡේදය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය -2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි)	වියදම(රු.මි)
117-02-04-23 (සවුදි)	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	200.0	25.0	9.0
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	2,000.0	1,867.0	1,004.3
	උප එකතුව	**2,200.0**	**1,892.0**	**1,013.3**

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය (ඔපෙක් අරමුදල)

අයවැය ඡේදය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය -2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි)	වියදම(රු.මි)
117-02-04-41 (ඔපෙක්)	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	300.0	100.0	100.0
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	1,250.0	1,888.0	1,089.3
	උප එකතුව	**1,550.0**	**1,988.0**	**1,189.3**

සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ වූ කොන්ත්‍රාත් පැකේජ සඳහා පිළිවෙලින් 2018 සහ 2019 වර්ෂ සඳහා 81% සහ 60% මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. 2019 දෙසැම්බර් 31 වන දින වනවිට පූර්ණය කිරීමට තිබූ බිල්පත් ප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් මිලියන 99 ක් ලෙස වාර්තා වී තිබිණ.

ඒ අනුව සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 2019 වර්ෂය අවසන් වන විට 57%ක් වූ අතර 2018 වර්ෂය සඳහා එම අගය72% ක් ලෙස වාර්තා විය.

ව්‍යාපෘතියේ මාර්ග සිතියම ***ඇමුණුම 10*** න් දැක්වේ.

2.3.6 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල II)

කි.මී. 79ක සම්පූර්ණ දිගකින් යුත් මාර්ග කොටස් 06ක් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ඇ.ඩො.මී. 60ක මුදලක් සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල වෙතින් ශ්‍රී ලංකා රජය වෙත මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වනුයේ ප්‍රමුඛතා පදනම මත තෝරාගත් මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණුකිරීම මගින් ජාතික මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි.

මෙමව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2013 ජූනි මාසයේදී ආරම්භ කර 2015 වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ම නිම කරන ලද අතර 2016 වර්ෂයේ සිට මේ දක්වා නිම කරන ලද අතර මාර්ග ව්‍යාපෘතීන්හි බිල්පත් ගෙවීම් කටයුතු පමණක් සිදු කරන ලදී.

වගු අංක 2.3.6.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග

ව්‍යාපෘති විස්තරය	දිග (කි.මී)
ඒ 09 මහාමාර්ගයේ කටුගස්තොට - අලවතුගොඩ මාර්ග කොටස	10.9
ඒ 09 මහාමාර්ගයේ අලවතුගොඩ - පලාපත්වෙල මාර්ග කොටස	16.9
ඒ 09 මහාමාර්ගයේ පලාපත්වෙල - නාඋල මාර්ග කොටස	21.6
බී 541 මාර්ගයේ තම්බලගමුව - කින්නියා මාර්ග කොටස	8.5
බී 93 මාර්ගයේ දෙනිඔවිට - දැරණියගල මාර්ග කොටස	14.0
ඒ 01 මහාමාර්ගයේ පෑලියගොඩ - කිරිබත්ගොඩ මාර්ග කොටස	7.2
එකතුව	**79.1**

ඉහත වගුවේ දක්වා ඇති සම්පූර්ණ කරන ලද මාර්ගවලට අමතරව, ව්‍යාපෘතියේ ඉතිරිව තිබූ අයවැය ප්‍රතිපාදන යොදාගනිමින් 2018 වර්ෂය අවසානයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කල යුතු යැයි හඳුනාගෙන තිබූ අතර එය මෙම වර්ෂයේ මුල් කාර්තුවේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබිණ.

- මහනුවර - යාපනය මාර්ගයේ නාඋල නගරය සංවර්ධනය කිරීම ද ඇතුළුව මාර්ග කි.මී. 53+ 740 – 58+000 දක්වා පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම.
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/3 නැවත ඉදිකිරීම
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/1 නැවත ඉදිකිරීම
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/2 නැවත ඉදිකිරීම

එහෙයින් 2018 වර්ෂය අවසානයේදී සැලසුම් කල පරිදි අපේක්ෂිත භෞතික ඉලක්කයන් කරා ලඟාවීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ තත්‍ය ප්‍රගතිය අඩු අගයක් ගනු ලැබිණි.

2019 වර්ෂය අවසන් වන විට මහනුවර - යාපනය මාර්ගයේ (ඒ009) හා නාඋල නගරය ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය කිරීම සඳහා 63% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්පත් කරගැනීමට තිබූ ඉලක්කය 42% ක් වුවද මෙම ක්‍රියාකාරකම 100% කට වඩාවැඩි ප්‍රගතියක් අත්පත් කරගැනීමට සමත් වී ඇත.

මීට අමතරව 2019 වර්ෂය අවසන් වන විට ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ ඉහත සඳහන් පාලම් අංක 4/3, 6/1 සහ 6/2 ආදියෙහි නැවත ඉදිකිරීම් කටයුතු සඳහා පිළිවෙලින් 11%,

12% සහ 0.2% ක භෞතික ප්‍රගතීන් අත්පත් කරගෙන ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම ඩිස්ත්‍රික	අයවැය ප්‍රතිපාදනය -2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි)	වියදම්(රු.මි)
117-2-4-29	2506 යටිතල පහසුකම් සංවර්ධනය	260.0	500.8	225.4
	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	0.0	7.8	7.8
	උප එකතුව	**260.0**	**508.5**	**233.2**

මෙම ව්‍යාපෘතිය2019 වර්ෂය අවසානයේදී අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය 46%ක් වන අතර 2018 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 27%ක් ලෙසිනි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ඉලක්ක සපුරාගැනීම 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී ඉහල අගයක් ගෙන ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් 2019 වර්ෂය අවසානයේදී වාර්තා වූ කල වැඩ ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් මිලියන 502ක් විය. ඒ අනුව ව්‍යාපාතිය සැලසුම් කල පරිදි වර්ෂය තුල මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කරගෙන ඇති බව පෙනී යයි.

2.3.7 උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය

උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු , ආසියානු සංවර්ධන බැංකුව විසින් අතිරේක ණය මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය කරන ලදි.

එම අතිරෙක ණය මුදල මඟින්උතුරු සහ උතුරුමැද පළාත්වල 'ඒ' ශ්‍රේණියේ මාර්ග කි.මී. 61.2 කුත් 'බී' ශ්‍රේණියේ මාර්ග කි.මී. 56.2 කුත් වශයෙන් සම්පූර්ණ කි.මී. 118 ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීමසිදුකරනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ සමස්ත කාර්යසාධනය සතුටුදායක අගයක පවතී. මෙහි කොන්ත්‍රාත් පැකේජ 9 හිම සිවිල් වැඩ 2015 වර්ෂයේදීසම්පූර්ණයෙන්ම නිමාවට පත්වූ අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය අඩුපාඩු නිවැරදි කිරීමට බැඳී ඇති කාලසීමාවේ පවතින අතර කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කටයුතු සිදු කරමින් පවති.

වගු අංක 2.3.7.1උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය යටතේ ප්‍රතිසංස්කරණිත මාර්ග

මාර්ගයේ/ව්‍යාපෘතියේ නම	දිග (කි.මී.)
ඒ 029 වව්නියාව - හොරොව්පතාන මාර්ගය කි.මී. 24+000 - කි.මී. 34+950	10.95
බී 283 මැදවච්චිය - කැබතිගොල්ලෑව මාර්ගය කි.මී. 0+000 - කි.මී. 12+600	12.60
බී. 283 මැදවච්චිය - කැබතිගොල්ලෑව මාර්ගය කි.මී.12+600 - කි.මී.25+400	12.80
බී 211 කැබතිගොල්ලෑව - පදවිය මාර්ගය කි.මී.0+000- කි.මී. 15+500	15.50
බී. 211 කැබිනිගොල්ලෑව - පදවිය මාර්ගය කි.මී. 15+500- කි.මී.31+35	15.85
ඒ 014 මැදවච්චිය-මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයකි.මී.47+100- කි.මී. 62+100	15.10
ඒ 014 මැදවච්චිය - මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයකි.මී.62+100- කි.මී. 76+500	14.40
ඒ බී 019 යාපනය - පන්නායි කයිට්ස් මාර්ගය කි.මී.0+000- කි.මී.10+000	10.00
ඒ බී 019 යාපනය - පන්නායි කයිට්ස් මාර්ගය කි.මී.10+000- කි.මී.20+27	10.27
ඒ 09 නුවර - යාපනය මාර්ගය කි.මී.141+100 - කි.මී. 150+400	09.3

මෙම ණය මුදලෙහි ඉතිරි මුදල් යොදවමින් මහනුවර- යාපනය මාර්ගයේ(ඒ009) කි.මී.141+100 – 150+400 දක්වා වන කොටස පුනරුත්ථාපනය කර වැඩිදියුණු කිරීම 2017 මාර්තු මාසයේදී ආරම්භ කෙරුණු අතර 2019 වසර අවසානයේදී 100% ක ප්‍රගතියක් සහිතව නිමාවට පත්විය. 2018 වර්ෂය අවසානයේදී

සම්පූර්ණයෙන් නිම වෙමින් තිබූ මෙම ව්‍යාපෘතියෙහි ශේෂව පැවති 1%ක් පමණක් මේ වසරේදී සම්පූර්ණ කරන ලදී.

මීට අමතරව මැදවච්චිය - හොරොව්පතාන මාර්ගයේ (බී 282) මාර්ග කොටස් 02ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 මාර්තු මාසයේදී හඳුනාගත් අතර 2019 වර්ෂය අවසන් වන විට කි.මී. 10+000 – 23+000 මාර්ග කොටස සඳහා 58% ක භෞතික ප්‍රගතියක් ද කි.මී. 23+000 – 37+000 මාර්ග කොටස සඳහා 64%ක භෞතික ප්‍රගතියක් ද අත්පත් කරගෙන තිබිණි. තවද මෙම මාර්ග කොටස් 02හිම භෞතික ඉලක්කය 58% සහ 64% ලෙස සඳහන්ව තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය 100%ක් විය.

මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 54%ක් වූ අතර 2018 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 86% ක් ලෙසිනි. 2019 වර්ෂය තුලදී ව්‍යාපෘතියේ මූලික අයවැය ප්‍රමාණය රුපියල් මිලියන 1,011.5ක් දක්වා ප්‍රතිශෝධනය වූ අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් වාර්තා කරන ලද කාලය තුලදී වාර්තා කරන ලද කළවැඩ ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් මිලියන 809.0කි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ඛේදය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-30	2506 යටිතල පහසුකම් සංවර්ධනය	306.0	1,011.5	545.9
	එකතුව	**306.0**	**1,011.5**	**545.9**

2.3.8 අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණුකිරීමේ සැලසුම් ව්‍යාපෘතිය

දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතියේ අංගයක් වන අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණු කිරීමේ සැලසුම මඟින් මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීමේ සූදානම සහතික කිරීම මෙමඟින් සිදුවේ.ව්‍යාපෘති කාලය 2014 සිට 2019 දක්වා වූ කාලයයි.

ඉහත සඳහන් කාර්යයන් සිදුකිරීම සඳහා ඇ.එ.ජ.ඩො.මි. 5 ක මුදලක් ශ්‍රී ලංකා රජය වෙත අනුමතව ඇත. මෙම ව්‍යාපෘතියතුළින් දක්ෂිණ ප්‍රදේශයන්හි අධිවේගී මාර්ග ජාලය හා දේශීය මාර්ග ජාලය අතර මනා සම්බන්ධතාවයක් වර්ධනය වීම අපේක්ෂිත අතර එහි බලපෑම් ලෙස උක්ත ප්‍රදේශයන්හි කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ඇතිවීම අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

1. අධිවේගී මාර්ග ජාලයේ උපදේශනය හා සම්බන්ධිත ජාතික මාර්ග ජාලයේ ශක්‍යතා අධ්‍යනය හා විස්තරාත්මක ඉංජිනේරු නිර්මාණය සඳහා උපදේශන සේවා සැපයීම.

2. ඒකපුද්ගල උපදේශන සේවාවන්(SHETC ICS-001)ප්‍රවාහන සැලසුම්කරු(අන්තර්ජාතික)

3. ඒකපුද්ගල උපදේශන සේවාවන් (SHETC ICS-002)මහාමාර්ග ඉංජිනේරු (අන්තර්ජාතික)

4. ඒකපුද්ගල උපදේශන සේවාවන් (SHETC ICS-003)පාලම් හා නිර්මාණ ඉංජිනේරු (අන්තර්ජාතික)

5. ඒකපුද්ගල උපදේශන සේවාවන්(CEP ICS004) මහාමාර්ග ඉංජිනේරු (අන්තර්ජාතික)

6. ඒකපුද්ගල උපදේශන සේවාවන් (ICS 006)පාලම් හා නිර්මාණ ඉංජිනේරු (අන්තර්ජාතික)

7. ඒකපුද්ගල උපදේශන සේවාවන් (ICS 007) රථවාහන ගමනාගමන සැලසුම්කරණය සහ ඇස්තමේන්තු විශ්ලේෂණය
8. ඒකපුද්ගල උපදේශන සේවාවන් (ICS 008) ප්‍රවාහන සැලසුම්කරණ උපදේශනය (අන්තර්ජාතික)

ක්‍රියාකාරකම් අංක 01-05 දක්වා 2016 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදි.2018 වර්ෂය අවසානය වන විට ක්‍රියාකාරකම් අංක 07 සම්පූර්ණ කරන ලදී. ක්‍රියාකාරකම් අංක 06 හා 08, 90% ක භෞතික ප්‍රගතියකින් 2018 වර්ෂය තුල වාර්තා විය. 2019 වර්ෂයේදී ඉතිරිව තිබූ ඉහත ක්‍රියාකාරකම් 02 සිදුකෙරුණු අතර 2019 වසරේ දෙවන කාර්තුව වන විට එයද සම්පූර්ණයෙන්ම නිමාකරන ලදී.

2018 හා 2019 වර්ෂයන් සඳහා ඉහත ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 61% හා 96% විය. තවද 2019 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට මූලික අයවැය ප්‍රතිපාදනය සංශෝධනය වුවද අපේක්ෂා කල පරිදි වියදම් වාර්තා වී නොතිබුණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-42	2506 යටිතල පහසුකම් සංවර්ධනය	54.0	19.0	18.25
	එකතුව	**54.0**	**19.0**	**18.25**

2.3.9 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල)

ජාතික මහාමාර්ගයන්හි ආසන්න වශයෙන් කි.මී. 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සහ පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ මා ඔය හරහා අංක 3/2 පාලම නැවත ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වන අතර අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 40 ක ණය මුදලක් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වනුයේ මාර්ගවල ධාරිතාවය වැඩිදියුණු කිරීම තුලින් වාහනවල මෙහෙයුම් පිරිවැය අවම කිරීම හා මහජනතාවට සේවා සැපයීම තුලින් එම ප්‍රදේශ සංවර්ධනය කිරීමයි. එමඟින් රටේ සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීමද මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිතය.මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන පරිදි කොන්ත්‍රාත්තු 04 ප්‍රදානය කරනු ලැබ ඇති අතර 2015 දී සියලුම වැඩ කටයුතු අවසන් කොට ඇත.

2017 වර්ෂයේදී, ණය මුදලෙහි ඉතුරුම් භාවිතා කරමින් ඒ005 පේරාදෙණිය බදුල්ල චෙන්කලඩි මාර්ගයේ කි.මී.2.63 ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම ඇරඹුණි.2017 වර්ෂය සඳහා මෙම මාර්ග කොටසේ භෞතික ප්‍රගතිය 5% වූ අතර එය 2018 වර්ෂ අවසානයේදී 35% විය. 2018 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ ඉලක්ක සාධනය 55% ක් වූ අතර එය2017 වර්ෂයේදී අත්කරගනු ලැබුයේ ඉලක්ක සාධනයෙන් 7%ක් පමණි.

2019 වර්ෂය අවසානයේදී මෙම පැකේජය 57%ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර වර්ෂය තුලදී ළඟාකරගත් ප්‍රගතිය 22% කි. ඒ අනුව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම 40%ක් ලෙස සඳහන් කල හැක.

වගු අංක 2.3.9.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සහ පාලම්

ව්‍යාපෘති විස්තරය	දිග (කි.මී.)	2019/12/31 වන විට භෞතික ප්‍රගතිය
රක්වාන - මාඳම්පේ මාර්ග කොටස	14.0	සම්පූර්ණයෙන් නිමකොට ඇත
ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ග කොටස	17.0	
ඇතුල්කෝට්ටේ - කොහුවල මාර්ග කොටස	6 .0	
පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම නැවත ඉදිකිරීම	මීටර 120.4	
පේරාදෙණිය බදුල්ල වෙන්කලඩි මාර්ගය	2.63	57%

2019 වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය 63%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇතත්, 2018 වර්ෂය සඳහා එය තරමක අඩු ප්‍රගතියක් වාර්තා කර ඇති අතර සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව එම අගය 53%කි. මෙම මූල්‍ය ප්‍රගතිය පිරිහීම කෙරෙහි බලපෑ ප්‍රධානතම සාධකය වූයේ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනයයි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) 2019/12/31 දිනට සංශෝධිත අයවැය (රු.මි.)		වියදම්(රු.මි.)
117-02-04-31	2506 යටිතල පහසුකම් සංවර්ධනය	225.0	146.0	84.7
	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම්	25.0	25.0	23.2
	එකතුව	**250.0**	**171.0**	**107.9**

2.3.10 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මහාමාර්ග සංවර්ධනය කිරීම සඳහා අරමුදල් වශයෙන් ඇ.ඩො.මි.50 ක මුදලක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) වෙතින් ශ්‍රී ලංකා රජය වෙත ලැබී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ගජාලය වැඩිදියුණු කිරීම දැක්විය හැකිය.මේ මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයන්හි මාර්ග තදබදය අවම කිරීම තුලින් ජනතාව මාර්ගයන්හි ගතකරන කාලය අවම කොට එම කාලය ජාතික ආර්ථික වර්ධනය සඳහා දායක කර ගත හැකි වනු ඇත.

මෙහි නාවල- නුගේගොඩ මාර්ගයේ පිහිටි නාවල පාලම පුළුල් කිරීම කොන්ත්‍රාත් පැකේජ I යටතේ ක්‍රියාත්මක කළ අතර 2015 වර්ෂයේ මැයි මස වන විට එහි වැඩකටයුතු අවසන් කොට ඇත.

පහත වගුවේ අංක 01 සිට 05 දක්වා සඳහන් මාර්ගවල සංවර්ධන කටයුතු 2016 වර්ෂයේදි නිම කරන ලදි. කොන්ත්‍රාත් පැකේජ අංක 08, 10 හා 11 හි අදියර II හි, අංක 12 සහ 13 මාර්ගයන්හි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2018 වර්ෂයේදී මෙන්ම 2019 වර්ෂයේදීද සිදුකෙරෙමින් පැවතිණි. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ සිවිල් වැඩ නියමිත පරිදි ආරම්භ කිරීමට ද නොහැකි විය.

වගු අංක 2.3.10.1 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරාගන්නා ලද මාර්ග

අයිතම අංකය	මාර්ගයේ නම	දුර (කි.මී)
01	ශ්‍රී ජයවර්ධනපුර රෝහල සඳහා ප්‍රවේශ මාර්ගය	1.4
02	දෙමටගොඩ-වැල්ලම්පිටිය මාර්ගය	1.9
03	වැලිකඩ-කොහිලවත්ත මාර්ගය	6.0
04	කොළොන්නාව- යක්බැද්ද මාර්ගය	2.4
05	මට්ටක්කුලිය මැද මාර්ගය	1.0
06	කොට්ටාව-තලගල මාර්ගය	14.4
07	කොට්ටේ-බෝපේ මාර්ගය	11.3
08	මොරටුව-පිළියන්දල මාර්ගය	2.62
09	නාවින්න-බොරලැස්ගමුව මාර්ගය	2.41
10	පිළියන්දල-මහරගම මාර්ගය	5.38
11	ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය	7.7
12	වල්ගම-දියගම මාර්ගය	7.06
13	පැලවත්ත ප්‍රවේශ මාර්ගය	0.83


මෙහි සඳහන් අයිතම අංක 09 ප්‍රතිසංස්කරණ කටයුතුඑම මාර්ගයෙහි තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී.

2018 වර්ෂයේදී ප්‍රතිසංස්කරණ කටයුතු අරඹන ලද ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පළමු අදියර සඳහා 23% ක භෞතික ප්‍රගතියක් එම වසරෙහි සිවිවන කාර්තුව අවසානය වන විට වාර්තා කොට තිබුණි.

2019 වර්ෂය අවසන් වන විට එම අදියර 29%ක සමස්ත ප්‍රගතියක් අත්කරගෙන තිබිණි. නමුත් එය සැලසුම් කළ පරිදි එහි ඉලක්ක සම්පූර්ණ කර නොතිබුණු අතර ඊට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනය පසුබෑමකට ලක්වීමයි.


ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ (අදියර II) කි.මී. 0+000 – 2+300 සහ 4+200 – 5+440 වැඩිදියුණු කිරීම 2019 ඔක්තොම්බර් මාසයේදී ආරම්භ කළ අතර වර්ෂය අවසන් වන විට එය 0.2% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි.

මෙම අඩු ප්‍රගතිය කෙරෙහි බලපෑ ප්‍රධානතම හේතුව වූයේ උපයෝගීතා භූවමාරුව සහ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය තුල ඇතිවූ ගැටළු සහගත තත්ත්වයයි.



රූපසටහන 2.3.10.1 කොට්ටාව - තලගල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ සමස්ත ප්‍රගතිය

එසේම අයිතම අංක 06 සඳහා 2019 සහ 2018 වර්ෂයන්හි පිළිවෙලින් 55% හා 26%ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.



රූපසටහන 2.3.10.2 කෝට්ටේ - බෝපේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ සමස්ත ප්‍රගතිය

අයිතම අංක 07හි (කෝට්ටේ - බෝපේ මාර්ගය) ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2019/12/31 දිනට 71%ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන

ඇති අතර 2018 වර්ෂය අවසානයේදී එම අගය වාර්තාවූයේ 46%ක් ලෙසිනි.

2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව 2018 සහ 2019 වසරවල ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ සාරාංශය පහත පරිදි වේ.



2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-32	2506 යටිතල පහසුකම් සංවර්ධනය	950.0	850.0	330.1
	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම්	400.0	950.0	807.5
	එකතුව	**1,350.0**	**1,750.0**	**1,137.6**

මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී 65%ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර 2018 වර්ෂයේදී අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 87%කි.

2.3.11 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර I

චීන සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300 ක මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇත. ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය-IIIයටතේ ක්‍රියාත්මක වන පළමු අදියරේදී කොන්ත්‍රාත් පැකේජ 12 ක් යටතේ මාර්ග දුර කි.මී.248.96 ක සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ.මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දක්වනු ලබන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි.

2018 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය වන විට 2019 දී නිම වූ කොන්ත්‍රාත් පැකේජ 13 හැර අනෙකුත් සියළුම පැකේජයන් සම්පූර්ණ කරන ලදී. ඒ අනුව 2018 දී ව්‍යාපෘතියේ මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි සමස්ත ප්‍රගතිය 99% ක් වූ අතර ණය මුදලේ ඉතුරුම් යොදාගනිමින් මාර්ග කිහිපයක් වැඩිදියුණු කිරීමට තෝරා ගනු ලැබුණි. (වගු අංක 2.3.11.1) 2018 වර්ෂය තුලදී එසේ තෝරාගත් මාර්ග 03ක් 2019 වර්ෂය තුලදී සම්පූර්ණයෙන්ම නිමාවට පත්කෙරුණු අතර කොන්ත්‍රාත් පැකේජ 08 යටතේ මාර්ග කි.මී. 16.6ක වැඩිදියුණු කිරීමේ කටයුතු සියල්ල 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිමා කිරීමට හැකිවිය.

වගුඅංක 2.3.11.1 මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් භාවිතා කරමින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග

මාර්ගයේ නම/පාලමේ අංකය
ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර I හි ඉතුරුම් භාවිතා කරමින් බිංගිරිය ප්‍ර දේශයේ මාර්ග කොටස් 04 ක් ඉදිකිරීම (කි.මී. 16.60)
කොපැ 04 ඉතුරුම් භාවිතා කරමින් ,VO-17 බලගොල්ල පුම්මා පල්ලිය වටරවුම් මාර්ගය (කි.මී. 4.6)
කොපැ 10 ඉතුරුම් භාවිතා කරමින්, VO - 8 මීනිගමුව - සිවුරුපිටිය මාර්ගය (කි.මී. 5.5)
කොපැ 7 , ඉතුරුම් භාවිතා කරමින්VO - 09 ගඩලාදෙණිය - පරනපටටිය මාර්ගය (කි.මී. 3.5)

2019 වර්ෂයේදී ණය මුදලේ ඉතුරුම් යොදාගනිමින් තවත් මාර්ග 07ක් වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගනු ලැබූ අතර 2019 වසර අවසානයේදී අත්කරගනු ලැබූ භෞතික ප්‍රගතීන් ද සහිතව පහතින් දක්වා ඇත.

වගුඅංක 2.3.11.2 - මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් යොදා ගනිමින් 2019 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍යයැයි හඳුනාගත් මාර්ග

මාර්ගයේ නම	2019/12/31 දිනට භෞතික ප්‍රගතිය
අනවරාම - කොණ්ඩදෙණිය-වෑගංතලේ මාර්ගය	98%
පරගම්මන - දික්කැල්ල - අතුගොඩ - වදුරදෙනිය මාර්ගය	55%
මීදෙණිය - හපුවිට මාර්ගය	55%
අලවතුර - යටපන මාර්ගය	22%
නෙළුම්දෙනිය - අලව්ව මාර්ගය	15%
ගනේතැන්න - මහන්තේගම - කෝවිල්කන්ද මාර්ගය	98%
නදුවත්ත - පුරන්පොත්ත මාර්ගය	21%

එසේ හඳුනාගත් මාර්ග 07 අතරින් මාර්ග 03ක් 100% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන තිබූ අතර නදුවත්ත - පුරන්පොත්ත මාර්ගය හැර සෙසු සියලු මාර්ග කොටස්හි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 50%කට වඩා වැඩි සාධනයක් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව වසර අවසානයේදී අත්කරගෙන ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික ප්‍රතිපාදනය - 2019 (රු.මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය(රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-39	2506 යටිතල පහසුකම් සංවර්ධනය	2,000.0	4,969.0	2,528.4
	එකතුව	**2,000.0**	**4,969.0**	**2,528.4**

උක්ත ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී 99%ක් වූ මූල්‍ය ප්‍රගතියක් වාර්තා වාර්තා කල අතර එය 2019 වර්ෂයේදී 51%ක් විය. එමෙන්ම සම්පූර්ණ කරන ලද මාර්ගයන්හි වටිනාකම රුපියල් මිලියන 4,000 පමණ වූ අතර එම මුදල ව්‍යාපෘතියේ වියදම සඳහා එකතු කර නොතිබිණි.

2.3.12 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව)

අධිවේගී මාර්ගජාලය හා සම්බන්ධිත ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 70 ක ණය අරමුදල් මෙම ව්‍යාපෘතියට සපයා ඇත. මෙම ව්‍යාපෘතියෙහිප්‍රධාන නිමැවුම් වන්නේ දකුණු කලාපයේ අධිවේගී මාර්ග හා සම්බන්ධිත ප්‍රධාන ජාතික මාර්ග කි.මී. 31.2 ක ප්‍රමාණයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම හා අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණු කිරීම සැලසුම් කිරීමේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාවය වර්ධනය කිරීම ය.

මෙයට අමතරව ජාතික මහමාර්ග වැඩිදියුණු කිරීම යටතේ දකුණු අධිවේගී මාර්ගයෙහි අන්තර් හුවමාරු ස්ථාන 3 ක් හා සම්බන්ධිත ප්‍රමුඛ ජාතික මහා මාර්ගයන් 5 ක කොටස් 6 ක් වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කොට ඇත. මෙම ප්‍රමුඛ ජාතික මහා මාර්ගයන් තෝරා ගන්නා ලද්දේ වර්තමාන මාර්ග තත්වය සහ මාර්ග ධාරිතාවය , ප්‍රවාහනය සඳහා පවතින ඉල්ලුම, සහ වැඩි දියුණු කිරීම සඳහා වන සූදානම යන කරුණු මත වේ.

රත්මලාන - මිරිහාන හා මොරටුව - පිළියන්දල (කොන්ත්‍රාත් පැකේජ 1) යන මාර්ගයන් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම 2015 අප්‍රේල්මාසයේදී ආරම්භ කරන ලද අතර 2017 වර්ෂයේදී අවසන් කරන ලදී.

කැස්බෑව - පොකුණුවිට හා කිරුළපන - ගොඩගම (කොන්ත්‍රෙත් පැකේජ II) යන මාර්ගයන් මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය - මාදුරුගොඩ (කොන්ත්‍රාත් පැකේජ III)දක්වා වූ මාර්ග කොටස ප්‍රතිසංස්කරණය2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර කොන්ත්‍රෙත් පැකේජ II සඳහා 80% ක සමස්ත භෞතික ප්‍රගතියක් ද, කොන්ත්‍රෙත් පැකේජ III සඳහා 100% ක

භෞතික ප්‍රගතියක් ද 2018 වර්ෂාවසානය වන විට වාර්තා කොට තිබුණි.

2019 වර්ෂය අවසන් වන විට ඉහත සඳහන් කලපැකේජ අංකII සඳහා 97%ක භෞතික ප්‍රගතියක් ළඟාකරගෙනතිබූ අකර එහි භෞතික ඉලක්ක සපුරාගැනීම 85%කි. කොන්ත්‍රාත් පැකේජ IV යටතේ ක්‍රියාත්මක වන අඹතලේ සිට සිනෙක් මංසන්ධිය දක්වා වූ මාර්ග කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2017 ජූලි මාසයේදී ආරම්භ කෙරුණු අතර 2018 සහ 2019 වසරවලදී එය අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය පිළිවෙලින් 66% සහ 98% ක් ලෙස සඳහන් කලහැක.

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරා ගෙන ඇති මාර්ග ව්‍යාපෘති පිළිබඳ තොරතුරු වගු අංක 2.3.12.1 යටතේ දැක්වේ.

වගු අංක 2.3.12.1 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරනු ලබන මාර්ග

කොන්ත්‍රාත් පැකේජය	ව්‍යාපෘතියේ විස්තරය	දුර (කි.මී)
CP 01	රත්මලාන-මිරිහාන දක්වා වන බී 389 මාර්ගයේ කි.මී.5+700 සිට කි.මී.7+840 දක්වා	2.14
	මොරටුව සිට පිළියන්දල දක්වා වන බී 295 මාර්ගයේ කි.මී.2+620 සිට කි.මී.5+120 දක්වා	2.55
CP 02	කැස්බෑව සිට පොකුණුවිට දක්වා වන බී 084 මාර්ගයේ කි.මී.13+800- කි.මී.28+180 දක්වා	14.40
	කිරුලපන- ගොඩගම දක්වා වන ඒ 004 මාර්ගයේ කි.මී.0+130-1+000 හා කි.මී.15+360- කි.මී.16+280 වන කොටස්	1.79
CP 03	දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට මතුගම දක්වා වන බී 157 මාර්ගයේ කි.මී.42+372- කි.මී.30+000 දක්වා	10.37
CP 04	කොළඹ ජාත්‍යන්තරනාවුක හා ඉංජිනේරු විද්‍යාලය (CINEC)අසල සිට අඹතලේ මංසන්ධියදක්වා	1.88

2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂයේදී කොන්ත්‍රාත් පැකේජ 02 සඳහා 100%කට වඩා වැඩි ඉලක්ක ප්‍රමාණයක් සාක්ෂාත් කරගෙන ඇති අතර කොන්ත්‍රාත් පැකේජ 03 සඳහා ද ඉලක්ක අත්පත් කර ගැනීම එලෙසින් ම සිදු විය. එමෙන්ම කොන්ත්‍රාත් පැකේජ 04 සඳහා ඉලක්කගත ප්‍රගතිය 95% ක් වුවද අත්පත් කරගත් ප්‍රගතිය 66% කි. ඒ අනුව භෝතික ඉලක්ක අත්පත් කර ගැනීමේ කාර්යසාධනය 70% පමණ විය

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වියය/ වැය අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපදානය- 2019(රු.මි)	ප්‍රතිශෝධිත අයවැය(රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-43	2506 යටිතල පහසුකම් සංවර්ධනය	1,420.0	1,753.0	1,058.6
	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්	300.0	350.0	350.0
	එකතුව	**1,720.0**	**2,103.0**	**1,408.6**

2018 හා 2019 වර්ෂයන් සඳහා වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 87% හා 67% විය.වාර්තාකරන කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මඟින් වාර්තා කරන ලද බිල්පත් වටිනාකම රුපියල් මිලියන 1,900 කි.

2.3.13 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I

ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධනවැඩසටහන තුළින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීමේ අරමුණින් දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරුමැද, වයඹ සහ බස්නාහිර යන පළාත් 6 ක තෝරාගත් ග්‍රාමීයපළාත් හා ජාතික මාර්ග වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලැබේ. තෝරා ගනුලැබූ උක්ත මාර්ගයන්හි ප්‍රවාහන කාර්යක්ෂමතාවය ඉහළයාම මෙම ව්‍යාපෘතිය

මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය වන අතර ඒ තුළින් ප්‍රදේශ අතර පවතින සම්බන්ධතා පුළුල් වීම සඳහා දීර්ඝකාලීනව බලපානු ඇත.

ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මාර්ගෝපදේශනය සහ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලව පිළිවෙලින් වසර පහක සහ හතක කාලයක් පුරා පළාත් පාලන ආයතන වලට අයත් (පළාත් සභා හා ප්‍රාදේශීය සභා) ග්‍රාමීය මාර්ග කි.මී. 3131 ක් සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ජාතික මාර්ග කි.මී. 265 ක් පමණ නිර්මාණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කටයුතු මෙන්ම ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු ද සිදුකිරීමට අදහස් කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික මාර්ග හා පළාත් මාර්ග දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 800ක් ලබාදීමට එකඟ වී ඇති අතර ශ්‍රී ලංකා රජය විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 106 ක් මූල්‍යනය කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය 2015 මැයි මස ආරම්භ කළ අතර 2024 දී නිම කිරීමට අපේක්ෂිතය. නමුත්, ග්‍රාමීය මාර්ගයන්හි සිවිල් වැඩ කටයුතු 2019වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිත වන අතරකාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කටයුතු ඉතිරි වර්ෂ තුන තුල සිදු කිරීමට නියමිතය.ජාතික මාර්ගයන්හි මාර්ග කළමණාකරණ ක්‍රියාවලිය 2024 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.3.13.1 2019 වර්ෂයේ ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් මාර්ග

පළාත	දිස්ත්‍රික්කය	මාර්ග ගණන	දුර (කි.මී)
දකුණ	ගාල්ල	66	197
	මාතර	67	218
	හම්බන්තොට	51	167
සබරගමුව	රත්නපුර	38	255
	කෑගල්ල	63	217
උතුරු මැද	අනුරාධපුර	60	330
	පොළොන්නරුව	55	170
මධ්‍යම	නුවර	50	221
	මාතලේ	51	194
	නුවරඑළිය	43	180
වයඹ	පුත්තලම	38	220
	කුරුණෑගල	76	485
බස්නාහිර	කළුතර	83	276
එකතුව		**741**	**3,131**

2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය 82% ක් වන අතර 2019 වර්ෂය අවසානයේදී එම අගය 88% ක් දක්වා වර්ධනය විය.

2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එම වර්ෂයේදී උක්ත ව්‍යාපෘතියේ සමස්ත භෞතික ඉලක්කය 28% වූ අතර මෙම ප්‍රතිඵලය ආසන්න 75%ට ආසන්න ලෙස අත්පත්කරගැනීමට (71%) හැකියාව ලැබී ඇත.

2019 වර්ෂය අවසානයේදී අත්කරගත් භෞතික ප්‍රගතිය පලාත් වශයෙන් පහත පරිදි දැක්විය හැක.

වගු අංක 2.3.13.2 එක් එක් මාර්ග පැකේජයන්හි පලාත්බද භෞතික ප්‍රගතිය

පළාත	2018.12.31 වන විට භෞතික ප්‍රගතිය	2019.12.31 වන විට භෞතික ප්‍රගතිය
දකුණු පළාත	96%	98%
බස්නාහිර පළාත	91%	95%
සබරගමුව පළාත	69%	78%
උතුරු මැද පළාත	97%	100%
වයඹ පළාත	59%	67%
කළුතර දිස්ත්‍රික්කය (බස්නාහිර පළාත)	46%	62%

එමෙන්ම, 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය 6% ක ප්‍රගතියක් වර්ෂය තුලදී අත්පත්කරගෙන ඇති අතර 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමේ අගය 55% කි.

වගු අංක 2.3.13.3ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් ජාතික මාර්ග

අනු අං.	මාර්ගය.	දුර (කි.මී) (කි.මී)	ආවරණය වන දිස්ත්‍රික්කය	ප්‍රගතිය
01	මරදන්කඩවල-හබරන- (ඒ 011)	25.0	පොළොන්නරුව අනුරාධපුරය	17.9%
02	කොළඹ - නුවර මාර්ගය (අඹේපුස්ස - කඩුගන්නාව අදියර)	40.0	කෑගල්ල, මහනුවර	මේ වන තෙක් කොන්ත්‍රාත් ප්‍රදානය කර නොමැත.
03	පැල්මඩුල්ල-ඇඹිලිපිටිය-පදනංගල මාර්ගය (ඒ 018)	66.0	රත්නපුර, හම්බන්තොට	නිර්මාණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කොට ඇත.
04	කරාපිටිය - නාගොඩ මාර්ගය (බී 248,බී 454) උඩුගම බාර් හන්දිය - තවලම මාර්ගය (බී 129, බී 429, බී 156)	51.7	ගාල්ල	1%
05	මහනුවර - යාපනය මාර්ගය (අඹේපුස්ස - කඩුගන්නාව මාර්ග කොටස	40.0	කෑගල්ල , මහනුවර	මූලික මිණුම් කටයුතු හා නිර්මාණ ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී.
	එකතුව	**272.7**		

2.3.14දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I Road 2)

මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශයන්හි මාර්ග ජාලයෙහි ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම තුලින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීම අපේක්ෂා කෙරේ. ග්‍රාමීය මාර්ග කි.මී. 3,404 ක ප්‍රමාණයක් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සහ උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර යන පළාත් වලට අයත් කි.මී. 343 ක ජාතික මහාමාර්ගයන් ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සහ ආරක්ෂණ විධි, මාර්ග ආරක්ෂාව, නඩත්තුව, පර්යේෂණ ධාරිතාවය සහ මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම යනාදිය සම්බන්ධයෙන් මාර්ග හා සම්බන්ධිත ආයතනයන්හි ධාරිතා වර්ධනය මේ යටතේ සිදු කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘති කාලසීමාව 2018 - 2027 **වේ.** ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඒ ඒ කොන්ත්‍රාත්තුවේ මුල් වර්ෂ දෙක අවසාන වන විට සම්පූර්ණ කිරීමට නියමිත අතර සහ ඉන්පසුව පිළිවෙලින් ග්‍රාමීය හා ජාතික මහාමාර්ගයන් හි වර්ෂ 3 සහ 5 ක කාලයක් කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කිරීමේ කාල පරිච්ඡේදය ලෙස පවතී.

වගු අංක 2.3.14.1.- දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග

පළාත	දිස්ත්‍රික්කය	ජාතික මාර්ග(කි.මී.)	ජාතික මාර්ග ගණන	ග්‍රාමීය මාර්ග (කි.මී.)	ග්‍රාමීය මාර්ග ගණන	මාර්ග ගණන (එකතුව)	මුළු දුර (කි.මී.)
උතුරු පළාත	යාපනය	114.89	1	260.24	127	128	1057.77
	කිලිනොච්චිය		-	181.78	47	47	
	මන්නාරම		1	137.74	67	68	
	වවුනියාව		2	221.78	62	64	
	මුලතිව්		-	141.34	36	36	
නැගෙනහිර	මඩකලපුව	155.76	1	184.99	123	124	845.83
	අම්පාර		14	319.45	144	158	

පළාත	දිස්ත්‍රික්කය	ජාතික මාර්ග(කි.මී.)	ජාතික මාර්ග ගණන	ග්‍රාමීය මාර්ග (කි.මී.)	ග්‍රාමීය මාර්ග ගණන	මාර්ග ගණන (එකතුව)	මුලු දුර (කි.මී.)
	තිකුණාමලය		1	185.63	123	124	
ඌව	බදුල්ල	72.9	6	494.53	147	153	1044.51
	මොනරාගල		1	477.08	95	96	
බස්නාහිර	කොළඹ	-	-	247.21	149	149	799.98
	ගම්පහ			307.37	183	183	
	කලුතර			245.4	102	102	
එකතුව		**343.55**	**27**	**3,404.54**	**1405**	**1432**	**3,748.09**

මෙමව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින්, ණය ගිවිසුම 2017 වසරේ දී අත්සන් කළ අතර ඌව පළාත සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් කැඳවා ඇත.

2019 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘති ප්‍රගතිය පහත පරිදි වේ.

- ඌව පළාතේ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය 2018 වර්ෂයේදී සිදු කරනු ලැබූ අතර 2019 වර්ෂය අවසානයේදී එහි භෞතික ප්‍රගතිය 39% කි.
- නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණයෙහි සිවිල් වැඩ සඳහා වූ කොන්ත්‍රාත් ප්‍රදානය 2019 වර්ෂයේදී සිදු කරන ලදී.
- උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වූ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතී.
- බස්නාහිර පළාතේ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි මාසය වන විට ප්‍රදානය කිරීමට නියමිතය.

2018 වර්ෂයේදී එය 84% වූ අතර එම අගය පෙර වර්ෂ 02 ට වඩා අඩු අගයක පැවතිණි. 2019 දී 75%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වූ අතර එය 2018 වඩා 9% ක බැස්මක් පෙන්වීය. එනමුත් ව්‍යාපෘති කළමනාකරණ අංශය මගින් 99%ක මූල්‍ය කාර්යසාධනයක් පෙන්වීය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම(රු.මි.)
117-02-04-44	2506 යටිතල පහසුකම් සංවර්ධනය	15,400.0	19,344.8	11,514.5
	එකතුව	15,400.0	19,344.8	11,514.5

2.3.15 රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

දේශීය වාණිජ බැංකු මගින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්කළමණාකරණය සඳහා මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදී.මාර්ග සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ උපදෙස් මත සිදුකෙරෙන ඉහත මාර්ග ව්‍යාපෘතිය සඳහාමේ වසරේදී දේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා කොන්ත්‍රාත්තු 64ක් ප්‍රදානය කර ඇත.ඒ අතුරින් මාර්ග ව්‍යාපෘති 62 ක ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් අවසන් කර ඇත.2019 වසර අවසාන විට ව්‍යාපෘති 02 හි ප්‍රගතිය පහත දැක්වේ.

වගු අංක 2.3.15.1 ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග කොටස්හි ප්‍රගතිය

අයිතම අංකය	මාර්ගයේ නම	මාර්ග දුර (කි.මී)	දිස්ත්‍රික්කය/ ප්‍රදේශය	2019/12/31 ට භෞතික ප්‍රගතිය
01	කොළඹ-මහනුවර මාර්ගය (-කඩවත - නිට්ටඹුව මාර්ගය)	23.00	ගම්පහ	100%
02	ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගය	13.82	මොණරාගල	100%
03	නිට්ටඹුව - පස්යාල මාර්ගය	4.0	ගම්පහ	1%

මීට අමතරව, උක්ත සඳහන් අයිතම අංක 03 ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගත් තවත් පැකේජයන් වන අතර 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම ඇරඹූ මෙය වර්ෂ අවසානයේදී 1% ක භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබුණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	මූලික අයවැය ප්‍රතිපාදනය	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම(රු.මි.)
117-02-04-51	2506 යටිතල පහසුකම් සංවර්ධනය	43,700.0	39,672.0	39,671.3
	එකතුව	**43,700.0**	**40,102.0**	**39,671.3**

උක්ත ව්‍යාපෘතියේ 2018 හා 2019 යනදෙකෙහිදීම වාර්තා වූයේ 99% ක් ලෙසිනි. ඒ අනුව ව්‍යාපෘතියෙහි මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කරගැනීම වඩාත් ප්‍රශස්ත මට්ටමක පැවතුණු බව දක්නට ලැබේ.

2.3.16 ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය

2018.08.15 දිනැති 18/1682/805/051 කැබිනට් තීරණයට අනුව 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර මෙම ව්‍යාපෘතියෙහි ණය ගිවිසුම 2017 සැප්තැම්බර් මස 29 වන දින අත්සන් කරන ලදී. ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුවහගත කිරීමෙන් පසු මාර්ග සංවර්ධන අධිකාරියෙහි විෂය පථය "ආයතනික ශක්තිමත් කිරීම සහ වත්කම් කළමණාකරණය සඳහා ධාරිතා වර්ධනය සඳහා සීමා වී ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මාර්ග වත්කම් කළමණාකරණ පද්ධති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ;

- මාර්ග නඩත්තු වියදම් සහ මාර්ග භාවිතා කරන්නන්ගේ පිරිවැය අවම කිරීමෙන් උපරිම ආර්ථික ප්‍රතිලාභයක් අත්කරගැනීම.
- ජීවන චක්‍ර පිරිවැය අඩුකිරීම සඳහා මැදිහත්වීමේ වේලාව සහ පිරිවැය තීරණය කිරීම.

- සම්පූර්ණ කරන ලද කාර්යයන්හි කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.

2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

1. මාර්ග සංවර්ධන අධිකාරිය තුල මාර්ග වත්කම් කළමණාකරණ පද්ධතියක් සහ ඒකකයක් ක්‍රියාත්මක කිරීම.
2. ධාරිතා වර්ධනය, පුහුණුව හා උපදේශනය
3. උපකරණ මිලදී ගැනීම

මේ අනුව 01 වන ක්‍රියාකාරකම මඟින් ඉලක්කගත ජයග්‍රහණයෙන් 25% ක් අත්පත් කරගෙන ඇති අතර එය සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වූ 8%ට සාපේක්ෂව 2% ක ප්‍රගතියක් පිළිඹිබු කරයි. තවද 02 වන ක්‍රියාකාරකම සඳහා ඉලක්කගත සාධනය 100% ට වඩා වැඩි භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ගිණුම්කරණ වර්ෂය සඳහා ඉලක්කගත ප්‍රමාණය 10% ට සමාන වේ.

උපකරණ මිලදී ගැනීම යටතේ ලේඛන සැකසීමේ කටයුතු සිදු කරන අතර , පිරිවිතරයන් සකස් කිරීම, ලේඛණ සකස් කිරීම සහ සකස් කරන ලද ලේඛණ තාක්ෂණික ඇගැයීම් කමිටුවෙහි අනුමැතිය සඳහා යොමු කිරීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

2018 වර්ෂයේදී ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගතව තිබූ ඇතැම් ක්‍රියාකාරකම් 2018 වර්ෂය තුලදී ක්‍රියාත්මක නොවිණි. එම නිසා 2018 ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව ඉලක්ක සාධනය කරගැනීමෙහි ප්‍රගතිය අපේක්ෂිත අගයට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

2019 වර්ෂයේදී වත්කම් කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා වූ උපදේශන සේවා හැරුණු විට සැලසුම් කළ සියළුම අයිතම ක්‍රියාත්මක කරන ලද අතර ඉන් ලබාගත් ප්‍රගතිය ඉහත විස්තර කර ඇත.

මෙම ව්‍යාපෘතියෙහි බොහෝ ක්‍රියාකාරකම් 2019 වර්ෂයේදී ආරම්භ කළ බැවින් ලබා ඇති ප්‍රගතිය පෙර වර්ෂය හා සැසඳිය නොහැක.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු.මි)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-48	2506 යටිතල පහසුකම් සංවර්ධනය	376.00	71.00	70.5
	එකතුව	**376.00**	**71.00**	**70.5**

2019 වර්ෂයේදී ව්‍යාපෘතිය අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 99% ක් වූ අතර 2018 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 34% ක් ලෙසිණි. ඒ අනුව, 2019 වර්ෂයේදී මූල්‍ය ඉලක්ක සාධනය කරගැනීම අතිවිශිෂ්ඨ මට්ටමක වූ බව සඳහන් කළ හැකිය.

2.3.17 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර II (PRP3- අදියර II)

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන නගර යාකරන මාර්ග වැඩිදියුණුකිරීම සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ලබාදී ඇත.මෙහි ව්‍යාපෘති කාලය මාස 18 වන අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.16,000 කි.මෙම ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කිරීම සඳහා මුළු දුර කි.මී.131.85 ක් වන පරිදි මාර්ග 20 ක් හඳුනා ගනු ලැබූ අතර මේ අතුරින් මාර්ග පැකේජ 13 ක් මහනුවර දිස්ත්‍රික්කය තුල ද ඉතිරි මාර්ග පැකේජ 07 කෑගල්ල දිස්ත්‍රික්කය තුල ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

2016 වර්ෂය තුල තෝරාගත් සියලුම මාර්ග (20) සඳහා වූ සිවිල් වැඩ ආරම්භ කළ අතර කොන්ත්‍රාත් පැකේජ අංක 34 හි එක් මාර්ග කොටසක පමණක් සිවිල් වැඩ 2017 වර්ෂයේ දී ආරම්භ විය.

2018 වර්ෂයේ දී සියළු මාර්ග පැකේජයන්හි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වූ අතර 2018 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමේ දී 100% ක භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතියක් වාර්තා විය.

ඉහත ප්‍රතිසංස්කරණ කටයුතු සහ වැඩිදියුණු කිරීම් කටයුතු නිම කරන ලද මාර්ග 20ට අමතර ව පැකේජ අංක 24 සහ පැකේජ අංක 28 හි ඉතුරුම් උපයෝගී කර ගනිමින් නව පැකේජ 2ක ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් කටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ වූ අතර එම මාර්ග පැකේජයන් ඉදිකිරීම් 2019 වර්ෂයේදී නිම කරන ලදී.

වගු අංක 2.3.17.1 2018 වර්ෂය තුල ආරම්භ කරන ලද මාර්ග පැකේජයන්

මාර්ගය	දුර ප්‍රමාණය (කි.මී.)	පිහිටි දිස්ත්‍රික්කය	31/12/2018 වන විය අත්කර ගත් භෞතික ප්‍රගතිය	31/12/2019 වන විය අත්කර ගත් භෞතික ප්‍රගතිය
හීදෙණිය -මැදවල මාර්ගය (සි 24 වි o)	3.3	මහනුවර	57%	සම්පූර්ණ කිරීමට ඇති
පුස්සැල්ලාගම – උල්පොත මාර්ගය (සි 28 වි o)	2.9	මහනුවර	65%	

2019 වර්ෂයේදී ඉහත කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් උපයෝගී කරගනිමින් කෑගල්ල දිස්ත්‍රික්කය තුල තවත් මාර්ග කොටස් 04 ක් ඉදිකිරීම සඳහා හඳුනාගන්නා ලදී. 2019/12/31 දිනට එම කොන්ත්‍රාත් පැකේජයන් මඟින් අත්පත් කරගත් භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 2.3.17.2 – 2019 වර්ෂය තුල ආරම්භ කරන ලද මාර්ග පැකේජයන්

මාර්ග කොටස/ වැඩිදියුණු කිරීම	මාර්ග දුර (කි.මී.)	2019/12/31 වන විට භෞතික ප්‍රගතිය
දෙබත්ගම – කළුගල මාර්ගය (සි 38 වි.ඕ.)	5.0	70%
කනත්තොට – ඉහලගම මාර්ගය (සි39 වි.ඕ.)	2.1	94%
බුලත්කොහුපිටිය නගර සංවර්ධනය (සි 40 වි. ඕ.)	1.5	12%
මාවනැල්ල නගර සංවර්ධනය	2.0	10%

මේ අතුරින් කනත්තොට - ඉහළගම මාර්ගය 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව 100% ඉක්මවා ගිය භෞතික ඉලක්කයක් සාක්ෂාත් කරගෙන ඇති අතර දෙබත්ගම - කළුගල මාර්ගය 79% ක භෞතික ඉලක්කයක් අත්පත් කරගෙන ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-46	2506 යටිතල පහසුකම් සංවර්ධනය	1,300.0	4,167.5	3,027.1
	එකතුව	**1,300.0**	**4,167.5**	**3,027.1**

මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී 73% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇති අතර 2018 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 82% ක් ලෙසිණි. ඒ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය අඩු අගයක් ගෙන ඇති බව පෙනී යයි.

2.3.18 බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය- අදියර III

බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ මූලික සැලසුම් වූයේ කිරුළපන හන්දියේ සිට මැලිබන් හන්දිය දක්වා වූ මාර්ගය දීර්ඝ කිරීමයි. නමුත් එම සැලසුම් කැබිනට් පත්‍රිකාවක් මඟින් දුටුගැමුණු වීදිය දක්වා සීමාවිය. ඒ අනුව ව්‍යාපෘතියේ මුළු දුර කි.මී.0.86 කි. යෝජිත මාර්ගය මංතීරු 3කින් යුක්ත ද්විත්ව මහාමාර්ගයක් ලෙස ඉදිකිරීමට නියමිත අතර මෙම මාර්ගයට ඉහළින් කිරුළපන මංසන්ධියේ දී ගුවන් මාර්ගයක් ද මාර්ගයට පහළින් බලපොකුණ මාර්ගය වෙත ප්‍රවේශ විය හැකි පරිදි උමං මාර්ගයක් ද ඉදිකිරීමට සැලසුම් කර

ඇත. මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2016.12.07 දින ලබා දුන් අධිකරණ නියෝගයක් හේතුවෙන් තාවකාලිකව නවතා දැමීමට සිදු වූ අතර 2018.05.23 වන දින එහි කටයුතු නැවතත් ආරම්භ කිරීම සඳහා අධිකරණ අනුමැතිය ලැබුණි.

මේ අනුව කිරුළපන හන්දියේ සිට දුටුගැමුණු වීදිය දක්වා වූ මාර්ග කොටසෙ හි ඉඩම් අත්පත්කරගැනීමේ කටයුතු නැවතත්ආරම්භ වූ අතර 50% ක භෞතික ප්‍රගතියක් සහිතව සිදු කෙරෙමින් පවතී. 2018 හා 2019 වසර දෙක සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් අත්කරගත් ප්‍රගතිය පිළිවෙලින් 14% හා 31% වේ.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	අයිතම විෂය/ වැය ඒකාබද්ධය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-10	2105 ඉඩම්හාඉඩම්වැඩිදියුණුකිරීම්	192.0	418.4	220.5
	2506 යටිතල පහසුකම්	30.0	10.0	9.9
	එකතුව	222.0	428.4	230.4

2019 වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 54% වන අතර 2018 වසරේදී එම අගය වාර්තා වූයේ 1% ලෙසිණි. ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම මෙම මූල්‍ය ප්‍රගතියේ වෙනස කෙරෙහි බලපා ඇති ප්‍රධානතම සාධකය වේ. මේ හා සම්බන්ධ උසාවි නියෝගය 2018 වර්ෂයේ මැදභාගයේදී ලබා දුන් බැවින් ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු එම කාලයේදී ආරම්භ කළ අතර ඒ හේතුවෙන් 2018 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා ඉතා අඩු මූල්‍ය ප්‍රගතියකට එම කරුණ මහ පාදා ඇත.

2.3.19 බස්නාහිරපළාත්ජාතිකමාර්ගවැඩිදියුණු කිරීමේව්‍යාපෘතිය

බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල තෝරාගත් මාර්ග කිහිපයක් වැඩිදියුණු කිරීම සඳහා ඔපෙක් සංවර්ධනය සඳහා වූ අරමුදල මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන17.00 ක ණය මුදලක් ලබා දී ඇත. ඒ අනුව ජාතික මාර්ග කි.මී.25.81 ක් ප්‍රතිසංස්කරණය කර වැඩිදියුණු කර සංවර්ධනය කරනු ලබයි.

බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් මාර්ග කොටස් 04 පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සුදුසු යැයි තෝරා ගන්නා ලදී.

වගුඅංක2.3.19.1බස්නාහිරපළාත්ජාතිකමාර්ගවැඩිදියුණුකිරීමේව්‍යාපෘතියයටතේ තෝරාගත්මාර්ග

අනු අංකය	මාර්ගකොටස	දුර (කි.මී)	භෞතික ප්‍රගතිය
01	කඩුවෙල-අතුරුගිරියමාර්ගය (කි.මී. 0+000–9+500)	9.50	සිවිල්වැඩ - 29%
02	වල්ගම-අතුරුගිරියමාර්ගය (කි.මී.0+000–1+210) බී 451	1.21	
03	වාද්දුව-මෙරෙන්තුඩුවමාර්ගය (කි.මී.1+000–5+300)	5.30	සිවිල්වැඩ -90%
04	බෙල්ලන-මාරගල්ලමාර්ගය (කි.මී.0+000–9+800) බී 544	9.80	

ඉහත වගුවෙහි අංක 01 සහ 02 යටතේ ඇති මාර්ගයන්හි සිවිල්වැඩ 2018 වසරේදී ආරම්භ වූ අතර 2018 දෙසැම්බර් මස අවසන් වන විට 11% ක භෞතික ප්‍රගතියක් අත් කරගැනීමට සමත්ව ඇත. උක්ත මාර්ගයන් 2 හි භෞතික ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය 2018 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමේදී 44% ලෙස ගණනය කළ හැක.

එසේම 2019 වර්ෂය අවසානයේදී මෙම මාර්ග 02 සඳහා අත්කර ගත් භෞතික ප්‍රගතිය 29% වූ අතර 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව එහි ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය 33% කි. මෙම මාර්ග 02 ඉදිකිරීමේදී පැනනැගුණු ප්‍රධානතම ගැටළුව නම් ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය තුල සිදු වූ ප්‍රමාදයයි. ආසන්න වශයෙන් රු.මි.500 ක පමණ වන්දි ගෙවීම් සිදු කිරීමට ඇති බැවින් එය ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය කෙරෙහි ඍණාත්මකව බලපෑ හැකි බැවින් එම ගැටළු විසඳන තෙක් උපයෝගීතා හුවමාරුව සහ ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු තාවකාලිකව නතර කර ඇත.

මාර්ගඅංක 03 සහ 04 හිසිවිල්වැඩ 2017 වර්ෂයේඔක්තොම්බර්මස 05 වනදිනආරම්භවිය. මේඅනුවඑමමාර්ග 2හිභෞතිකප්‍රගතිය 2017 අවසානයේදී 2% වූඅතර 2018 වසරඅවසානයේදී 50% දක්වාඉදිකිරීම්කටයුතුනිමකරගැනීමටසමත්වඇත. මේ අනුව 2018 වර්ෂයතුළදීඅත්කරගනුලැබූභෞතිකප්‍රගතිය 48% ලෙසදසඳහන් කළ හැකි අතර 2018 වසරසඳහාසකසනලදවාර්ෂිකක්‍රියාකාරීසැලැස්ම හාසැසඳීමේදීඅත්කරගනුලැබූභෞතික කාර්යසාධනය 87% ලෙසදැක්වියහැකිය.

2019 වර්ෂයේදී, ඉහත සඳහන් මාර්ග පැකේජයන් 02 එහි ඉලක්ක සපුරා ගැනීමේ අගය වන 71% වූ අතර අත්පත් කර ගත් සමස්ත ප්‍රගතියක් 90% ක් විය. එසේ වුවද 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉහත මාර්ග කොටස් 04 හිම සිවිල් වැඩ කටයුතු 2017 වර්ෂය තුල දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය තුල සිදු වූ ප්‍රමාදය හේතුවෙන් එසේ කිරීමට නොහැකි විය.

මාර්ග අංක 01 සහ 02 හි ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය 75% ට වඩා වැඩි වූ අතර අංක 03 සහ 04 හි මාර්ග පැකේජයන්හි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් 26% හා 35% ලෙස දැක්විය හැකිය. 2019 වර්ෂය අවසානයේදී මෙම මාර්ග පැකේජයන් 04 හි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය මඟින් අත්කර ගත් ප්‍රගතිය පිළිවෙලින් 55%, 40%, 95% හා 88% ක් විය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	විෂය/ අයිතම වැය විස්තරය	අයවැය ප්‍රතිපාදන 2019 (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම(රු.මි.)
117-02-04-40	2506 යටිතලපහසු කම්සංවර්ධනය	200.0	744.0	519.1
	2105 ඉඩම්හාඉඩම් වැඩිදියුණුකිරීම්	800.0	340.0	228.0
	එකතුව	**1,000.0**	**1,084.0**	**747.1**

2018 වර්ෂයේ දී ඉහත ව්‍යාපෘතිය මගින් අත්කර ගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය 84% වූ අතර අයවැය මගින් වසර ආරම්භයේ දී වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය 50% කින් සංශෝධනයට ලක් විය. 2019 වර්ෂයේදී එය 15% කින් අඩු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ මූල්‍යමය ඉලක්ක සාධනය කරගැනීමේ ප්‍රගතිය 69% විය.

2.3.20 මධ්‍යමහාඋංවපළාත්වලමාර්ගසහපාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මධ්‍යම හා උංව පළාත් වල මාර්ග කි.මී. 64.31 ක් පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා චීන අපනයන - ආනයන බැංකුව (හුනාන් ශාඛාව) සහ මහජන බැංකුව මඟින් ශ්‍රී ලංකා රජය වෙත ණය මුදලක් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 02 ක්යටතේක්‍රියාත්මකවනඅතරඒසඳහාගතවනකාලසිමාව, මාර්ගඉදිකිරීම්පැකේජය (සී 1) සඳහාමාස 24කුත්පාලම්ඉදිකිරීමේපැකේජය (සී 2) සඳහාමාස 18 කුත්ලෙසදැක්වියහැක.

2018 වසරේජූනිමාසයේදී ව්‍යාපෘතියේ ණය ගිවිසුම අත්සන් කර ඇති අතර 2019 වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය මඟින් අත්කරගත් සමස්ත ප්‍රගතිය 43% කි. මේ අනුව 2019 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අදාල

ඉලක්කගත කාර්යසාධනය 89% ලෙස සඳහන් කළ හැක.

වගු අංක 2.3.20 - ව්‍යාපෘතිය යටතේ පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමට තොරා ගනු ලැබූ මධ්‍යම හා ඌව පළාත් වල මාර්ග හා පාලම් පිළිබඳ විස්තර

කොන්ත්‍රාත් අංක	මාර්ග/පාලම් පැහැදිලි	දුර (කි.මී./පාලම් සංඛ්‍යාව
සී 1	මහනුවර – කිරිමැටිය මාර්ගය	කි.මී.7.64
	අම්පිටිය – ගුරුදෙනිය (පිච්චමල්වත්ත) මාර්ගය	කි.මී.2.25
	නුවරඑළිය – රාගල – උඩපුස්සැල්ලාව මාර්ගය	කි.මී.27.00
	වැලිමඩ – කර්ක්ලස්මාර්ගය	කි.මී.17.83
	අව්ස්සාවෙල්ල – හැටන් – නුවරඑළිය මාර්ගය	කි.මී.9.59
සී 2	තැන්නකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ පාලම් අංක 24/3 සහ 42/1 නැවත ඉදිකිරීම	02
	මහනුවර - කිරිමැටිය මාර්ගයේ පාලම් අංක 3/2 නැවත ඉදිකිරීම	01
	නුවරඑළිය - රාගල - උඩුපුස්සැල්ලාව මාර්ගයේ පාලම් අංක 23/3, 27/2, 30/4, 31/5, 34/8, 37/1 සහ 38/5 නැවත ඉදිකිරීම	07
	වැලිමඩ - කර්ක්ලස්මාර්ගයේ පාලම් අංක 1/1, 2/5 සහ 7/7 නැවත ඉදිකිරීම	03

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැයකේතය	වැයවිෂය/ අයිතමවිස්තරය	මූලික අයවැයඇස්තමේන්තුව 2019	ඉහිගෝධිත අයවැය (රු.මි)	වියදම (රු.මි)
117-02-04-45	2506 යටිතල පහසුකම්	1,720.0	1,877.5	1,035.3
	එකතුව	**1,720.0**	**1,877.5**	**1,035.3**

2019 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය55% වන අතර 2018 වසරේදී එම අගය වාර්තා වූයේ 100% ක් ලෙසිනි. මෙම ව්‍යාපෘතියේ ණය ගිවිසුම දෙවන කාර්තුවේදී අත්සන් කළ බැවින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා 50% ක් වූ අඩු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාර්තා වී ඇති ප්‍රගතිය ද අපේක්ෂිත අගය ඉක්මවා ගොස් නොතිබිණි.

2.3.21 ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය

මාර්ග, දුම්රිය සහ වරාය වැනි ප්‍රමුඛ ප්‍රවාහන උපඅංශවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේමූල්‍යාධාර මත මෙම ව්‍යාපෘතිය සිදු කරනු ලබයි.

මේ යටතේ,

- ශක්‍යතා අධ්‍යනය, සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආරම්භක අදියර තුළ ක්‍රියාත්මක කිරීමේ සහය ලබාදීම

මෙම ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් 03 සිදු කරන ලදී.

වගුඅංක 2.3.21.1 2019.12.31 දිනට ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

අයිතම අංකය	ව්‍යාපෘතියේ නම / මාර්ග සංවර්ධන අධිකාරි අංශය	ආරම්භ කළ දිනය	අවසන් කළ දිනය	භෞතිකප්‍රගතිය
1	කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතියේ විස්තරාත්මක නිර්මාණය සඳහා වන උපදේශන සේවා සැපයීම.	20-02-2017	19-02-2018	100%
2	පැලියගොඩ - රාජගිරියදක්වාකුළුණුමත ඉදිවනඅධිවේගීමාර්ගයේ මූල්‍ය උපදේශනය සඳහා වන උපදේශන සේවය(ඒකපුද්ගල) (ICS 01)	16-10-2017	10-02-19	100%
3	පැලියගොඩ - රාජගිරියදක්වාකුළුණුමත ඉදිවනඅධිවේගීමාර්ගයේ නුවමාරුඋපදේශනයසඳහාවනඋපදේශනසේවය (ඒකපුද්ගල) (ICS 03)	10-10-2017	10-02-19	100%

උක්ත අයිතම අංක 01 යටතේ දැක්වෙන්නා වූ ක්‍රියාකාරකම 2018වර්ෂයේදී අවසන් වූ අතර 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි ඉලක්ක පූර්ණය කිරීමේදී අගය 100% ක් ලෙස වාර්තා විය.අයිතම අංක 2 සහ 3 2018 වර්ෂයේදී පිළිවෙලින් 80% ක හා 90% ක ප්‍රගතියක් අත්පත් කරගත් අතර 2019 වර්ෂයේදී එම ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම නිම කිරීමට හැකි විය.

අයිතම අංක 2 සහ 3 යටතට ගැනෙන ක්‍රියාකාරකම් හි භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතීන් පිළිවෙලින් 60% හා 80% ලෙස දැක්විය හැකිය. මේ අනුව උක්ත ක්‍රියාකාරකම් 02 සැලසුම් කළ පරිදි 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම වූ අතර 2019 වර්ෂයේදි ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය 100% කි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු.මි.)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-47	2506 යටිතලපහසු කම්සංවර්ධන ය	345.0	128.5	41.6
	එකතුව	**345.0**	**128.5**	**41.6**

2018 සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව 2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 75% ක් වූ අතර 2019 වර්ෂය සඳහා එම අගය වාර්තා වූයේ 32% ලෙසිනි. ඒ අනුව 2018දී 2019 වර්ෂයට වඩා ඉහළ මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2.3.22 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේව්‍යාපෘතිය

90 දශකය අගභාගය පමණ වනවිට සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම, කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා වඩාත් සුදුසු විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව 1998 දී ආරම්භ කරන ලද සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම් කටයුතු විවිධ අදියරයන් යටතේ රත්මුතු හෝටලය සිට දෙහිවල දක්වා ක්‍රියාත්මක කරන ලදී. (කි.මී. 0+520 - කි.මී. 8+420)

යෝජිත වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ කිරීම හා ප්‍රවේශවීමට හැකිවන අයුරින් සමුද්‍රීය මාර්ගය ගාලුමුවදොර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත. කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන ධාරිතාවය සීඝ්‍රයෙන් ඉහලයාම නිසා වර්තමානයේදී දවසේ ඕනෑම කාලසීමාවක් තුලදී කොළඹ සිට දෙහිවල දක්වා රථවාහන තදබදයක් ඇතිවනබව වාර්තා වී ඇත.

මේ සඳහා ප්‍රධාන හේතුවක් වන්නේ විකල්ප මාර්ගයක් නොමැති වීමයි. මේ හේතුවෙන් උක්ත සමුද්‍රීය මාර්ගය පානදුර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත.

මේ යටතේ ක්‍රියාත්මක වන එක් එක් ක්‍රියාකාරකම්හි පහත පරිදි අදියර කිහිපයක් යටතේ කොටස් කර ඇති අතර එම එක් එක් අදියරයන් මඟින් අත්කරගත් භෞතික ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැක.

අදියර	2019/12/31 ට ප්‍රගතිය
සමුද්‍රීය මාර්ගය - අදියර I (රාමක්‍රිෂ්ණා වීදියේ සිට මෙල්බර්න් වීදිය)	70%
සමුද්‍රීය මාර්ගය - අදියර II (මෙල්බර්න් වීදිය සිට ග්ලේන් ආබර් පෙදෙස)	80%
සමුද්‍රීය මාර්ගය - අදියර III (ග්ලේන් ආබර් පෙදෙසකොල්ලුපිටිය දුම්රිය ස්ථානය දක්වා)	95%
සමුද්‍රීය මාර්ගය - අදියර IV(රාමක්‍රිෂ්ණා මාර්ගයේ සිට ප්‍රේසර් පෙදෙස දක්වා)	90%
සමුද්‍රීය මාර්ගය - අදියර V-මාර්ග වැඩ	50%
සමුද්‍රීය මාර්ගය - අදියර V - කොල්ලුපිටිය දුම්රිය ස්ථානයේ නවාතැන් පහසුකම්සැපයීම සඳහා නිර්මාණය හා ඉදිකිරීම)	5%
සමුද්‍රීය මාර්ගය - අදියර VI - මාර්ග වැඩ	2019 වර්ෂය තුල ආරම්භ වී නොමැත

මීට අමතරව 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදු කෙරුණු අතර 2019 වර්ෂය අවසානයේදී 36% කභෞතික ප්‍රගතියක් පෙන්වීය.

2019/12/31 ට මූල්‍ය ප්‍රගතිය

අංශවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අංශවැය ප්‍රතිපාදනය 2019 (රු.මි.)	ප්‍රතිශෝධිත අංශවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-04-49	2506 යටිතල පහසුකම් සංවර්ධනය	200.0	200.0	76.2
	2105 ඉඩම් අත්පත් කරගැනීම	100.0	140.0	80.2
	එකතුව	**300.0**	**224.0**	**123.7**

2018 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතිය මඟින් අත් ක ගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 50%ට වඩා අඩු වූ අගයක් වූ අතර ඒ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව ලෙස මේ යටතේ ක්‍රියාත්මක වන බොහෝ ක්‍රියාකාරකම් ඒවායෙහි පූර්ව අවධීන්හි පැවතීම දැක්විය හැකිය.

2019 වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය මඟින් අත්කරගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 55% ක් විය.

මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි ප්‍රගතිය හා ඉලක්ක සපුරා ගැනීමේ සාරාංශය -2019

2019 වර්ෂය තුලදී, ප්‍රමුඛතා මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය 3- අදියර 11 මාර්ග ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම යටතේ ඉතුරුම් භාවිතා කරමින් නව මාර්ග පැකේජයන් ක්‍රියාත්මක කරන ලද අතර එතුලින් ලබාගත් ප්‍රගතිය හා එම මාර්ග පැකේජයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

තවද, උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය යටතේ ද නව මාර්ග කොටස් 02 ක වැඩිදියුණු කිරීම් ද හඳුනාගනු ලැබූ අතර ඒ පිළිබඳ විස්තරද පහත වගුවේ දැක්වේ.

මහාමාර්ග සංවර්ධන වැඩසටහනේ භෞතික ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතියේ නම	2017/1/31 ට සමස්ත භෞතික ප්‍රගතිය	2018		2019		2019/12/31 ට සමස්ත භෞතික ප්‍රගතිය
			සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	
1	බෙස්ලයින් මාර්ගය දිර්ඝ කිරීම	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය- 48%	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය- 50%	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය- 2%	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය- 48%	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය - 31%	ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය- 81%
2	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩ් (A005) මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය(සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල) & (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල)	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල – 0%	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල– 08%	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල- 03%	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල – 35%	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල- 23%	සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල- 26%
		සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල –6%	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල –35%	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල- 31%	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල – 50%	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල- 11%	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල- 55%
3	උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේකණය	කොන්ත්‍රාත් පැකේජ 09 සම්පූර්ණ කොට ඇත.					
		මහනුවර - යාපනය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම (ඒ 009) යටතේ කි.මී.(141+100-150+400) වන කොටස					
		49%	50%	50%	1%	1%	100%
					මැදවච්චිය - හොරොව්පතාන මාර්ගයේ (බී 382) කි.මී. 10+000-23+100 (අදියර I) හා කි.මී. 23+100-37+000 (අදියර II) දක්වා මාර්ග කොටස් ඉදිකිරීම		
					අදියර I – 58% අදියර II- 64%	අදියර I– 58% අදියර II– 64%	අදියර I – 58% අදියර II– 64%
4	සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල යටතේ මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	කොං.පැ. I,II,III, IV - 100%, කොං.පැ V– 5%	කොං.පැ V– 55%	කොං.පැ V - 30%	කොං.පැ V- 55%	කොං.පැ V - 22%	කොං.පැ I,II,III, IV - 100% කොං.පැ V - 57%


අනු අංකය	ව්‍යාපෘතියේ නම	2017/1/31 ට සමස්ත භෞතික ප්‍රගතිය	2018		2019		2019/12/31 ට සමස්ත භෞතික ප්‍රගතිය
			සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	
5	කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපාතිය	කෝට්ටෙ-බෝපේ මාර්ගය14%, කොට්ටාව - තලගල මාර්ගය - 12%	කෝට්ටෙ-බෝපේ මාර්ගය-55%, කොට්ටාව - තලගල මාර්ගය - 51%, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ග අදියර I -45%,	කෝට්ටෙ-බෝපේ මාර්ගය-32%, කොට්ටාව - තලගල මාර්ගය - 14% ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ග අදියර I -23%,	කෝට්ටෙ-බෝපේ මාර්ගය-30% කොට්ටාව - තලගල මාර්ගය - - 40% ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ග අදියර I - 25%, අදියර II – 10%	කෝට්ටෙ-බෝපේ මාර්ගය-25% කොට්ටාව - තලගල මාර්ගය - 29% ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ග අදියර I -06%, අදියර II-0.2%	කෝට්ටෙ-බෝපේ මාර්ගය-71% කොට්ටාව - තලගල මාර්ගය-55% ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ග අදියර I -29%, අදියර II-0.2%
6	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	*84%	6%	5%	11%	6%	95%
7	බස්නාහිර පළාත් ජාතික මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය	කොං.පැ II-2%	කොං.පැ I - 25% , කොං.පැ II - 55%	කොං.පැ I - 11% , කොං.පැ II - 48%	කොං.පැ I - 54% , කොං.පැ II - 56%	කොං.පැ I - 18% , කොං.පැ II - 38%	කොං.පැ I - 29% , කොං.පැ II - 88%
8	දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය	කොං.පැ1-100% කොං.පැ2-22% කොං.පැ3-42%, කොං.පැ4-17%	- කොං.පැ2-47% කොං.පැ3-49% කොං.පැ4-83%	- කොං.පැ2-58%, කොං.පැ3-56% කොං.පැ4-49%	- කොං.පැ2-20%, කොං.පැ3-02% කොං.පැ4-34%	- කොං.පැ2-17%, කොං.පැ3-02% කොං.පැ4-32%	කොං.පැ1 - 100% කොං.පැ2-97%, කොං.පැ3-100% කොං.පැ4-98%
9	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I	62%	28%	20%	11%	06%	88%
10	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර II	4%	77%	72%	24%	24%	*100%
11	මධ්‍යම හා ඌව පළාත්වල මාර්ග හා පාලම් වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම	2018 වර්ෂයේදී සිවිල් වැඩ ආරම්භ කරන ලදී	1%	1%	47%	42%	43%

2.4 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම


2.4.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

ප්‍රධාන මාර්ග සහ කුඩා මාර්ග කොටස් සමග සම්බන්ධ කරනු ලබන අවධානයට ලක්විය යුතු එහෙත් විදේශාධාර මත ක්‍රියාත්මක කළ නොහැකි සහ අබලන්තත්වයට පත් වූ කුඩා පාලම්, මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත ඉදිකිරීම සිදුකරනු ලැබේ. 2018 වර්ෂය තුල මෙම වැඩසටහන යටතේ වැඩිදියුණු කරන ලද මාර්ග ප්‍රමාණය කි.මී 364.78 ක් වන අතර වර්ෂය අවසානය වන විට කි.මී.337.32 මාර්ග ප්‍රමාණයක වැඩිදියුණුකිරීම් සිදු කරමින් පැවතිනි. තවද, 2018 වර්ෂය තුල ඉලක්කගත මාර්ග වැඩිදියුණුකිරීම් ප්‍රමාණය කි.මී.825.87 වූ අතර වර්ෂය අවසානය වන විට එම මාර්ග දුර ප්‍රමාණයෙන් 31% ක වැඩිදියුණු කිරීම් මේ යටතේ නිම කොට ඇත.

මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවලට අමතරව 2018 වර්ෂය තුල පාලම් 08 ක් ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගනු ලැබූ අතර වර්ෂය අවසාන වන විට එයින් පාලම් 06 ක වැඩකටයුතු නිම කොට තිබුණි. ඒ අතුරින් පාලම් 05 ක් දකුණු පලාත තුල ද පිහිටා තිබුණි.



රූපසටහන 2.4.1.12018 වර්ෂයේදීනිමකරන ලද මාර්ග දුර ප්‍රමාණය



රූපසටහන 2.4.1.2 2019 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද මාර්ග දුර ප්‍රමාණය

2019 වර්ෂය තුල වැඩිදියුණු කරන ලද මාර්ග දුර ප්‍රමාණය කි.මී 209.01 ක් වූ අතර වර්ෂය අවසානය වන විට කි.මී.309.4 කවැඩිදියුණුකිරීම් කටයුතු සිදු කරමින් පැවතිනි.2019 වර්ෂය තුල ඉලක්කගත මාර්ග වැඩිදියුණුකිරීම් ප්‍රමාණය කි.මී.518.41 වූ අතර වර්ෂය අවසානය වන විට එම මාර්ග දුර ප්‍රමාණයෙන් 29% ක වැඩිදියුණු කිරීම් නිම කොට ඇත. වර්ෂය තුල හඳුනාගන්නා ලදතවත් මාර්ග දුර කි.මී.453.54 ක් වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ විණි.

2019 වර්ෂය තුල ද පාලම් 20 ක් ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගනු ලැබූ අතර වර්ෂය අවසාන වන විට එයින් එක පාලමකවැඩකටයුතු නිම කොට තිබුණු අතර තවත් පාලම් 04ක වැඩකටයුතු සිදු කරමින් පැවතුණි. ඒ අතුරින් නිම කරන ලද හා තවත් ක්‍රියාත්මක වෙමින් පැවති පාලමක් බදුල්ල දිස්ත්‍රික්කය තුල ද අනෙකුත් ක්‍රියාත්මක තත්වයේ පැවති පාලම් කළුතර, මාතර හා රත්නපුර යන දිස්ත්‍රික්කවල ද පිහිටා තිබුණි.

වගු අංක 2.4.1.1 2019 වර්ෂයේ මාර්ග හා පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

		භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය			
අයවැය ඡේදය	දිස්ත්‍රික්කයේ නම	2019 දෙසැ.31 දිනට සමස්ත භෞතික ඉලක්කය (%)	2019 දෙසැ.31 දිනට අත්කර ගත් භෞතික ප්‍රගතිය	2019 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය (රු.මි)	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019 දෙසැ.31 දිනට වියදම්(රු.මි)	අත් කර ගත් මූල්‍ය ප්‍රගතිය (%)
117-02-05-01-2104-11	කොළඹ	100	47	300.0	300	270.5	90%
117-02-05-02-2104-11	ගම්පහ	100	38	300.0	300	268.1	89%
117-02-05-03-2104-11	කළුතර	100	75	275.0	142	109.36	77%
117-02-05-04-2104-11	මහනුවර	100	15	275.0	275	236.1	86%
117-02-05-05-2104-11	මාතලේ	100	6	175.0	51.2	39.57	77%
117-02-05-06-2104-11	නුවරඑළිය	100	3	130.0	80	76.33	95%
117-02-05-07-2104-11	මාතර	100	3	150.0	650	202.1	31%
117-02-05-08-2104-11	ගාල්ල	100	5	150.0	97	79.5	82%
117-02-05-09-2104-11	හම්බන්තොට	100	0	150.0	160	160	100%
117-02-05-10-2104-11	යාපනය	100	84	120.0	176.1	176	100%
117-02-05-11-2104-11	කිලිනොච්චිය	100	87	120.0	320	313.2	98%
117-02-05-12-2104-11	මන්නාරම	100	38	120.0	3	1.1	37%
117-02-05-13-2104-11	වවුනියාව	100	78	120.0	71.9	63.78	89%
117-02-05-14-2104-11	මුලතිවු	100	40	120.0	6	2.8	47%

භෞතික ප්‍රගතිය				මූල්‍ය ප්‍රගතිය			
අයවැය ඡේදය	දිස්ත්‍රික්කයේ නම	2019 දෙසැ.31 දිනට සමස්ත භෞතික ඉලක්කය (%)	2019 දෙසැ.31 දිනට අත් කර ගත් භෞතික ප්‍රගතිය	2019 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	2019 දෙසැ.31 දිනට වියදම්(රු.මි)	අත් කර ගත් මූල්‍ය ප්‍රගතිය (%)
117-02-05-15-2104-11	මඩකලපුව	100	100	120.0	60	43.57	73%
117-02-05-16-2104-11	අම්පාර	100	39	120.0	90	72	80%
117-02-05-17-2104-11	ත්‍රිකුණාමලය	100	58	100.0	82.6	61.15	74%
117-02-05-18-2104-12	කුරුණෑගල	100	71	125.0	473	470	99%
117-02-05-19-2104-13	පුත්තලම	100	93	125.0	125	118.8	95%
117-02-05-20-2104-14	අනුරාධපුරය	100	51	150.0	267	262.1	98%
117-02-05-21-2104-15	පොළොන්නරුව	100	20	100.0	44	43.9	100%
117-02-05-22-2104-16	බදුල්ල	100	45	125.0	55	54.4	99%
117-02-05-23-2104-17	මොණරාගල	100	17	100.0	50	41.7	83%
117-02-05-24-2104-18	කෑගල්ල	100	92	130.0	71	46.13	65%
117-02-05-25-2104-19	රත්නපුර	100	25	100.0	137	135.6	99%
117-02-05-26-2104-20	බදු	-	-	700.0	560	438.9	78%
117-02-05-29-2104-21	ජාතික ඉතිරිකිරීම් බැංකු ආධාර	-	-	3000.0	300	270.5	90%
	එකතුව			7,500.0	4646.8	3786.69	81%

2019 හා 2018 වර්ෂයන්හි භෞතික ප්‍රගතිය ඇගැයීම

2018 වර්ෂයේ සිවිවන කාර්තුවට අවසාන වන විට දිස්ත්‍රික්ක 25 අතුරින්, දිස්ත්‍රික්ක 04 ක් 100% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබුණු නමුදු 2019 වර්ෂාවසානය වන විට 100% ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණු එකම දිස්ත්‍රික්කය වූයේ බදුල්ල දිස්ත්‍රික්කයයි.

2019 හා 2018 වර්ෂ දෙක තුලදීම 90% ට වැඩි භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට හැකියාව ලැබී තිබුණේ දිස්ත්‍රික්ක 02ට පමණි. 2019 වර්ෂය අවසාන වන විට කළුතර, යාපනය, කිලිනොච්චිය හා වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි වාර්තා වූ භෞතික ප්‍රගතියක් 75%-90% අතර අගයක් වුණි. 2019 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 25 අතරින් දිස්ත්‍රික්ක 18 ක් වාර්තා කර තිබුණේ 75% ට අඩු භෞතික ප්‍රගතියක් වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කය කිසිදු භෞතික ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි. තව ද 2018 වර්ෂයේ දී අත් කර ගනු ලැබූ අගයයන් හා සැලකීමේ දී අවම භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබුණේ බදුල්ල දිස්ත්‍රික්කයෙනි.

2019 හා 2018 වර්ෂයන්හි මූල්‍ය ප්‍රගතිය ඇගැයීම

මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සලකා බැලීමේදී, 2018 වර්ෂාවසානය වන විට දිස්ත්‍රික්ක 06 ක 100% ට වැඩි මූල්‍ය ප්‍රගතියක්ද, දිස්ත්‍රික්ක 04 ක 80% ට වැඩි මූල්‍ය ප්‍රගතියක්ද අත්කරගෙන තිබුණි.

එහිදී අවම මූල්‍ය ප්‍රගතිය වාර්තා කොට තිබුණේ මන්නාරම දිස්ත්‍රික්කයෙන් වන අතර තවත් දිස්ත්‍රික්ක 05 ක් 20% ට අඩු මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට තිබුණි.

2019 වර්ෂයේදී, ඉහළම මූල්‍ය ප්‍රතිපාදනය වන 100% ක මූල්‍ය ඉලක්ක අත්කරගැනීම හම්බන්තොට, යාපනය සහ පොළොන්නරුව යන දිස්ත්‍රක්ක මගින් වාර්තා විය. අවම මූල්‍ය ප්‍රගතිය මාතර දිස්ත්‍රික්කයෙන් නිරීක්ෂණය වූ අතර 90% ට වැඩි මූල්‍ය ප්‍රගතියක් තවත් දිස්ත්‍රික්ක 03 න් වාර්තා වී ඇත.

2019 හා 2018 වර්ෂයන්හි මූල්‍ය ප්‍රගතියේ සාරාංශය

2019 සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන මගින් අත්කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 75% ඉක්මවා ගිය අතර එම අගය 2018 වර්ෂයේ දී අත්කර ගනු ලැබූ අගයට වඩා වැඩි අගයක් ගෙන ඇත

2019/12/31 ට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය- 2019 (රු.මි)	2019/12/31 ට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)
117-2-5-1-25	2506-යටිතල පහසුකම් සංවර්ධනය	7500.0	4646.8	3786.7
	එකතුව	7500.0	4646.8	3786.7

2019 හා 2018 යන වර්ෂයන්හි පළාත් වශයෙන් මූල්‍ය ප්‍රගතිය අත්පත් කරගැනීම පහත වගුව පරිදි ඉදිරිපත් කළ හැකි වූව ද , එහිදී වාර්ෂික ප්‍රමුඛ අවශ්‍යතාවයන් මත එක් එක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් පළාත් වශයෙන් වාර්තා කොට ඇති අගයන් එකිනෙක සමඟ සන්සන්දනය කළ නොහැක.

වගුව 2.4.1.2 – 2019 වර්ෂයට එදිරිව 2018 වර්ෂයේ දී පළාත් වශයෙන් අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය


පළාතේ නම	2018/12/31 ට අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය	2019/12/31 ට අත්කර ගත්මූල්‍ය ප්‍රගතිය
බස්නාහිර	34%	87%
මධ්‍යම	46%	87%
දකුණ	61%	49%
උතුර	72%	96%
නැගෙනහිර	95%	76%
වයඹ	92%	98%
උතුරු මැද	71%	98%
ඌව	77%	92%
සබරගමුව	100%	87%

මහාමාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක වන වැඩසටහනක් වන බැවින්, වාර්ෂික අයවැය ප්‍රතිපාදනය හා වාර්ෂික අවශ්‍යතාවය මත භෞතික හා මූල්‍ය ඉලක්කයන් සැලසුම් කරනු ලැබේ.

2.5 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම

රටේ මාර්ග ජාලයේ වැදගත් අංගයක් ලෙස සහ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා මාර්ග සංවර්ධනයට සමගාමීව වාර්ෂිකව පාලම් 100 – 150 ක ප්‍රමාණයක් නැවත ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සිදුකළ යුතුව ඇත. (පවතින පාරු පාලම් හා පටු මෙන්ම දුබල පාලම් වෙනුවට ස්ථිර පාලම් සකස් කිරීම සිදු කළයුතුව ඇත.) තව ද පවතින මාර්ග තදබදය අවම කිරීම, ගමනාගමනයේ දී සිදුවන ප්‍රමාදය අඩු කිරීම, මාර්ග අනතුරු අවම කිරීම, වාහන නඩත්තු පිරිවැය අවම කිරීම සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රධාන මංසන්ධිවල ගුවන් පාලම් ඉදිකිරීම ද කළ යුතු ව ඇත.මේ යටතේමාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2019 වසරේදී ද පහසු ,ඉක්මන් හා ආරක්ෂාකාරී ගමනාගමන අවශ්‍යතා හඳුනාගනිමින් නව පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම , කුඩා හා දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සහ නැවත ඉදිකිරීම මෙන්ම නව පාලම් ඉදිකිරීම යන කාර්යයන් ව්‍යාපෘති රාශියක් හරහා සිදුකරමින් පවතී.

ජාතික මහමාර්ග ජාලය (ඒ ශ්‍රේණියේ හා බී ශ්‍රේණියේ මහාමාර්ග) තුළ පාලම් 4,662 පමණ ප්‍රමාණයක් පවතින අතර එම පාලම් ඒවායේ දිග ප්‍රමාණ අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.



වගුව 2.5.1- ජාතික මාර්ගයන්හි පිහිටි පාලම් පිළිබඳ සාරාංශය

ජාතික මහාමාර්ග ජාලයේ ඉදිකරන ලද පාලම් අතරින් ඉහළම ප්‍රතිශතයකට අයත් ප්‍රමාණය දිග මීටර 10ට අඩු වර්ගීකරණ කාණ්ඩය යටතට ගැනෙන අතර අවම පාලම් ප්‍රමාණය මීටර 30ත් මීටර 50ත් අතර කාණ්ඩයට සහ මීටර 10ත් 30ත් අතර කාණ්ඩයට අයත් වේ. තව ද උක්ත වර්ගීකරණය යටතට ගැනෙන පාලම් සියල්ල ජාතික මහාමාර්ග ජාලය තුළ ස්ථාන ගත ව ඇති පාලම් වන බැවින් අධිවේගී මාර්ගයන්හි පිහිටි පාලම් මේ යටතට ඇතුළත් නොවේ.

2.5.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය

මෙම වැඩ සටහන යටතේ 2018 වසර තුළ පාලම් 86 සවිබල ගැන්වීම් කටයුතු සිදු කරනු ලැබූ අතර 2019 දී එසේ සවිබල ගැන්වීම් කටයුතු සිදු කරනු ලැබූ පාලම් ගණන 67 කි. මෙමපාලම් 67 අතරින් පාලම් 12 ක ප්‍රතිසංස්කරණ කටයුතු 2019 වසර තුළ දී නිම කරන ලදී. වර්ෂය තුල දී නිම කිරීමට නියමිතව තිබූ සමස්ත පාලම් ප්‍රමාණයෙන් 46 ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතුණු අතර පාලම් 09 ක් ප්‍රසම්පාදන අදියරේ පැවතිණි. 2019 වර්ෂය තුල හඳුනාගත් නව පාලම් 09 ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ අතර වර්ෂාවසානය වන විට ඒවා සියල්ල ඉහත සඳහන් කළ පරිදි ප්‍රසම්පාදන අදියරේ පැවතිණි.

වගු අංක 2.5.1.1 2019වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සඳහා භෞතික ප්‍රගතිය

පළාත	නිර්මාණ ලේ	ක්‍රියාත්මක තත්ත්වයේ පවතින	ප්‍රසම්පාදන අදියරේ පවතින	එකතුව
බස්නාහිර	00	09	02	11
මධ්‍යම	05	13	02	20
දකුණු	00	01	01	02
උතුරු	00	01	00	01
නැගෙනහිර	00	03	00	03
නැගෙනහිර (අක්කරෛපත්තු)	00	01	00	01
වයඹ	02	04	00	06
උතුරු මැද	02	07	01	10
ඌව	02	02	03	07
සබරගමුව	01	05	00	06
එකතුව	**12**	**46**	**09**	**67**

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 61%ක් වූ අතර 2019 දී එම අගය 100% ක් ලෙස වාර්තා වී ඇත. මේ අනුව 2019 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මෙහි දක්වන ලද මූල්‍ය ඉලක්ක සමඟ සැසඳූ කල 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී වර්ධිත ඉලක්ක සපුරා ගැනීමක් වාර්තා කොට ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු.මි.)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-08	2506 යටිතල පහසුකම් සංවර්ධනය	300.0	325.3	325.3
	එකතුව	**300.0**	**325.3**	**325.3**

2.5.2 පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ ග්‍රාමීය ප්‍රදේශයන්හි අඩු පිරිවැය පාලම් ඉදිකිරීම සහ ගංවතුර අලාභ හානි වැනි හදිසි තත්ත්ව යටතේ තාවකාලික පාලම් ඉක්මනින් ඉදිකිරීම ආදිය වේ. මේ යටතේ ග්‍රාමීය ප්‍රදේශයන්හි ඉදිකරනු ලබන පාලම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉවත් කරන ලද පැරණි යකඩ පාලම් කොටස් යොදා ගනු ලැබේ.

2019 වර්ෂය තුළ දී පාලම් 31 ක් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආරම්භ කළ අතර, පාලම් 17ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන ලදී. මීට අමතරව පාලම් 11ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවති අතර පෙර වර්ෂයේ ආරම්භ කරන ලදුව මේ වර්ෂයේද ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගිය පාලම් ද එම සංඛ්‍යාවට ඇතුලත් විය. ඉහත සඳහන් කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු අරඹන ලද පාලම් 31 අතුරින් පාලම් 10 ක් වර්ෂාවසානය වන විට ප්‍රසම්පාදන අදියරේ පැවතුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය තුල ප්‍රතිස්ස්කරණය කරමින් පැවති පාලම් පිළිබඳ තොරතුරු **ඇමුණුම 11** හි සඳහන්ව ඇත.

2018 වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය 65% ක මූල්‍ය ප්‍රගතියක් ලභා කරගෙන ඇති අතර 2019 වර්ෂයේදී එය 68% දක්වා වැඩි වී ඇත. මේ අනුව වාර්තාගත කාලපරිච්ඡේදයේ දී මූල්‍ය ඉලක්ක අත්පත් කරගැනීම පෙර වර්ෂයට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය - 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-14	2506 යටිතලපහසුකම්සංවර්ධනය	300.0	262.7	178.8
	එකතුව	**300.0**	**262.7**	**178.8**

2.5.3 ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II

මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය යුරෝ මිලියන 45 ක් වන අතර මේ සඳහා බ්‍රිතාන්‍ය HSBC බැංකුව විසින් අරමුදල් සපයන ලදී.සිව් අවුරුදු ව්‍යාපෘතියක් වූ මෙහි ව්‍යාපෘති කාලය 2013-2017 දක්වා විණි. .මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් 80 ක් ඉදිකිරීම ක්‍රියාත්මක කරනු ලැබේ. 2017 වර්ෂයේදී පාලම් 10ක ඉදිකිරීම් කටයුතු නිම වූ අතර තවත් පාලම් 16ක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවතිණි.

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගනු ලැබූ පාලම් අතරින් කිහිපයක් ලැයිස්තු ගත අනිකුත් පාලම් 66ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තාවකාලිකව යොදා ගනු ලැබූ අතර ඉදිකිරීම් අවසානයේ එම තාවකාලිකව යොදා ගත් පාලම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදෙනු ලැබිණි. උක්ත පාලම් අතරින් පාලම් 65ක ඉදිකිරීම් කටයුතු මේ වන විට නිම කර ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී 1% ක සමස්ත භෞතික ප්‍රගතියක්

වාර්තා කළ අතර 2019 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත භෞතික ප්‍රගතිය 99% ට ආසන්න මට්ටමක පැවතිණි.

2019 වර්ෂයේ දී, පාලම් 08 ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන ලදී. ඊට අමතරව තවත් පාලම් 04 ක ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹී අතර වසර අවසන් වන විටද ඒවායෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතිණි. 2019 වර්ෂාවසානය වන විට මෙම ව්‍යාපෘතියෙහි සමස්ත භෞතික ප්‍රගතිය 99.7% විය.

ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II යටතේ, 2019 වර්ෂය තුලදී ප්‍රතිසංස්කරණය කරන ලද පාලම් පිළබඳ විස්තර පහත දැක්වේ.

වගුඅංක 2.5.3.1 2019 වර්ෂය තුලදී ප්‍රතිසංස්කරණය කරන ලද පාලම්වල භෞතික ප්‍රගතිය

පාලමේ නම හා අංකය	දිස්ත්‍රික්කය	දිග (මී)	2019/12/31 ට භෞතික ප්‍රගතිය
කොළඹ - රත්නපුර - වැල්ලවාය මඩකලපුව මාර්ගයේ පාලම් අංක 284/1 නැවත ඉදිකිරීම	මොණරාගල	63	96%
ලිඳුල සිට අග්‍රාස් මාර්ගයේ පාලම් අංක 14/6 නැවත ඉදිකිරීම	නුවරඑළිය	21.34	50%
රත්නපුර - වේවැල්වත්ත මාර්ගයේ පාලම් අංක 1/7 නැවත ඉදිකිරීම	රත්නපුර	15.24	95%
මලවල කාර්නි මාර්ගයේ පාලම් අංක 13/10 නැවත ඉදිකිරීම	රත්නපුර	24.38	91%

2019 වර්ෂය තුල මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදන - 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	ඛියදුම(රු.මි.)
117-02-06-16	2506 යටිතලප හසුකම් සංවර්ධනය	25.0	250.0	157.0
	එකතුව	**25.0**	**250.0**	**157.0**

මේ අනුව උක්ත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය දී වාර්තා ගත මූල්‍ය ප්‍රගතිය 100% ක් වූ අතර 2019 වසර සඳහා එම අගය 63% ලෙස වාර්තා විය. එම අගයයන් සැසඳීමේදී මෙම ව්‍යාපෘතිය2018 වර්ෂයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව මූල්‍ය ඉලක්ක පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට සමත්ව ඇතත් 2019 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්ක අත්පත්කරගැනීමට අපොහොසත් වී ඇත.

2.5.4 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ "ඒ" හා "බී" ශ්‍රේණිවලට අයත් ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ඉදිකරනු ලැබේ. අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල විසින් සපයන අතර කුවේට් ඩිනාර් මිලියන 10 ක (රු.මි.4,460) මූල්‍යාධාර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පැකේජ 3ක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ I යටතේ, පාලම් 08 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කොට ඇත. කොන්ත්‍රාත් පැකේජ I සඳහා ඉදිකිරීම් කටයුතු 2015දී ආරම්භ වී 2019දී නිම කොට ඇත. 2018 වර්ෂයේ අවසානය වන විට කොන්ත්‍රාත් පැකේජ අදියර I, 67% ක සමස්ත භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබූ අතර, 2019 වර්ෂය තුල 33% ක සමස්ත භෞතික ප්‍රගතියක් සමඟ ව්‍යාපෘතියේ එම අදියර නිම කර ඇත.

කොන්ත්‍රාත් පැකේජ අදියර I යටතේ නැවත ඉදිකරන ලද පාලම්හි සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

වගු අංක 2.5.4.1 කොන්ත්‍රාත් පැකේජ 1 යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තොරාගනු ලැබූ පාලම්වල භෞතික ප්‍රගතිය

අයිතම අංක	පාලමේ නම සහ අංකය	දිග ප්‍රමාණය(මීටර්)	2018.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2019.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
1	පාලම්අංක.1/1 කඩුවෙල - බියගම මාර්ගය (ඒබී 004) **(බී1)**	92.76	75%	100%
2	පාලම්අංක: 14/3 ගලගෙදර - හොරණ මාර්ගය (බී123) **(බී 2)**	11.5	56%	100%
3	පාලම්අංක14/8 ගලගෙදර - හොරණ මාර්ගය (බී123) **(බී3)**	11.5	95%	100%
4	පාලම්අංක. 11/4 කෑගල්ල - බුලත්කොහුපිටිය මාර්ගය (ඒඒ021) (බී4)	31.6	63%	99.8%
5	පාලම්අංක 32/1 වේයන්ගාඩ - රුවන්වැල්ල මාර්ගය (බී445) **(බී5)**	19.3	60%	98.5%
6	පාලම්අංක.2/2 තංගල්ල - වීරකැටිය මාර්ගය (බී410) **(බී 6)**	6.92	99%	100%
7	පාලම්අංක. 2/3 තංගල්ල - වීරකැටිය මාර්ගය (බී 410) **(බී 7)**	13.9	46%	100%
8	පාලම්අංක 10/2 අම්පිලන්තුරායි - වේරමුනායි මාර්ගය (බී 018) **(බී 8)**	50.4	46%	94%

කොන්ත්‍රාත් පැකේජ II හා III යටතේ පිළිවෙලින් පාලම් 17 ක් ඉදිකිරීමට නියමිතය. කොන්ත්‍රාත් පැකේජ II හි උපදේශන සේවා ප්‍රදානය 2018 වර්ෂයේ සැප්තැම්බර් මස සිදු කර ඇති අතර නිර්මාණ කටයුතු හා ටෙන්ඩර් ලියවිලි සැකසීමේ කටයුතුසිදු කරමින් පැවතිණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය - 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-17	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	3.0	3.0	0.0
	2506 යටිතල පහසුකම් සංවර්ධනය	20.0	20.0	19.5
	එකතුව	**23.0**	**23.0**	**19.5**

2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 81% වූ අතර 2019 දී එම අගය 85% ලෙස වාර්තා විය. ඒ අනුව 2018 වර්ෂයට වඩා 4% ක වර්ධනයක් සමඟ 2019 වර්ෂය තුල මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කරගෙන ඇත.

2.5.5 පාලම් 46 ක් නැවත ඉදිකිරීම

පාලම් 46 ක් නැවත ඉදිකිරීම සඳහා ප්‍රංශ රජය විසින් යුරෝ මිලියන 22.05 ක ණය මුදලක් ඉතා පැරණි හා පටු පාලම් 45 ක් නැවත ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත ලබාදී ඇත. 2013 මැයි මාසයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර පාලම් 50 ක නැවත ඉදිකිරීම් කටයුතු මෙමඟින් සිදු කෙරුණු අතර එම කටයුතු 2017 දී නිමාවට පත්විය. 2018 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කෙරුණු සමස්ත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය ම භාවිතයට ගැනීමට හැකි වූ අතර අත් කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 100% විය. තව ද , 2018 වර්ෂය සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය පූර්ව වර්ෂයන්හී දී ප්‍රතිපාදන නිහ වීම නිසා පූර්ණය කිරීමට නොහැකිව ශේෂ වූ බිල්පත් පියවීමට ද යෙද වීමට සිදු වීම නිසා වරින් වර ඉහළ නැංවීමට ද සිදු විය.

උක්ත ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සියල්ල 2017 වර්ෂයේදී නිම කිරීම හේතුවෙන් 2019 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි හෝ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි හෝ භෞතික ඉලක්ක ඇතුළත් කිරීමෙහි අවශ්‍යතාවයක් නොවනු අතර බිල්පත් පියවීම් කටයුතු හේතුවෙන් 33%ක මූල්‍ය ප්‍රගතියක් පමණක් නිරීක්ෂණය විය. ඉඩම් අත්පත් කරගැනීම් සඳහා වූ ඇතැම් ගෙවීම් පියවීම් වර්ෂය තුල සිදුකරන ලද අතර ඉඩම් අත්පත් කරගැනීම් සඳහා වූ අයවැය ප්‍රතිපාන 100% ආසන්න අගයකින් උපයෝජනයවී තිබුණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ඡේදය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය - 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-18	2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම	50.0	19.1	19.0
	2506 යටිතලපහසු කම් සංවර්ධනය	680.0	600.0	181.9
	එකතුව	**730.0**	**619.1**	**200.9**

2.5.6 ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ වැඩ විෂය පථය වනුයේ ඉහළ ප්‍රමුඛතාවක් ඇති ජාතික මාර්ගයන්හි පාලම් ඉදිකිරීම සහ පවතින පාලම් වෙනුවට නව පාලම් ඉදිකිරීම වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි. උක්ත වැඩිදියුණු කරනු ලබන පාලම් ඒ සහ බී වර්ගයනට අයත් මාර්ගයන්හි පිහිටන පාලම් වන බැවින් මෙම ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ගමනාගමනය සඳහා ගත වන කාලය අවම වීම, වාහන නඩත්තු කිරීම සඳහා දැරීමට සිදු වන පිරිවැය අවම වීම මෙන් ම රථවාහන සඳහා වන මධ්‍යස්ත වේගය වැඩිවීම හේතුවෙන් සමස්ත දිවයිනටම ප්‍රතිලාභ අත් වනු ඇත.

ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයනුයේ ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය මඟින් වන අතර ඇස්තමේන්තුගත සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය ජපාන යෙන් මිලියන 12,381 කි. මෙහි ඉදි කිරීම් කටයුතු 2015 පෙබරවාරි මස ඇරඹුනු අතර මේ සඳහා පාලම් 37 ක් මූලිකව තෝරා ගනු ලැබුව ද මූල්‍යමය දුෂ්කරතාවයන් හේතුවෙන් අවසානයේදී එම අගය පාලම් 21 දක්වා අඩු විය. ඒ අතරින් දකුණු පළාතට අයත් පාලම් 10 ක ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් පැකේජ I යටතේ 2015 මාර්තු මස ආරම්භ කරන ලදී.

2018 වර්ෂයේ මාර්තු මස දී කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ පාලම් සියල්ලෙහි ඉදි කිරීම් කටයුතු නිමාවට පත් වූ අතර 100%ක භෞතික ප්‍රගතියක් වාර්තා කිරීමට සමත්විය.

උක්ත සඳහන් පාලම් 10න් පොල්වත්ත සහ කොලේදණ්ඩ යන පාලම් 2හි ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේදී නිම වූ අතර තවත් පාලම් 7ක ඉදිකිරීම් කටයුතු 2017 දී නිමාවට පත්විය.

2018 වර්ෂය තුල ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ අංක I හි කටයුතු නිම වීම හේතුවෙන් 2019 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි භෞතින ඉලක්ක අන්තර්ගත නොවිණි.

කොන්ත්‍රාත්පැකේජ 2 යටතේ උතුරු පළාත තුළ පිහිටා ඇති පාලම් 08ක් ඉදිකිරීම් කටයුතු සඳහා

තොරාගනු ලැබූ ඇති අතර ඉදිකිරීම් කටයුතු 2016 දී ආරම්භ විය.ඒ අනුව කොන්ත්‍රාත්කරු වැඩබිම වෙත ප්‍රවේශය හා මූලික අදියරේ වැඩ 2016 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2018 වසර අවසානය වන විට උක්ත පැකේජය මගින් 100%ක භෞතික ප්‍රගතියක් පෙන් වූ අතර පාලම් සියල්ලෙහිම ඉදි කිරීම් කටයුතු ඉලක්ක කර ගත් පරිදි නිම කිරීමට හැකි වීම තුලින් 100% ක ඉලක්ක අත්පත්කර ගැනීමක් ද වාර්තා කොට ඇත. 2018 වර්ෂය තුල අපේක්ෂා කළ පරිදි සියළුම ඉදිකිරීම් කටයුතු ඔක්තෝම්බර් මස අවසානය වන විට නිම කිරීමට හැකි වීම තුලින් 100% සමස්ත භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇත.

ඒ අනුව, 2019 වර්ෂය සඳහා සකසන ලද සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මතුළ මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ 2සඳහාද කොන්ත්‍රාත්පැකේජ 1පරිදිම භෞතික ඉලක්කයන් අතුලත් කිරීම අවශ්‍ය නොවිණි.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු. මි)	2019/12/31 ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-19	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්	185.0	38.4	38.3
	2506 යටිතලප හසුකම්සං වර්ධනය	2,095.0	1,286.1	1,251.7
	එකතුව	**2,280.0**	**1,324.5**	**1,290.0**

උක්ත ව්‍යාපෘතිය 2019 වර්ෂයේ දී97% ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කර ගෙන ඇති අතර 2018 දී එම අගය 98% ලෙස වාර්තා විය. මේ අනුව ආසන්න වර්ෂයන් දෙකෙහිදීම මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව සිදු ව ඇත.

2.5.7 දෙවන නව කැළණි පාලම ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් ජපන් යෙන් මිලියන 35,020 ක ණය අරමුදල් සපයනු ලැබේ. මෙහි මූලිකඉදිකිරීම් කටයුතු 2014 ජනවාරි මාසයේදි ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. උක්ත ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ පවතින කැළණි පාලම තුල නිර්මාණය වන මාර්ග තදබදය විසිරුවා හරිමින් සහ අවම කරමින්, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා කොළඹ - කටුනායක මාර්ගය, බේස්ලයින් මාර්ගය හා වරාය පිවිසුම් මාර්ග හරහා කොළඹ නගරයට සම්බන්ධ වීමට හැකි ප්‍රවාහන මාර්ග ජාලයක් ඇති කිරීමයි.

කොළඹ- කටුනායක අධිවේගී මාර්ගය මහජනයා සඳහා විවෘත කිරීමත් සමඟ කොළඹ නගරයට ළඟාවන වාහන ප්‍රමාණය සැලකිය යුතු මට්ටමේ ඉහළ යාමක් දක්නට ලැබීම කරණ කොට උක්ත ඉල්ලුමට මුහුණදීම සඳහා නව කැළණි පාලම මංතීරු 6 කින්, අන්තර්හුවමාරු මධ්‍යස්ථාන හා වරාය ප්‍රවේශ මාර්ගයට සම්බන්ධ වන ලෙස උස්කොට තනන ලද මාර්ගයකින් සමන්විත ව ඉදිකිරීමට නියමිතය.


මෙම පාලම ඉදිකිරීමට යෝජිත භූමිය අසල පිහිටි ශ්‍රී ලංකා ප්‍රතීතන බලශක්ති අධිකාරියේ ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පිහිටි නව ගොඩනැගිල්ලෙහි නැවත ඉදිකිරීම් හා ප්‍රතිස්ථාපන කටයුතු 2017 වර්ෂයේදී අවසන් කර ඇති අතර තවද මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතන ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම් හා ප්‍රතිස්ථානගත කටයුතු ද2017 සැප්තැම්බර් වන විට නිම කර එය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙත බාර දී ඇත.

සිවිල් වැඩ සඳහා වූ උපදේශන කොන්ත්‍රාත් කටයුතු ඔරියන්ටල් උපදේශන සමාගම සහ බටහිර අන්තර්ජාතික සමාගම වෙත ප්‍රධානය කර ඇති අතර නිර්මාණ කටයුතු, ටෙන්ඩර සහායක කටයුතු සහ ඉදිකිරීම් සඳහා අධීක්ෂණ කටයුතු සඳහා 2015 සිය 2019 දෙසැම්බර් දක්වා වූ කාල සීමාව වෙන් කර ඇත.

ඉන් නිර්මාණ කටයුතු සහ ටෙන්ඩර් සහායක කටයුතු මේ වන විට නිම වී ඇති අතර සිවිල් වැඩ

සඳහා වන කොන්ත්‍රාත් පැකේජ 1 සහ 11 සඳහා පිළිවෙළින් 2017 වසරේ දෙසැම්බර් සහ සැප්තැම්බර් යන මාසයන්හි කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් නිවාස අහිමිවන ජනතාව සඳහා සාලමුල්ල ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණය ඉදිකෙරුණු අතර එහි ප්‍රතිස්ථාපන කටයුතු 2017 අප්‍රේල් මස දී නිමාවට පත් විය. 2019 වර්ෂය අවසානය වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු 99% පමණ මේ වන විට නිම කර ඇති අතර 2018 දී එහි ප්‍රගතිය 90% ඉහළ අගයක් විණි. 2019වසර අවසන් වන විට කොන්ත්‍රාත් පැකේජ 1සඳහා මෙන්ම කොන්ත්‍රාත් පැකේජ 11 සඳහා ද 56% ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇත.



රූප සටහන 2.5.7.1–2019 සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳු කල කොන්ත්‍රාත් පැකේජ 1 සහ කොන්ත්‍රාත් පැකේජ 11 සඳහා භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	අයවැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිසංදනය 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-21	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම්	100.0	62.0	41.2
	2506 යටිතලපහසු කම්සංවර්ධනය	9,170.0	12,365.3	6,947.4
	එකතුව	**9,270.0**	**12,427.3**	**6,988.6**

2018 වර්ෂ අවසානයේදී මෙම ව්‍යාපෘතිය 93% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති නමුත්ඉහත දක්වා ඇති දත්ත අනුව මෙම වර්ෂය සඳහා වාර්තා කොට ඇත්තේ 53% ක මූල්‍ය ප්‍රගතියක් පමණි. වර්ෂය තුල වියදමේ සත්‍ය ප්‍රතිශතාත්මක අගය ලෙස ව්‍යාපෘති කළමණාකරණ අංශයවාර්තා කරන අගය ඉහත වියදම තුල වාර්තා නොවීමට හේතු වී ඇත්තේ විදේශ මූල්‍යධාර වලට අදාල රු.මි.5,162.33 ක පමණ වූ ප්‍රමාණයක් අන්තර් ණය ගෙවීම් (IPC) ලෙස වාර්තා වී තිබීම වේ.

2.5.8 පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS)හා පාලමිතක්ෂේරු ඒකකයක්(BMA) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

පැවති ක්‍රමවේදයේ පැවති දුර්වලතාවයන් හේතුවෙන් නව පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS) හා පාලම් නඩත්තු කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ජපාන රජය වෙත ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව ජපාන රජය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගීතාවය මගින් ඒ සඳහා තාක්ෂණික සහාය ලබාදීමට එකඟතාවය පළ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති කාලය වසර 03 කි. උක්ත ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ පාලම්

කළමණාකරණයයි. ඒ සඳහා අබලන් පාලම් මුල් අවස්ථාවේදී හඳුනාගැනීම හා කාලානුරූපීව නඩත්තු කිරීම සිදු කරනු ලබන අතර ඒ මඟින් පාලම් නඩත්තු කටයුතු සඳහා වැය වන වියදම අවම කිරීමෙන් ආර්ථික වර්ධනය සඳහා දායක වේ.

මේ යටතේ තෝරාගත් නියැදි පළාත් වල පාලම් අධීක්ෂණය කිරීමේ කටයුතු ජපාන ජාත්‍යන්තර සහායෝගීතා ආයතනය මඟින් සිදු කරනු ලැබූ අතර අනිකුත් පළාත් වල පාලම් අධීක්ෂණය කිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉංජිනේරුවරුන් යටතේ සිදු කෙරුණි. තෝරාගත් නියැදි පළාත් වල පාලම් අධීක්ෂණය කිරීමේ කටයුතු 2016 අවසන් වන විට 95% දක්වා නිම වී තිබූ අතර එම සමස්ත ක්‍රියාවලියම 2017 දී නිමාවට පත්විය. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉංජිනේරුවරුන් යටතේ අධීක්ෂණය කිරීම් සිදු කළ පළාත් වල අධීක්ෂණය කිරීමේ කටයුතු 2018 දී නිමාවට පත්විය.

2019 වර්ෂයේ අවසානය වන විට පාලම් පිළිබඳ තොරතුරු පද්ධතියට පාලම් 4,662 ක දත්ත ඇතුළත් කර තිබුණි.

උක්ත ව්‍යාපෘතිය යටතේ ජපාන අරමුදල් යටතේ සිදු කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් මේ වන විට අවසන් කර ඇති බැවින් මෙම ව්‍යාපෘතිය තවදුරටත් ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේක්‍රියාත්මක වන වාර්ෂික වැඩසටහනක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම් නිර්මාණ අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.ඒ අනුව උක්ත වැඩසටහන 2019 වසර අවසානයේ අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය 100% ලෙස දැක්විය හැකිය.

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු. මි)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-06-22	2506 යටිතලපහසුකම් සංවර්ධනය	5.0	5.0	0.3
	එකතුව	**5.0**	**5.0**	**0.3**

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

2018 වර්ෂ අවසානයේ දී වාර්තා කර ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 82 % කි. නමුත් 2019 වර්ෂාවසානයේදී සමස්ත මූල්‍ය ප්‍රගතිය ලෙස වාර්තා වූයේ 8% ක් පමණි. මෙම ව්‍යාපෘතිය සඳහා පූර්ව වර්ෂයන්හි දී පූර්ණය කිරීමට නොහැකි වූ බිල්පත් ගෙවීම් කටයුතු සඳහා ඉතිරිව පැවති නමුත් අක්මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය අවම අගයක් ලෙස වාර්තා විය. ඒ හේතුවෙන් මූල්‍ය ඉලක්ක අත්පත් කර ගැනීම ඉහත පරිදි විය.

2.5.9 පැලියගොඩ- පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා ඔස්ට්‍රියා ජාත්‍යන්තර රයිෆිෂන් බැංකුව මඟින් යුරෝ මිලියන 8.7 ක ණය මුදලක් පැලියගොඩ- පුත්තලම මාර්ගයේ පැවති 38/3 දරණ පැරණි පටු පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීමට ලබා දී ඇත. මෙම පාලම ඉදි කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ පැවති පැරණි පටු පාලම ප්‍රතිසංස්කරණය කොට නැවත ඉදි කිරීම මඟින් එය භාවිතා කරන මිනීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමත් ගමන් කාලය අවම කිරීමත් ආදිය වේ.

මෙම පාලමේ දිග මීටර් 105 වන අතර පරාසයන් 03 ක් හා මංතීරු 4 ක් යටතේ ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. මෙම පාලම 2016 වර්ෂයේ ජූලි මාසයේ දී සිවිල් වැඩ ආරම්භ කරන ලද අතර අවුරුද්දක ණය අනුමත කාලසීමාවක්සහිතව 2019 වර්ෂයේදී නිම කරන ලදී. (අනුමත කාලසීමාව 2020 දක්වා පවතී.) 2018 දී සංශෝධිත භෞතික ඉලක්කය 35% වූ අතර ඉලක්ක සපුරා ගැනීම 100% ලෙස වාර්තා විය. මේ අනුව 2018 අවසානයේ දී අත් කර ගනු ලැබූ භෞතිකප්‍රගතිය 100% ලෙස සඳහන් කළ හැකිය.

ඒ අනුව සංශෝධිත අයවැය යටතේ පෙර වර්ෂයන්ට වඩා ඉහළ මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කරමින් 2019 හා 2018 වර්ෂයන්හිදී 99% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. 2019 වර්ෂය තුල බිල්පත් ගෙවීම් කටයුතු ද පැවති නමුත් ඉහත මූල්‍ය ප්‍රගතිය කරා පහසුවෙන් ළඟා වී ඇත.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ඒකය/ අයිතම ඒස්තරය	අයවැය ප්‍රතිපාදනය 2019 (රු. මිලියන)	2019/12/31 දිනට ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම(රු.මි.)
117-02-06-20	2506 යටිතල පහසුකම් සංවර්ධනය	210.0	131.1	131.1
	එකතුව	**210.0**	**131.1**	**131.1**

2.5.10 රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල යන ප්‍රදේශවල ගුවන් පාලම් 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

රාජගිරිය, පොල්ගහවෙල හා ගනේමුල්ල යන ප්‍රදේශවල පවතින අධික රථවාහන තදබදය හේතුවෙන් ගමන් කාලය හා වාහන මෙහෙයුම් පිරිවැය වැඩිවීම තුලින් ආර්ථිකයට සිදු වන අලාභය අවම කරලීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙහි සම්පූර්ණ ව්‍යාපෘති කාලය මාස 32 ක් (2016-2018) වන අතර ස්පාඤ්ඤ රජය විසින් අරමුදල් සපයන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගුවන් පාලම පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක 2.5.10.1 ඉදිකරනු ලබන ගුවන් පාලම් පිළිබඳ විස්තර

ගුවන් පාලම	යකඩ වියුවහයේ දිග (මී)	සම්පූර්ණ දුර(මී)	මංතීරු ගණන	ව්‍යාපෘති කාලය (මාස)
රාජගිරිය	363	533.2	4	32
පොල්ගහවෙල	233	353.0	2	16
ගනේමුල්ල	204	275.3	2	14

උක්ත සියළු ගුවන් පාලම් 2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සම්පූර්ණ කොට මහජනතාව සඳහා විවෘත කොට ඇත.

2019 වර්ෂාවසානය වන විට සමස්ත මූල්‍ය ප්‍රගතිය 67% වූ අතර, 2018 වර්ෂාවසානය වන විට එය 99% ක් ලෙස වාර්තා විය. තව ද 2019 වර්ෂය තුල නිම කරන ලද වැඩ වලට අදාල බිල්පත් ගෙවීම් කටයුතු හේතුවෙන් මූලික අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය වර්ෂය තුල සංශෝධනය කිරීමට සිදු විය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ඒකය/ අයිතම ඒස්තරය	අයවැය ප්‍රතිපාදනය - 2019 (රු.මිලියන)	අයවැය ප්‍රතිපාදනය - 2019 (රු.මිලියන)	වියදම (රු.මිලියන)
117-2-6-24	2506 යටිතල පහසුකම් සංවර්ධනය	30.0	85.0	67.0
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කරගැනීම්	100.0	68.0	51.5
	එකතුව	**130.0**	**153.0**	**118.5**

පාලම් හා ගුවන්පාලම් ඉදිකිරීමේ භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය

පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති ප්‍රගතිය පිළිබඳ විස්තර තනි ව්‍යාපෘති වශයෙන් මෙම පරිච්ඡේදය යටතේ විස්තර කළ ද 2019 වර්ෂය අවසාන වන විට සමස්තයක් ලෙස මෙම වැඩසටහනේ භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය පහත පරිදි සාරාංශ ගත ව දැක්විය හැකිය.

විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 03 ක් හා දේශීය ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 03 ක් 2019 වර්ෂය තුල, ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මෙම විදේශාධාර ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතර පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ II 99% ක්වූ භෞතික ප්‍රගතියක් ළඟාකර ගෙන ඇති අතර එය 100% ආසන්න වූ ඉලක්ක සපුරා ගැනීමකට සම විය. ඊට අමතර වශයෙන් වර්ෂය තුල ක්‍රියාත්මක තත්වයේ පැවති විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක අනිකුත් ව්‍යාපෘති 02 ඉදිරි වසර 2-3 ඇතුළත සැලසුම්ගත පරිදි නිම කිරීමට නියමිතය.

වර්ෂය තුල මෙම වැඩසටහන යටතේ විදේශාධාර ව්‍යාපෘති වලට අමතරව දේශීය ආධාර යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වාර්ෂික වැඩසටහන් 02 ක් ද ක්‍රියාත්මක වූ අතර ඒවා නම්, ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය හා පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීමයි.වර්ෂාවසානය වන විට මෙම ව්‍යාපෘති ඒවායේ සංශෝධිත සැලසුම්වලට අනුව සිය භෞතික ඉලක්කයන් සතුටුදායක මට්ටමකින් ළඟා කරගැනීමට සමත්ව ඇත.

තවද, වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ,වර්තමානයේදී දිවයින පුරා ජාතික මාර්ගයන්හි පිහිටි පාලම් අධීක්ෂණය කිරීම සඳහා අබලන් පාලම් පිළිබඳ දත්ත පද්ධතියකට ඇතුලත් කිරීම සිදු කරනු ලබන අතර, මෙම වැඩසටහනද 2019 වර්ෂය සඳහා සකසන ලද සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සිය භෞතික ඉලක්කයන් සාක්ෂාත් කරගෙන ඇත.

පාලම් හා ගුවන්පාලම් ඉදිකිරීමේ වැඩසටහනේ භෞතික ප්‍රගතිය							
අනු අංකය	ව්‍යාපෘතියෙ නම	2017/12/31 ට සමස්ත භෞතික ප්‍රගතිය	2018		2019		2019/12/31 ට සමස්ත භෞතික ප්‍රගතිය
			සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	සමස්ත භෞතික ඉලක්කය	අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය	
1	ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II	97%	3%	2%	1%	1%	99.7%
2	ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම	40%	38%	27%			67%
3	පාලම් 46 ක් නැවත ඉදිකිරීම	100%	2017 වර්ෂය අවසානය වන විට 100%.				
4	ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	කොං.පැ. 1- 98% කොං.පැ 2 - 43%	කොං.පැ 1 – 2% කොං.පැ 2- 57%	කොං.පැ 1- 2% කොං.පැ 2- 57%	2018 වර්ෂය අවසාන වන විට කොං.පැ 1 හා II 100% සම්පූර්ණ කොට ඇත		කොං.පැ 1- 100% කොං.පැ 2 - 100%
5	පැලියගොඩ- පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම	66%	35%	35%	100% සම්පූර්ණ කොට ඇත		100%
6	දෙවන නව කැළණි පාලම ඉදිකිරීම	පාලම් ඉදිකිරීමේ සිවිල් වැඩ 2017 වර්ෂයේදී ආරම්භ කොට ඇත.	අදියර I- 25, අදියර II - 32%	අදියර I - 10% අදියර II - 28%	අදියර I- 20%, අදියර II – 12%	අදියර I- 17%, අදියර II – 9%	අදියර I - 56% අදියර II - 56%
7	රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල යන ප්‍රදේශවල ගුවන් පාලම් 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	99%	1%	1%	-	-	100%

2.6 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

2.6.1 ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් සංවර්ධන සැලසුම්හි ප්‍රධානතම ඉලක්කයක් ලෙස සැලකිය හැකි ආරක්ෂකාරී මාර්ගජාලයක් ස්ථාපනය කිරීම උදෙසා නායයෑම් වැනි ස්වභාවික ව්‍යවසනයන්ගෙන් ජාතික මාර්ගජාලයට අයත් මාර්ග ආරක්ෂාකිරීම අපේක්ෂා කෙරේ. අධික වර්ෂාපතනය හේතුවෙන් නායයෑමේ අවධානමට ලක්වියහැකි කඳුකර සහ බෑවුම් ප්‍රදේශයන්හි නායයෑමේ අවස්ථාවන් අවම වන ලෙස මාර්ග කළමණාකරණය කිරීමේ ධාරිතාවයන් සවිමත් කිරීමද මෙහි දී සිදු කෙරේ.

මේ යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ නායයාමට ලක්වන බෑවුම් සහිත ස්ථාන කළමනාකරණයට සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ (තාක්ෂණික උපදෙස්) සැකසීමට සහ මාර්ග දෙපස බෑවුම් කළමනාකරණය සහ නායයෑම් පූර්ව දැනුම්දීමේ කාර්යයන්හි හැකියාවන් වර්ධනයට සාමූහිකව ප්‍රයත්න දරයි.

මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මගින් සකසන ලද මාර්ගෝපදේශයන් දිස්ත්‍රික් 07 ක කඳුකර ප්‍රදේශයන්හි ජාතික මාර්ග ව්‍යාපෘති සඳහා භාවිතා කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ජපාන යෙන් මිලියන 9,590 කි. ව්‍යාපෘතිය 2013 ජූලි 05 වන දින ආරම්භ කරන ලද අතර 2020 ජූලි මාසයේදී නිම කිරීමට නියමිතය.

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර ප්‍රදේශය ආවරණය වන පරිදි මහනුවර, නුවරඑළිය, බදුල්ල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල "ඒ"ශ්‍රේණියේ මාර්ග ආශ්‍රිතව නායයෑම් වළක්වාගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකෙරේ. විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතිය මඟින් නායයෑම් වළක්වාගැනීම සඳහා ජපන් තාක්ෂණය තුළින් මිණුම්ක්‍රම හඳුන්වාදීම සිදු කරන ලදී.


මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ කඳුකර ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාවගේ හා මාර්ග ජාලයේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා කඳුකර ප්‍රදේශයන්හි "ඒ " ශ්‍රේණියේ මාර්ග ජාලයන්හි ඇතිවියහැකි නායයෑම් නිවැරදි මිණුම් ක්‍රම භාවිතයෙන් හඳුනාගෙන ඒවා අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීමයි.

නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය පහත උපදේශන ක්‍රියාකාරකම් 06 සහ සිවිල් ඉදිකිරීම් කටයුතු 2 කින් සමන්විතය.

සිවිල් වැඩ අදියර 1 රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙත භාර දී ඇති අතර අදියර 11 හි සිවිල් වැඩ ආර් ආර් සොල්ටෙක් ඒකාබද්ධ සමාගම වෙත ප්‍රධානය කර ඇත. සිවිල් වැඩ කොන්ත්‍රාත් යටතේ දිස්ත්‍රික්ක 05ක ප්‍රදේශ 16ක් ආවරණය වන පරිදි සුදු කරනු ලබන අතර එම එක් එක් පැකේජය සඳහා අත්කර ගනු ලැබූ භෞතික ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැකිය.

කොන්ත්‍රාත් පැකේජ 1

- මේ යටතේ නුවරඑළිය, බදුල්ල, මහනුවර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ස්ථාන 10ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර ඉන් ස්ථාන 07ක් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.
- මෙම පැකේජයේ සිවිල් වැඩ 2017 මාර්තු මස ආරම්භ කළ අතර එදින සිට 2019/12/31 දක්වා අත් කර ගත් ප්‍රගතිය පහත දැක්වෙන ප්‍රස්ථාරයේ පරිදි දැක්විය හැකිය. (ප්‍රස්ථාර අංක 2.6.1.1)



ප්‍රස්තාරය 2.6.1.1. කොන්ත්‍රාත් පැකේජ I හි සිවිල් වැඩ භෞතික කාර්යසාධනය

කොන්ත්‍රාත් පැකේජ 11


- මේ යටතේ බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ස්ථාන 06ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඉන් ස්ථාන 05ක් බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

- ඉහත පැකේජය, 2019 වර්ෂාවසානය වන විට නිම කිරීමට අපේක්ෂා කළ නමුත්, ණය මුදලේ ඉතිරිවීම් පැවති හෙයින් මේ යටතේ තවත් අමතර ස්ථාන 05 ක් තෝරාගැනීමත් සමඟ සම්පූර්ණ පැකේජයේ විෂය පථය වෙනස් වීමකට ලක් විය. එම නිසා මෙම පැකේජය 2019 වර්ෂාවසානය වන විට අත්කරගත් ප්‍රගතිය අපේක්ෂිත අගයට වඩා අඩු අගයක් විය.

- පැකේජය සඳහා අමතරව එක්කර ගත් ස්ථාන 05 පහත පරිදි දැක්විය හැක.

අඹේපුස්ස (ඒ 006)
හපුතලේ (ඒ 016)
බණ්ඩාරවෙල (ඒ 016)
උඩුවර (ඒ 016)
ඇල්ල (ඒ 023)

මෙම පැකේජයේ ද සිවිල් වැඩ 2017 මාර්තු මස ආරම්භ කළ අතර 2019/12/31 ට අත් කර ගත් ප්‍රගතිය පහත ප්‍රස්ථාරයේ දැක්වේ (ප්‍රස්ථාර අංක 2.6.1.2)



ප්‍රස්තාරය 2.6.1.2 කොන්ත්‍රාත් පැකේජ II හි සිවිල් වැඩ භෞතික කාර්යසාධනය

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ උපදේශන සේවාවන්හි විෂය පථය සහ 2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට එම එක්එක් උපදේශන සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කළ හැක.

- පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය ස්ථාපනය කිරීම, ව්‍යවසන

කළමණාකරණය පිළිබඳ ප්‍රසම්පාදන සහාය ලබාගැනීම හා විශ්ලේෂණය සහ නායයෑම් පිළිබඳ පරීක්ෂණය මෙහෙයවීම හා ඇගැයීම යන උපදේශන සේවාවන් 2017 වර්ෂයේ අවසානය වන විට අවසන් කර තිබුණි.

- ව්‍යවසන කළමණාකරණය පිළිබඳ ඉදිකිරීම් සුපරීක්ෂණය හා ධාරිතා සංවර්ධන කටයුතු වාර්තාගත වර්ෂයේ අවසානය වන විට ක්‍රියාත්මක වෙමින් පැවති අතර එය 2020 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කොට ඇත.

2018 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 99% වූ අතර, 2019 වර්ෂය අවසානය වන විට එය 79% ක් ලෙස වාර්තා විය. ඒ අනුව ව්‍යාපෘතිය විසින් සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේ දී , 2018 වර්ෂයේදී, 2019 වර්ෂයට වඩා සැලකියයුතු මට්ටමේ ඉහළ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇති බව නිරීක්ෂිතය.

2019/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-02-07-13	2506 යටිතල පහසුකම් සංවර්ධනය	1,600.0	3,454.0	2,726.3
	එකතුව	**1,600.0**	3.454.**0**	2,726.3

2.7 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන

පසුගිය වසර කිහිපයක කාලය තුල ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය තුල, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන එනම් "මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන" ලෙස අතීතයේ දී හැඳින්වූ ඉහත වැඩසටහන ඉතා වැදගත් අංගයක් බවට පත්ව ඇත. දිවයිනෙහි ග්‍රාමීය මාර්ග සංවර්ධන අවශ්‍යතා පිලිබඳව පූර්ව අවබෝධයකින් 2004 දී ආරම්භ වූ මෙම වැඩසටහන සඳහා නවීන ක්‍රමවේදයන් උපයෝගී කර ගන්නා ලදී.

ග්‍රාමීය අංශයේ ප්‍රවේශ අවශ්‍යතා වැඩිදියුණු කිරීමත්, එම අංශයේ සැලකිය යුතු සංවර්ධනයක් උදා කරගැනීම සහතික කිරීම සඳහාත් 'ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන' ලෙස නව්‍යකරණයට ලක් වූ මෙම නව වැඩසටහන යටතේ, ප්‍රමුඛ ග්‍රාමීය සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් වඩාත් සංවිධානාත්මක ලෙස ග්‍රාමීය මාර්ග සංවර්ධනය සිදු කෙරේ. ග්‍රාමීය මාර්ග තෝරාගැනීමේ දී අතුරු මාර්ග බොහොමයකට සම්බන්ධ වන සහ පොදු ස්ථාන වැඩි ප්‍රමාණයකට ප්‍රවේශවිය හැකි මෙන් ම එතුලින් වැඩි පවුල් ඒකක ප්‍රමාණයක සුභසාධනය ඉහළ නැංවිය හැකි ග්‍රාමීය මාර්ග කෙරෙහි වැඩි අවධානය යොමු කෙරේ. අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති අනුමත ප්‍රජා පාදක සංවිධාන ඔස්සේ අදාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බැවින් සංවර්ධන ප්‍රතිලාභ මෙන් ම සෘජු මූල්‍ය ප්‍රතිලාභ ද ග්‍රාමීය ප්‍රජාව වෙත හිමිවේ.

2.7.1. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ භෞතික ප්‍රගතිය

2019 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන පහත සඳහන් ප්‍රධාන කොටස් යටතේ සිදුකෙරුණි.

I. කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීම
II. කොන්ක්‍රීට් කිරීම
III. පැති කාණු සහ පැති බැම්ම ඉදිකිරීම
IV. බෝක්කු ඉදි කිරීම

මේ වැඩසටහන යටතේ 2018 වර්ෂයේ දී ව්‍යාපෘති 2,585 කට අනුමැතිය ලැබුණු අතර ඉන් 1,333ක් වසර තුළදී වසර තුළ දී නිම කිරීමට හැකිවී ඇත.මේ යටතේ 2018 වසර සඳහා ඉලක්කගත කි.මී 250 ක් පමණ වූ ග්‍රාමීය මාර්ග අතුරින් ග්‍රාමීය මාර්ග කි.මී. 167.33ක ප්‍රමාණයක සංවර්ධන කටයුතු එම වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සිදුකරන ලද අතර අත්කර ගනු ලැබූ භෞතික කාර්යසාධනය 67%ක්පමණ විණි.

2019 වර්ෂයේදී ව්‍යාපෘති 1,129 ක් සඳහා අනුමැතිය ලැබුණු අතර වර්ෂාවසානයේ දී එයින් ව්‍යාපෘති 1,019 ක වැඩකටයුතු සම්පූර්ණ කරන ලදී. වර්ෂය තුල දී ඉලක්ක අත්පත්කරගැනීමේ ප්‍රගතිය 100% ඉක්ම වූ අතර වර්ෂය ආරම්භයේදී නිම කිරීමට ඉලක්ක කරන ලද මාර්ග දුර වූ කි.මී.100, මේ අනුවකි.මී.120.64 දක්වා ඉහළ නැංවීමට සිදු විය.

මෙම වැඩසටහන යටතේ ඉදිකරන ලද නිර්මිතයන් පහත පරිදි දැක්විය හැක.

වගු අංක 2.7.1.1 2019 හා 2018 වර්ෂයන්හිදී ඉදිකරන ලද නිර්මිතයන් සැසඳීම

වර්ෂය	පැති කාණු දිග (කි.මී.)	පැති බැම්ම (වර්ග මීටර)	බෝක්කු ප්‍රමාණය
2018	0.43	516.32	13
2019	0.03	369.94	1

2019 වර්ෂයේදී පෙර වර්ෂයට වඩා ඉලක්ක අත්පත්කරගැනීමේ ප්‍රගතියෙහිඉහළඅගයක් වාර්තා වූව ද ඉහත වගුවේ දැක්වෙන සියළු නිර්මිතයන් හි ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයට සාපේක්ෂව අඩු අගයක පැවතිණි.

2019 වර්ෂයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය

2019 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, 100% ට වැඩි ඉලක්ක සපුරාගැනීමක් වසරේ දෙවන කාර්තුව තුල දී වාර්තා වූ අතර ,49% ක් වූ අවම කාර්යසාධනය පළමු කාර්තුව තුල දී පෙන්නුම් කොට ඇත. මේ හා සමගාමීව 2018 වර්ෂයේදී, ඉහළම ඉලක්ක අත්පත් කරගැනීම පළමු කාර්තුව තුලත්, අවම ඉලක්ක අත්පත් කරගැනීම වර්ෂයේ තුන්වන කාර්තුව තුලත් සිදු ව ඇත.

2.7.2 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය

2019 වර්ෂය සඳහා මෙම වැඩසටහන වෙත සැපයුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය , වර්ෂයේ නොවැම්බර් මස ලැබුණු අතිරේක ප්‍රතිපාදන හේතුවෙන් රු.මි.1,200 ක් දක්වා 20% කින් වර්ධනය වූ අතර ඒ අනුව, ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන විසින් සිය ව්‍යාපෘති ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 99% ක් වූ ප්‍රමාණයක් වැය කොට තිබුණි.

2019/12/31 ට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම(රු.මි.)
117-2-9-1	2506 යටිතල පහසුකම් සංවර්ධනය	1,000.0	1,200.0	1,197.5
එකතුව		**1,000.0**	**1,200.0**	**1,197.5**

2.7.3 රන් මාවත් ග්‍රාමීය මාර්ග නඩත්තු හා ඉදිකිරීම් වැඩසටහන (අයවැය යෝජනා - 2019)

2019 වසරේ අයවැය යෝජනා යටතේ රු. බිලියන 65 ක ඇස්තමේන්තුගත පිරිවැය ප්‍රමානයක් යටතේ වූ පහත දැක්වෙන ප්‍රධාන අයවැය යෝජනා 05 ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂාරම්භයේ දී යෝජනා වූව ද මුදල් අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ අයවැය යෝජනා යටතේ වෙන් කරන ලද්දේ රු.මි.10,000 ක් වූ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණි.

අනු අංකය	අයවැය යෝජනාව	ඇස්තමේන්තු පිරිවැය (රු.බි)
1	“ගැමි පිවිසුම” මාර්ග සංවර්ධන වැඩසටහන	3.0
2	“සබැඳියාවට මගක්” මාර්ග සංවර්ධන වැඩසටහන	4.0
3	“චතුකර දිරිමග” මාර්ග සංවර්ධන වැඩසටහන	10.0
4	“මාර්ග සතිය” මාර්ග සංවර්ධන වැඩසටහන	6.0
5	“මහ සවිය” මාර්ග සංවර්ධන වැඩසටහන	42.0
	එකතුව	**65.0**

මෙම වැඩසටහන යටතේ පහත මාර්ග වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබිණි.

- ගල් අතුරා තාර දැමීම (කාපට් කිරීම) - කි.මී.394.81
- කොන්ක්‍රීට් කිරීම - කි.මී.109.45
- ගල් අතුරා තාර දැමීම - කි.මී.29.52
- කුට්ටි ගල් ඇතිරීම - කි.මී.110.37
- බොරළු දමා තැලීම - කි.මී.0.75

මෙම වැඩසටහටන යටතේ ව්‍යාපෘති 2,421 ක් ක්‍රියාත්මක කෙරුණු අතර 2019 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය වන විට ව්‍යාපෘති 1,975 ක වැඩකටයුතු සම්පූර්ණ කොට තිබුණි. ඒ අනුව එහි ඉලක්ක අත්පත්කරගැනීමේ ප්‍රගතිය 82% කි.

එසේම ඉලක්කගත මාර්ග දුර වූ කි.මී.810 අතුරින් දළ වශයෙන් 80% පමණ එනම්, කි.මී. 645ක මාර්ග දුර ප්‍රමාණයක වැඩිදියුණු කිරීම් කටයුතු 2019 වර්ෂය තුල සම්පූර්ණ කිරීමට හැකියාව ලැබී ඇත.

2019/12/31 ට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන)	ප්‍රතිශෝධිත අයවැය (රු.මි.)	වියදම්(රු.මි.)
117-2-9-1	2506 යටිතල පහසුකම් සංවර්ධනය	10,000.0	10,000.0	2,784.0
එකතුව		**10,000.0**	**10,000.0**	**2,784.0**


2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මූල්‍ය ඉලක්ක අත්පත්කරගැනීමේ ප්‍රගතිය 28% වූ අතර වැඩසටහනේ නිම කරන ලද වැඩ සඳහා අතැති බිල්පත්,ගෙවීම් සඳහා ඉතුරුව පැවතුණි. ඒ අනුව, රන්මාවත් ග්‍රාමීය මාර්ග නඩත්තු හා ඉදිකිරීමේ වැඩසටහන යටතේ වූ වැඩ වර්ෂය තුල ක්‍රියාත්මක කළද, වියදම ඒ හා සමානව ඉහළ අගයක් ලෙස වාර්තා වී නොමැත.

2.8 මූල්‍ය ප්‍රගති සමාලෝචනය

පසුගිය දශකය සැලකිල්ලට ගත්විට, මහාමාර්ග අංශය සඳහාඉහළම අයවැය ප්‍රතිපාදනයක් වෙන් කර ඇත්තේ 2019 වර්ෂය තුල දී බව සඳහන් කළහැකි අතර, දෙවන ඉහළම අයවැය 2017 වර්ෂයේදී වෙන් කොට තිබුණි.

2019 වර්ෂයේදී මහාමාර්ග අංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය, එක් එක් අංශ සඳහා ලබා දුන් අයවැය ප්‍රතිපාදනයන්ට අදාලව පහත පරිදි සාරාංශගතව දැක්විය හැකිය.

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය මඟින් 2019 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය කරමින් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 06ක් වන අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන, මහාමාර්ග සංවර්ධන වැඩසටහන, මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන, පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන, ස්වාභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන හා ග්‍රාමීය මාර්ග සංවර්ධන කිරීමේ වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් 06 ට අමතර වශයෙන් රු.බි.10 ක මුදලක් ද අයවැය යෝජනා යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා යොදවන ලදී.




2.8.1. රූපසටහන සමස්ත මූල්‍ය ප්‍රගතිය -මහාමාර්ග අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයසඳහා 2019 වර්ෂයේදී වෙන් කෙරුණු සමස්ත සංශෝධිතප්‍රතිපාදනය රු.මිලියන 256,330.67 ක් වූ අතර ඉන් 61% ක ප්‍රමාණයක් මහාමාර්ග අංශයේ උන්නතිය වෙනුවෙන් යොදවා ඇති අතර වර්ෂය සඳහා මුළු වියදම රු.මි.156,673.22 ක් ලෙස වාර්තා විය. 2018 වර්ෂය සැලකීමේදී අමාත්‍යාංශය සඳහා ලබා දුන් සමස්ත මූල්‍ය ප්‍රතිපාදනය වූ රු.මි.196,318.42 ක මුදලින් 85% ක ප්‍රමාණයක් උපයෝජනය කොට තිබුණි. තවද, 2017 වර්ෂයේදී සංශෝධිත අයවැය ප්‍රතිපාදනයෙන් 93% වූ රු.මි.192,039.10 ක සමස්ත වියදමක් වාර්තා කොට තිබුණි.

පසුගිය දශකයක කාලය සලකා බැලීමේ දී,වැඩිම අයවැය ප්‍රතිපාදනය 2019 වර්ෂය සඳහා ද, වැඩිම වියදම 2017 වර්ෂයේදී ද වාර්තා කොට තිබුණි. 2019 වර්ෂය සඳහා ඉහළම අයවැය

ප්‍රතිපාදනයක් වෙන් කොට තිබුණ ද, ඒ හා සමානව වියදම් වාර්තා වී නොවීමට වර්ෂය තුල සිදු වූ අක්මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදයන් හා අතුරු සහතිකපත් ගෙවීම්හි වූ ප්‍රමාදයන් බලපා තිබුණි. තවද, ඇතැම් ව්‍යාපෘතිවල භෞතිකව වැඩ ක්‍රියාත්මක වුවද ඊට අදාල මූල්‍ය අගයන් වාර්තා කරන කාලපරිච්ඡේදය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සකසන ලද අවසාන ගිණුම් හි වාර්තා නොවීමද බලපා ඇත.



රූපසටහන9.1.2.මහාමාර්ග අංශය සඳහා වෙන් කරන ලද සංශෝධිත අයවැය ප්‍රතිපාදන සංයුතිය 2019

ඉහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි 2019 වර්ෂය තුල සමස්ත අයවැය ප්‍රතිපාදනයෙන් වැඩිම අයවැය ප්‍රතිපාදනය අධිවේගී මාර්ග සංවර්ධනය සඳහාද, අවම අයවැය ප්‍රතිපාදනය අමාත්‍යාංශයීය මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහාද වෙන් කොට තිබුණි.

2.8.1. මෙහෙයුම් ක්‍රියාකාරකම්

අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන අයිතම/වර්ග 03කට වෙන් කර දැක්විය හැකිය.

- අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් කටයුතු
- රාජ්‍ය අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් කටයුතු
- අමාත්‍යාංශ ආයතනික කටයුතු

2018 සහ 2019 වර්ෂයන් සඳහා අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 2.8.1.1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	අයිතමය/වර්ගය	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
117-1-1	අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම්	27.82	24.79	**89%**	60.29	55.22	**91%**
117-1-11	රාජ්‍ය අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම්	25.79	23.85	**92%**	26.94	21.97	**81%**
117-1-2	අමාත්‍යාංශ ආයතනික කටයුතු	220.63	188.31	**85%**	203.94	186.78	**92%**
	එකතුව	**274.24**	**236.95**	**86%**	**291.17**	**263.97**	**91%**

මෙම ප්‍රතිපාදන අමාත්‍ය කාර්යාලය, රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශයෙහි ආයතනික හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වියදම් දැරීමට වෙන් කර ඇත.මෙම ප්‍රතිපාදන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදා දැක්විය හැකි අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය , වැඩිදියුණු කිරීම හා මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලබයි. පුනරාවර්තන ප්‍රතිපාදන මගින් පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, සැපයුම් , නඩත්තු සේවා හා වර්ෂය තුල ඇතිවන අනෙකුත් පුනරාවර්තන වියදම් දරනු ලබයි.

මෙහෙයුම් කටයුතු සඳහා වැඩිම ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලබන්නේ අමාත්‍යාංශ ආයතනික කටයුතු හා ව්‍යාපෘති හා වැඩසටහන් බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වේ. 2019 වර්ෂය සඳහා ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 2018 වර්ෂයට වඩා ඉහළ අගයක් ගන්නා අතර,වර්ෂයන් දෙක තුලම එහි උපයෝජනය ප්‍රතිශතාත්මක වශයෙන් සමාන ස්වරූපයක් ගනී.

2.8.2. සංවර්ධන ක්‍රියාකාරකම්

සංවර්ධන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන අයිතම/වර්ග 07කට වෙන්කර දැක්විය හැක. ඒවා නම්,

- අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන
- මහාමාර්ග සංවර්ධන වැඩසටහන
- මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන
- ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන
- ආයතනික සහාය වැඩසටහන
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන

(අ) අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන

2019 වර්ෂයේදී අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක් සඳහා අමාත්‍යාංශ අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2018 වර්ෂයේ දී එම ගණන 07 කි. අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා 2018 සහ 2019වර්ෂ අවසානයේදී අත්පත් කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 78% සහ 45% කි. 2019 වර්ෂයේ දී ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ ප්‍රතිශතය 33% කින් පහත වැටී ඇති අතර එයට ප්‍රධාන හේතුව ලෙස විදේශ මූල්‍යනයේ පැවති අතුරු ගෙවීම් සහතිකවල සිදු වූ ප්‍රමාදයන් මෙන්ම අක් මුදල් ලැබීමේ ප්‍රමාදයන්ද බලපා ඇත. ඒ අනුව 2019 වර්ෂය අවසාන වනවිට සැලකිය යුතු වටිනාකමක අතැති බිල්පත් ප්‍රමාණයක් වාර්තා වී තිබුණි.ප්‍රමාණවත්අක්මුදල් හා අතුරු ගෙවීම් සහතිකවලට අදාල කටයුතු නියමිත පරිදි ක්‍රියාත්මක වූයේ නම්වර්ෂය අවසාන වනවිට මූල්‍ය ප්‍රගතිය ඉහළ අගයක් ගැනීමට හැකි ව තිබුණි.

වගු අංක 2.8.2.1. - අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2018			2019		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන	78,627.25	61,454.94	78%	122,706.4	55,488.55	45%

2019 වර්ෂය සඳහාමූල්‍යප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 06න් , සියළුම ව්‍යාපෘතික්‍රියාත්මක තත්වයේ පැවති අතර පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - III වන අදියර 2019 වර්ෂයේ නොවැම්බර් මස මහජනතාව සඳහා විවෘත කරන ලදී. තවද, මීට අමතර වශයෙන් වර්ෂය තුල දක්ෂිණ අධිවේගී මාර්ගයේ අදියර කිහිපයක්ද මහජනතාව සඳහා විවෘත කරන ලද නමුත් ඇතැම් වැඩ නිම කිරීමට පැවති හෙයින් සම්පූර්ණ මාර්ගය මෙම වර්ෂය තුල විවෘත නොකෙරිණි. අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතට ගැනෙන එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය වගු අංක 2.8.2.2 මඟින් දක්වා ඇත.

වගු අංක **2.8.2.2.**-අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනේ එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-3-7	මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	7,907.00	7,676.00	97%	3,326.00	2,874.19	86%
117-2-3-9	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	52,709.5	40,019.94	76%	80,481.00	36,943.45	46%
117-2-3-10	පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - III කඩවත සිට කෙරවලපිටිය දක්වා - චීන ආධාර	17,385.0	13,223.59	76%	31,669.67	15,397.62	49%
117-2-3-13	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	90.00	75.30	84%	51.0	44.35	87%
117-2-3-15	නව කැලණි පාලම සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය	111.75	53.03	47%	128.00	119.20	93%
117-2-3-16	වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය	32.00	30.45	95%	7050.80	109.74	2%
	එකතුව	**78,627.25**	**61,454.94**	**78%**	**122,706.47**	**55,488.55**	**45%**

වාර්තා ගත දත්ත අනුව, කුළුණු මතින් ඉදිවන මාර්ග ව්‍යාපෘතිය තුලින් ඉහළම මූල්‍ය ප්‍රගතියක්ද, වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය තුලින් අවම මූල්‍ය ප්‍රගතියක්ද නිරීක්ෂණය කළ හැක. වර්ෂය තුල අත්තිකාරම් ගෙවීම් සිදු කිරීම වාර්තාගත කාලපරිච්ඡේදය තුල ගිණුම්ගත නොවීම මෙම අවම ප්‍රගතිය කෙරෙහි බලපා ඇත.

(ආ) මහාමාර්ග සංවර්ධන වැඩසටහන

මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ, 2019 වර්ෂයේදී ව්‍යාපෘති 24 ක් සඳහා හා 2018 වර්ෂයේදී ව්‍යාපෘති 26 ක් සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

තවද, මහාමාර්ග සංවර්ධනය සඳහා 2018 වර්ෂයට වඩා ඉහළ මූල්‍ය ප්‍රතිපාදනයක් 2019 වර්ෂය තුල වෙන් කර තිබුණත් , එම වර්ෂ දෙකෙහි වියදම් වාර්තා වීම ප්‍රතිලෝම වශයෙන් විය.

වගු අංක 2.8.2.3- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2018			2019		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
මහාමාර්ග සංවර්ධන වැඩසටහන	79,201.60	72,218.51	91%	89,010.80	71,779.78	81%

පූර්වයෙන් සඳහන් කළ ව්‍යාපෘති 24 අතුරින් වර්ෂය තුල ව්‍යාපෘති 04 ක් සම්පූර්ණ අයවැය ප්‍රතිපාදනයම උපයෝජනය කරගෙන තිබූ අතර 100% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. තවත් ව්‍යාපෘති 15ක් 50% ක්ඉක්මවූ මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ඉතුරු ව්‍යාපෘති 05, 50% අඩු මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. අවමමූල්‍ය ප්‍රගතිය වන 31% ක මූල්‍ය ප්‍රගතියවාර්ෂික වැඩසටහන් වන මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය මඟින් හා මාර්ග නිර්මාණ අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන් 02 වාර්තා කොට තිබුණි.

උක්ත ව්‍යාපෘතීන් හි මූල්‍ය ප්‍රගතිය අවම වීම කෙරෙහි අක්මුදල් ලැබීම ප්‍රමාද වීම හේතු වී තිබුණි. එම ව්‍යාපෘතීන් සඳහා ප්‍රමාණවත් අක්මුදල් ප්‍රමාණයක් වර්ෂය තුල නිදහස් කරන ලද්දේ නම් එම ව්‍යාපෘති 02හි මූල්‍ය ප්‍රගතිය වාර්තා ගත අගයට වඩා ඉහළ අගයක් ගත හැකිව තිබුණි.

2018 වර්ෂයේ දී මෙන්ම 2019 වර්ෂයේදීද, වාර්ෂික වැඩසටහන් 06 ක් ක්‍රියාත්මක වූ අතර ඒවා නම්,මාර්ග සහ පාලම් නඩත්තු කිරීම(මාර්ග නඩත්තු භාරකාර අරමුදල),රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය,මහකොළඹප්‍රදේශයේ රථවාහන ගමනාගමනකළමනාකරණ ව්‍යාපෘතිය,රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හා ක්‍රියාත්මක හා සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල ඉඩම් අත්පත්කරගැනීම්,යන්ත්‍රෝපකරණ, පර්යේෂණ හා සංවර්ධන, සමීක්ෂණ සහ ආයෝජන, පුහුණුවීම් යන ව්‍යාපෘති වේ. ඒ අතුරින් උක්ත ඡේදය මඟින් සඳහන් කළ ව්‍යාපෘති 02 100% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇති නමුත් ඉතිරි

ව්‍යාපෘති 4 හි ප්‍රගතිය සාධනීය මට්ටමක නොපැවතින.

වගු අංක2.8.2.4- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි එක් එක් ව්‍යාපෘතීන් මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-1	මාර්ග සහ පාලම් නඩත්තු කිරීම(මාර්ග නඩත්තු භාරකාර අරමුදල)	5,385.00	4,360.00	81%	5,000.00	4,961.32.	99%
117-2-4-10	බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර III	105.00	10.85	10%	428.40	230.42	54%
117-2-4-13	පාදෙණිය - අනුරාධපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	1.00	1.0	100%	2.24	2.24	100%
117-2-4-15	මාර්ග අංශ සහයක ව්‍යාපාතිය - ලෝක බැංකු ආධාර	-	-	-	1,150.00	1,150.00	100%
117-2-4-18	හැටන් - නුවරඑළිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - ආර්ථික සංවර්ධන සහයෝගීතා පදනම	30.60	30.60	100%	16.00	10.74	67%
117-2-4-21	රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය	19.00	16.36	86%	25.00	7.73	31%
117-2-4-22	මහකොළඹ නගර ප්‍රදේශයේ රථවාහන ගමනාගමන ව්‍යාපෘතිය කළමනාකරණ	41.50	37.44	90%	64.00	20.01	31%
117-2-4-23	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	1,215.00	694.58	57%	1,892.00	1,013.38	54%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-29	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	163.25	47.70	29%	508.56	233.06	46%
117-2-4-30	උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේකණය / අරමුදල් සැපයීම- ආසියානු සංවර්ධන බැංකුව	828.00	708.57	86%	1,011.50	545.95	54%
117-2-4-31	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	275.00	145.51	53%	171.00	107.90	63%
117-2-4-32	කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	1,661.00	1,461.06	88%	1,800.00	1,137.50	63%
117-2-4-39	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - චීන සංවර්ධන බැංකුව	3,465.00	3,420.91	99%	4,969.00	2,528.34	51%
117-2-4-40	බස්නාහිර පළාත් ජාතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	1,222.70	1,022.50	84%	1,084.00	747.08	69%
117-2-4-41	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	1,765.00	1,437.26	81%	1,988.00	1,189.32	60%
117-2-4-42	අධිවේගී මාර්ග සබඳතා ව්‍යාපෘතිය	99.50	60.39	61%	19.00	18.26	96%
117-2-4-43	දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව	2,829.05	2,473.37	87%	2,128.00	1,431.13	67%
117-2-4-44	ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන	16,559.00	13,933.00	84%	19,344.80	11,514.52	60%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
	(I Road) ආසියානු සංවර්ධන බැංකුව						
117-2-4-45	මධ්‍යම හා ඌව පළාත් හි මාර්ග හා පාලම් පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,902.00	1,901.42	100%	1,877.50	1,035.30	55%
117-2-4-46	ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණ කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 3අදියර II -චීන සංවර්ධන බැංකුව	4,470.00	3,654.21	82%	4,167.50	3,027.11	73%
117-2-4-47	ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය	279.00	208.04	75%	128.50	41.53	32%
117-2-4-48	ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය	92.00	31.22	34%	71.00	70.53	99%
117-2-4-49	පානදුර දක්වා සමුද්‍රීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	200.00	76.2	38%	224.00	123.70	55%
117-2-4-51	රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති	35,200.00	35,194.90	100%	39,672.00	39,671.34	99.9%
117-2-4-52	සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කරගැනීම	1,145.00	1,089.44	95%	1,185.00	889.87	75%
117-2-4-53	යන්ත්‍රෝපකරණ, පර්යේෂණ හා සංවර්ධන, සමීක්ෂණ සහ ආයෝජන, පුහුණුවීම්	149.00	101.98	68%	83.80	71.50	85%
	එකතුව	**79,201.60**	**72,218.51**	**91%**	**89,010.80**	**71,779.78**	**81%**

භෞතික වැඩකටයුතු අවසන් කර තිබුණු පහත දැක්වෙන ව්‍යාපෘතීන්හි බිල්පත් ගෙවීම් කටයුතු පමණක් 2019 වර්ෂයේදීසිදු කෙරුණි.ඒවා නම්,

- ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය
- පාදෙණිය - අනුරාධපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- හැටන් - නුවරඑළිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - ආර්ථික සංවර්ධන සහයෝගීතා පදනම

(ඇ) මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන සඳහා 2019 වර්ෂය තුලදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

වගු අංක 2.8.2.5 මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2018			2019		
	සංශෝධිත ප්‍රතිපාදනය(රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන	10,865.00	7,558.99	70%	7,647.20	6,523.36	85%

මෙම වාර්ෂික වැඩසටහන සඳහා2019 වර්ෂයේදී වැඩිවීමක් දක්නට ලැබුණි. ඒ අනුව, 2019 , 2018 වර්ෂයට වඩා අඩු මූල්‍ය ප්‍රතිපාදනයක් වර්ෂයේදී ඉහළ අත්පත් කරගැනීමක් වෙන්කොට තිබුණද, වියදමෙහි 15% ක නිරීක්ෂණය වේ.

වගු අංක 2.8.2.6 මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහනසඳහා පළාත් මට්ටමින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	පළාතෙහි නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-5-01,2,3	බස්නාහිර පළාත	2,217.00	756.99	34%	742.00	647.98	87%
117-2-5-04,5,6	මධ්‍යම පළාත	1,018.00	473.51	47%	406.20	352.04	87%
117-2-5-07,8,9	දකුණු පළාත	914.00	559.25	61%	907.40	442.01	49%
117-2-5-10, 11,12,13,14	උතුරු පළාත	807.00	592.88	73%	577.00	556.94	97%
117-2-5-15,16,17	නැගෙනහිර පළාත	318.00	284.27	89%	232.60	176.76	76%
117-2-5-18, 19	වයඹ පළාත	759.10	595.35	78%	598.00	588.90	98%
117-2-5-20,21	උතුරු මැද පළාත	587.90	494.13	84%	311.00	306.86	99%
117-2-5-22,23	ඌව පළාත	319.00	177.83	56%	105.00	96.14	92%
117-2-5-24,25	සබරගමුව පළාත	425.00	335.04	79%	208.00	181.76	87%
117-2-5-26	බදු	800.00	589.74	74%	560.00	438.97	78%
117-2-5-29	ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් ව්‍යාපෘති	2,700.00	2,700.00	100%	3,000.00	2,735.00	91%
	එකතුව	**10,865.00**	**7,558.99**	**70%**	**7,647.20**	**6,523.36**	**85%**

(ඇ)පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

වගුඅංක 2.8.2.7පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2018			2019		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන	14,333.0	13,311.00	93%	15,521.10	9,410.1	61%

පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක විය. තවද වර්ෂය තුල ඉහළ අයවැය ප්‍රතිපාදනයක් වෙන් කර ඇති නමුත් වර්ෂාවසානය වන විට වාර්තා වූ මූල්‍යප්‍රගතියේ 32% ක අඩුවීමක් දක්නට ලැබේ.

සමස්ත වැඩසටහන මගින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.

වගු අංක2.8.2.7.පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-6-8	ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අඛලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය	400.00	243.68	61%	325.30	325.30	100%
117-2-6-14	පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම	343.00	221.20	64%	262.70	178.79	68%
117-2-6-16	ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II - HSBC බැංකුව	346.00	346.00	100%	250.00	157.00	63%
117-2-6-17	පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - කුවේට් ආධාර	345.00	279.21	81%	619.10	201.02	32%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-6-18	පාලම් 46 ක් නැවත ඉදිකිරීම - ප්‍රංශ රජය	119.00	118.50	100%	23.0	19.54	85%
117-2-6-19	ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය	2,247.00	2,212.24	98%	1324.5	1290.0	97%
117-2-6-20	පැලියගොඩ - පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම - ඕස්ට්‍රියානු ආධාර	437.00	435.60	100%	131.2	131.1	99%
117-2-6-21	දෙවන නව කැළණි පාලම ඉදිකිරීම - ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය	9,160.00	8,525.39	93%	12,427.3	6988.6	52%
117-2-6-22	පාලම් නඩත්තු කිරීමේ ඒකකයක් ස්ථාපනය කිරීම	15.00	12.27	82%	5.00	0.25	5%
117-2-6-23	තට්ටුතුරේ සපත්තු පාලම හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	5.00	2.73	55%	-	-	-
117-2-6-24	රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීම - ස්පාඤ්ඤ අරමුදල්	916.00	914.18	100%	153.0	118.5	67%
	එකතුව	**14,333.0**	**13,311.00**	**93%**	**15,521.1**	**9,410.10**	**61%**

මෙම වැඩසටහන යටතේ, වාර්ෂික වැඩසටහන් 03 ක් ලෙස ජාතික මහාමාර්ගයන්හි පිහිටි භානියට පත් අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය,පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම හා පාලම් නඩත්තු කිරීමේ ඒකකයක් ස්ථාපනය කිරීම යන ව්‍යාපෘති 2019 වර්ෂය තුලද ක්‍රියාත්මක විය. වර්ෂය තුල රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීම යන ව්‍යාපෘති 03 හිබිල්පත් ගෙවීමේ කටයුතු සඳහා පමණක්

ප්‍රතිපාදන වෙන් කරන ලදී. තට්ටුතුරෙයි පාලම ඉදිකිරීමට අදාල බිල්පත් ගෙවීම් කටයුතු 2018 වර්ෂයේ දී අවසන් කළ බැවින් 2019 වර්ෂයේදී තව දුරටත් ප්‍රතිපාදන වෙන් කිරීමක් අවශ්‍ය නොවිණි.

ක්‍රියාත්මක කෙරුණු ව්‍යාපෘති අතුරින්ව්‍යාපෘති 02ක් 2018 වර්ෂයට වඩා ඉහළ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති නමුත් අනෙක් ව්‍යාපෘති වාර්තා කොට ඇත්තේ 2018 වර්ෂයට වඩා අඩු අගයකි.

(ඉ)ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂය තුල ක්‍රියාත්මක වූයේ ජාතික මහාමාර්ග ජාලයේ නායයාම් ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය පමණි. නමුත් 2018 වර්ෂයේදී, වැඩ අවසන් කර තිබූ නමුත් බිල්පත් පියවීම අවසන් නොවීම මත දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද ප්‍රතිපාදන වෙන් කරන ලදී.

වගුඅංක2.8.2.9. ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2018			2019		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන	3,805.0	3,780.75	99%	3,454.0	2,726.3	79%

2019 වර්ෂය තුල ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය 2018 වර්ෂයට වඩා රු.මි.372 ක ප්‍රමාණයකින් ඉහළ නංවා තිබුණද, එහි මූල්‍ය කාර්යසාධනය 20% ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. ඒ අනුව 2018 හා 2019 යන වර්ෂයන් 02 සැලකීමේදී ඉහළ මූල්‍ය කාර්යසාධනයක් වාර්තාකොට ඇත්තේ 2018 වර්ෂය තුලය.

වගුඅංක2.8.2.10. ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)	සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
117-2-7-8	දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	723.0	722.52	99%	-	-	-
117-2-7-13	ජාතික මහාමාර්ග ජාලයේ නායයාම් ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය	3,082	3,058.22	99%	3,454.0	2,726.3	79%
	එකතුව	**3,805.0**	**3,780.75**	**99%**	**3,454.0**	**2,726.3**	**79%**

(ඊ) ආයතනික සහාය වැඩසටහන

ආයතනික සහාය වැඩසටහන යටතේ, 2018 වර්ෂයේදී මෙන්ම2019 වර්ෂයේදී දප්‍රතිපාදන වෙන්වූයේ එක් අයිතමයක් සඳහා පමණි. එබැවින් මෙහි මූල්‍ය ප්‍රගතියලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් වියදමෙහි (ප්‍රාග්ධන)මූල්‍ය ප්‍රගතියසඳහන් කල හැක. එහි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

වගුඅංක 2.8.2.11 ආයතනික සහාය වැඩසටහනේ එක් එක් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-8-1	මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන	6,112	6,112	100%	6,500.0	6,500.0	100%
	එකතුව	**6,112**	**6,112**	**100%**	**6,500.0**	**6,500.0**	**100%**

උක්ත වැඩසටහන සලකා බලනු ලබන වර්ෂයන් 02 හි දීම, 100% ක් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කොට ඇත. එසේම මාර්ග සංවර්ධන අධිකාරියෙහි මෙහෙයුම් පිරිවැය සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම උපයෝගී කරගෙන ඇත.

(උ) ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන

මෙම වැඩසටහන සඳහා 2019වර්ෂයසඳහා වෙන්කර තිබූ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය 2018 වර්ෂයට වඩා 50% ට වඩා අඩු අගයක් වන අතර 2019 වර්ෂයේදී අත්කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 99% ක් හා 2018 වර්ෂයේදී එම අගය 65% ක් ලෙස වාර්තා විය.

වගුඅංක 2.8.2.12. ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මඟින් අත්කරගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැඩසටහනේ නම	2018			2019		
		සංශෝධිත ප්‍රතිපාදනය(රු.මි.)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-9-1	ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන	3,100.0	2,003.81	65%	1200.0	1,197.5	99%

උක්ත වැඩසටහනේ 2019 වර්ෂය සඳහා වූ මූළු වියදම2018 වර්ෂයට වඩා අඩු අගයක් ගත් නමුත් මෙම වැඩසටහන වර්ෂය තුල කාර්යක්ෂමව ක්‍රියාත්මක වූ අතර වර්ෂාවසානය වන විට බිල්පත් කිහිපයක් ගෙවීම් සඳහා ඉතුරුව පැවතුණි.

2.8.3 දේශීය බැංකු ණය

මාර්ග සංවර්ධන වැඩසටහන් කීපයක් සඳහා මහා භාණ්ඩාගාරයේ සහතිකය සහිතව දේශීය වාණිජ බැංකු මගින් ණය ලබාගෙන ඇත. විදේශීය ණය හෝ අරමුදල් යම් ව්‍යාපෘතියක් සඳහා ලබා ගත නොහැකි වූ විට මෙම ණය ලබාගැනීම සිදු විය. එපරිදිම, විදේශීය මූල්‍යනය සහිත වුව ද රජය මගින් අරමුදල් සපයන ඉඩම් මිලදී ගැනීම වැනි අයිතමයන් සඳහා දේශීය බැංකු ණය ලබාගත් අවස්ථාද ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රථම වරට දේශීය බැංකු ණය ලබාගෙන; රජයේ සුරක්ෂිතතාවය මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති නමින් 2011 වර්ෂයේ දී ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එතැන් සිට මේ දක්වා ව්‍යාපෘති 10 ට අධික ප්‍රමාණයක් වෙනුවෙන් දේශීය බැංකු ණය ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘති අතරින් රජයේ සුරක්ෂිතතාවය මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සහ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර II යන ව්‍යාපෘති සඳහා කිසිදු විදේශීය අරමුදල් මූල්‍යනයකින් තොරව දේශීය බැංකු ණය හරහා ක්‍රියාත්මක වේ.

2019 වර්ෂය තුල දී මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් රු.බි.37 ක මුදලක් දේශීය බැංකු ණය ලෙස ලබාගෙන ඇත. මෙම ණය මුදල මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර II, පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හා රජයේ සුරක්ෂිතතාවය මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති කටයුතු සඳහා යොදාගෙන ඇත.

පහත සඳහන් වගු අංක 2.8.3.1මඟින් මෙම ණය මුදල් 2019 වර්ෂය තුලව්‍යාපෘති අනුව බෙදීගොස් ඇති ආකාරය දක්වා ඇත.


වගු අංක 2.8.3.1. දේශීය බැංකු ණය උපයෝජනය - 2019

ව්‍යාපෘතියේ නම	උපයෝජනය කරන ලද වටිනාකම (රු.මි.)
රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	197.878
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර II	36,594
පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර III	276.91
එකතුව	37,068.788

දේශීය බැංකු හරහා 2019 වර්ෂයේ දී ලබාගත් ණය මුදලින් ඉහළම උපයෝජනයක් වී ඇත්තේ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර II සඳහා වන අතර අවම උපයෝජනය සිදු කර ඇත්තේ දේශීය බැංකු ණය ආධාර ව්‍යාපෘතිය සඳහා වේ.

2011 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසාන වන තෙක් රු.මිලියන 277,125.3 ක පමණ දේශීය බැංකු ණය මාර්ග සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලබාගෙන ඇත.ඒ අනුව, එම ණය ලබා දී ඇති ආයතනයන් හි දායකත්වය රූප සටහන 2.8.3.1 හා වගු අංක 2.8.3.2 හි දක්වා ඇත.

රූප සටහන 2.8.3.1. මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු දායකත්වය වගු අංක



2.8.3.2දේශීය බැංකු දායකත්වය

දේශීයබැංකුව	ණයමුදල (රු.බි)
ලංකාබැංකුව	106.3
මහජනබැංකුව	37.06
ජාතිකඉතිරි කිරීමේ බැංකුව	74.07
කොමර්ෂල්බැංකුව	7.21
හැටන්නැෂනල් බැංකුව	28.26
ජාතිකසංවර්ධන බැංකුව	8.35
සම්පත්බැංකුව	14.5
ලංකාසංවර්ධන මූල්‍ය සංස්ථාව	1.33
එකතුව	277.1

ඉහත රූප සටහන අනුව,ලංකා බැංකුවඉහළම ණය වටිනාකමක් ලබා දී ඇති අතර අවම ණය පහසුකම ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් ලබා දී ඇත.මෙම ණය ලබා ගැනීමේ දී රජයට අයත් බැංකු ප්‍රමුඛතාවය ලබා ඇති අතර පෞද්ගලික බැංකු කිහිපයක් ද ණය පහසුකම් සලසා ඇත.

වෙළුම II

ඉදිරි දැක්ම

2.9 අනාගතය සඳහා ඉදිරි දැක්ම

2020 වර්ෂයේ සිට ඉදිරියට රජයේ සියළුම අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන විසින් වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රතිපත්ති දිශානතියට අනුව ක්‍රියාකිරීමේ වගකීම උසුලනු ලැබේ. ඒ අනුව සියළුම රාජ්‍ය ආයතන විසින් සිය ව්‍යාපෘති හා වැඩසටහන් ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් දක්වා ඇති ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම උදෙසා සැලසුම් සකස් කළ යුතු වේ.

වර්තමාන බලයට පත් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය "සෞභාග්‍යයේ දැක්ම හා මෙහෙවර" යන මාවත ඔස්සේ ඉදිරි වර්ෂ 05 ක කාලයක් සඳහා හඳුන්වා දී ඇත.රට තුල යටිතල පහසුකම් නැංවීමේ ප්‍රධානතම අමාත්‍යාංශය ලෙස ක්‍රියාකරන මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්වමාර්ග සංවර්ධන අධිකාරිය යටතේ නිරන්තරයෙන් හා වරින් වර සිදු කරනු ලබන මාර්ග නඩත්තු කටයුතුවලට අමතරවපහත නව මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ.

"සෞභාග්‍යයේ දැක්ම හා මෙහෙවර" ප්‍රතිපත්ති ප්‍රකාශයේ පරිච්ඡේද අංක 07 අනුව, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල සමාජීයය හා ආර්ථික වශයෙන් පවතින පරතරය මුලිනුපුටා දැමීම සඳහා "උප- නාගරීකරණය" නම් උපායමාර්ගය හඳුන්වා දී ඇත.

එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම උදෙසා ගෝලීයව පිළිගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගනු ලැබූ පහත සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සිය ප්‍රමුඛ අවධානය යොමු කිරීමට මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය මඟින් බලාපොරොත්තු වේ.

- කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය ඉදිකිරීම

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව මෙම අධිවේගී මාර්ගය අදියර 03 ක් යටතේ ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර දැනට අදියර I හා II හි සිවිල් වැඩ කටයුතු සිදු කරමින් පවතී. මහජනතාව වෙත වේගවත් ගමනාගමන පහසුකමක් ලබාදීම සඳහා මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ඉදිරි වසර 02 – 03 තුල නිම කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය "වරාය නගරය" දක්වා දීර්ඝ කිරීම තුලින් අතුරුගිරිය හරහා බත්තරමුල්ල දක්වා සම්බන්ධ කිරීම.

මෙම නව මාර්ග ජාලය තුලින් බත්තරමුල්ල දක්වා ප්‍රවේශය ලබා දීම සඳහා;

- වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම
- නව කැළණි පාලම ඉදිකිරීම
- ඔරුගොඩවත්ත සිට අතුරුගිරිය හරහා බත්තරමුල්ල දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ගය ඉදිකිරීම

යන ව්‍යාපෘතින් හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළ යුතු වේ.

- මාර්ග ජාලයනැවත ඇතිරීමහා නවීකරණය කිරීම.

මේ යටතේ පවතින මාර්ග ජාලය ප්‍රමුඛතාවය මත නැවත ඇතිරීමහා නවීකරණය කිරීම සිදු කරනු ලැබේ.

- වැඩිදියුණු කළ රථවාහන කළමණාකරණ පද්ධතියක් හඳුන්වා දීම.

වැඩිදියුණු කළ රථවාහනකළමණාකරණ පද්ධතියක් හඳුන්වා දීම තුලින් මාර්ග තදබදය අවම කිරීම හා මාර්ග සුරක්ෂිතතාවය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

- මාර්ගවල සෑම කි.මී. 3-5 අතර පරතරයකින් ඉස්සර කිරීමේ මංතීරු ස්ථාපිත කිරීම.

මහාමාර්ගයන්හි කි.මී.3-5 අතර පරතරයක් පවත්වාගනිමින් ඉස්සර කිරීමේ මංතීරු ඉදිකිරීම මඟින් හඳුනාගත් මාර්ග තදබදය අධිකව පවතින ප්‍රදේශවල මාර්ග තදබදය ලිහිල් කිරීම හා මාර්ග අනතුරු අවම කිරීම අපේක්ෂා කෙරේ.

- "විකල්ප මාර්ග ජාලයක්" ඉදිකිරීම

විකල්ප මාර්ග ජාලයක් හඳුනාගෙන වැඩිදියුණු කිරීමේ අරමුණ වන්නේ පවතින ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග සඳහා ඉහළ ප්‍රවේශයක් ලබා දීමේ පහසුතාවයන් වැඩිදියුණු කිරීමයි.

පරිච්ඡේදය 3

සමස්ත මූල්‍ය කාර්යසාධනය

සටහන: මූල්‍ය කාර්යසානය වාර්තා කර ඇත්තේ අමාත්‍යාංශයේ අංශ 02 සඳහා වේ. (මහාමාර්ග අංශය හා බනිජතෙල් සම්පත් සංවර්ධන අංශ)

සියළුම වියදම් 2020/02/07 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය වාර්තාවට අනකූලව සකස් කොට ඇත.

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම් මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	කළඹ 2019	කළඹ 2018	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		67,887,468,424	78,318,563,897	ඒසිඒ-3
	තැන්පතු		1,351,879,462	2,164,250,411	ඒසිඒ-4
	අත්තිකාරම් ගිණුම්		13,220,824	9,038,450,129	ඒසිඒ-5
	වෙනත් ලැබීම්			-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**69,252,568,710**	**89,521,264,437**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**69,252,568,710**	**89,521,264,437**	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
250,195,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	217,243,803	262,482,315	ඒසිඒ-2(ii)
124,535,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	116,508,982	153,646,387	
94,120,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	77,389,793	1,319,112,581	
-	පොළී ගෙවීම්	8	-	-	
150,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	126,868	-	
469,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඈ)		**411,269,445**	**1,735,241,283**	

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	කර්තව්‍ය 2019	කර්තව්‍ය 2018	
	මූලධන වියදම්				
9,080,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,486,934	10,900,219	
8,137,243,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	6,502,306,044	14,155,694,060	
6,553,100,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	6,510,588,883	6,990,365,000	ඒඩිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
4,877,000	හැකියා වර්ධනය	14	2,461,057	615,978,903	
241,410,700,000	වෙනත් මූලධන වියදම්	15	143,410,483,910	155,012,984,180	
256,115,000,000	මුළු මූලධන වියදම් (ඉ)		**156,432,326,828**	**176,785,922,363**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**1,698,232,642**	**11,409,108,260**	
	කැන්පතු ගෙවීම්		1,661,942,323	2,357,379,829	ඒඩිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		23,674,180	9,050,219,696.00	ඒඩිඒ-5
	වෙනත් දෙපාර්තමේන්තු සඳහා වන ගෙවීම්				
	ආදායමින් ආපසු ගෙවීම්		12,616,139	1,508,735	
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		**158,541,828,915**	**189,930,271,906**	
	2018 දෙසැම්බර් 31 දිනට අඩුම ශේෂය = (ඇ-උ)	ඌ	**(89,289,260,205)**	**(100,409,007,469)**	

ඒසිඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2019 රු.	2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	78,245,703,038
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	67,887,468,424	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**67,887,468,424**	**78,245,703,038**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	321,605,796	389,469,813
සහනාධාර සහ මාරුකිරීම්	77,389,793	19,811,424
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	28,781,939	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	136,985	3,375,868
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**427,914,513**	**412,657,105**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**67,459,553,912**	**77,833,045,933**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	1,013,035
අත්තිකාරම් අයකර ගැනීම්	1,230,582	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**1,230,582**	**1,013,035**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	67,404,503,961	77,673,185,044
අත්තිකාරම් ගෙවීම්	23,674,180	-
උපණය ගෙවීම්		25,131,492
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**67,428,178,140**	**77,698,316,536**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(67,426,947,558)**	**(77,697,303,501)**

එසිඒ-පි

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2,019 රු	2018 රු
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසිඒ-6	619,409,582	8,279,201,969
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(ඒ)	48,553,409	31,430,872,767
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3	136,985	3,375,868
මුළු වත්කම්		**668,099,976**	**39,713,450,604**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(157,294,181)	(464,298,123)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		619,409,582	8,279,201,969
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසිඒ-5(බී)	-	31,379,260,439
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	එසිඒ-4	205,847,590	515,910,451
අග්‍රිම ශේෂය	එසිඒ-3	136,985	3,375,868
මුළු වගකීම්		**668,099,976**	**39,713,450,604**

පිටු අංක 07 සිට 81 දක්වා එසිඒ 1 සිට එසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 82 සිට 199 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමේහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 25/02/2020		දිනය : 25/02/2020

ඩබ්. ඩබ්. ආර්. පේමසිරිය
ලේකම්
මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය
08 වන මහල, "මගනෑගුම මහමැදුර"
අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

J.K. Nilupul S. Perera
Chief Financial Officer
Ministry of Roads & Highways
07th Floor, "Maganeguma Mahamedura"
No 216, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla.

එස්ඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2019 රු.	2018 රු.
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**32,606,354**	**135,742,432**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	1,351,879,462	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**1,351,879,462**	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,384,485,816	135,742,432
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**1,384,485,816**	**135,742,432**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(32,606,354)**	**(135,742,432)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**(0)**	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**(0)**	-

ඒසිඒ-2(ii)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 117

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

රු.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉදිරි බලපෑම		
	මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොකට අනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රික සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
		(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)* 100	
<u>පුනරාවර්තන වියදම</u>											
<u>වැඩසටහන (1) සහ (2)</u>											
වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය											
සටහන - 5 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ											
<u>පුද්ගල පඩිනඩි</u>											
1001 වැටුප් හා වේතන	11	175,000,000	-	-	175,000,000	148,657,795	-	148,657,795	26,342,205	15	Annexure 01
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්	11	16,650,000	-	(2,900,000)	13,750,000	12,137,738	-	12,137,738	1,612,262	12	
1003 වෙනත් දීමනා	11	59,200,000	-	2,245,000	61,445,000	56,164,655	283,615	56,448,270	4,996,730	8	
එකතුව		**250,850,000**	-	**(655,000)**	**250,195,000**	**216,960,188**	**283,615**	**217,243,803**	**32,951,197**		
සටහන - 6 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා											
<u>ගමන් වියදම්</u>											
1101 දේශීය	11	3,450,000	-	2,640,000	6,090,000	5,887,536	-	5,887,536	202,464	3	
1102 විදේශීය	11	10,550,000	-	(5,520,000)	5,030,000	2,993,146	-	2,993,146	2,036,854	40	
එකතුව (අ)		**14,000,000**	-	**(2,880,000)**	**11,120,000**	**8,880,682**	-	**8,880,682**	**2,239,318**		
<u>සැපයීම්</u>											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	11	6,600,000	-	2,555,000	9,155,000	8,462,167	-	8,462,167	692,833	8	
1202 ඉන්ධන	11	21,000,000	-	740,000	21,740,000	20,890,747	-	20,890,747	849,253	4	
1203 ආහාර පාන හා නිල ඇඳුම්	11	1,050,000	-	865,000	1,915,000	1,779,326	-	1,779,326	135,674	7	
1204 වෛද්‍ය සැපයීම්	11	-	-	-	-	-	-	-	-	-	
1205 වෙනත්	11	1,750,000	-	740,000	2,490,000	2,391,848	-	2,391,848	98,152	4	
එකතුව (ආ)		**30,400,000**	-	**4,900,000**	**35,300,000**	**33,524,088**	-	**33,524,088**	**1,775,912**		

ඒසිඒ-2(ii)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 117

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ධනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

රු.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
	මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මූදල් පොකට් ආනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන් අනුව)	මුළු වියදම්	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
		(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)* 100	
<u>නඩත්තු වියදම්</u>											
1301 වාහන	11	16,600,000	-	3,680,000	20,280,000	18,308,647	-	18,308,647	1,971,353	10	
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	11	1,200,000	-	475,000	1,675,000	1,653,111	-	1,653,111	21,889	1	
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	800,000	-	(310,000)	490,000	462,457	-	462,457	27,544	6	
එකතුව (අ)		**18,600,000**	**-**	**3,845,000**	**22,445,000**	**20,424,214**	**-**	**20,424,214**	**2,020,786**		
<u>සේවා</u>											
1401 ප්‍රවාහන	11	5,780,000	-	(3,130,000)	2,650,000	2,298,444	-	2,298,444	351,556	13	
1402 තැපැල් හා සන්නිවේදන	11	10,900,000	-	(450,000)	10,450,000	10,078,227	-	10,078,227	371,773	4	
1403 විදුලිය හා ජලය	11	5,950,000	-	(1,300,000)	4,650,000	4,368,561	-	4,368,561	281,439	6	
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	11	29,600,000	-	555,000	30,155,000	30,047,951	-	30,047,951	107,049	-	
1405 වෙනත්		-	-	-	-	-	-	-	-	-	
1406 කල්බදු වාහන සඳහා පොළී ගෙවීම්		-	-	-	-	-	-	-	-	-	
1408 මෙහෙයුම් කල්බදු යටතේ මිලදීගත් වාහන සඳහා කල්බදු වාරික	11	8,750,000	-	(985,000)	7,765,000	6,886,814	-	6,886,814	878,186	11	
1409 වෙනත්		**60,980,000**	**-**	**(5,310,000)**	**55,670,000**	**53,679,997**	**-**	**53,679,997**	**1,990,003**		
එකතුව (ඇ)											
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)		**123,980,000**	**-**	**555,000**	**124,535,000**	**116,508,982**	**-**	**116,508,982**	**8,026,018**	**-**	

ඒසිඒ-2(ii)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

3	ඉඟිනියාගල, ගම්පහ, කොළණිය නාමල් ඔය හරහා පාලමක් ඉදිකිරීම (මී 72, පරාස 06) 2014/24	72	අම්පාර	98%
4	බුල්නෑව, කෑගම,හෙලබොදුගම කලා ඔය හරහා පාලමක් ඉදිකිරීම(2018/005)	15	අනුරාධපුරය	75%
5	කෑගල්ල, බුලත්කොහුපිටිය,ලෙව්වල රිටිගහ ඔය හරහා පාලමේ ඉතිරි වැඩ නිම කිරීම.(මී 36, තනි පරාසය) 2018/002	36	කෑගල්ල	90%
6	උඩුගම, ගල්බැඳිදොල හරහා පාලමක ඉදිකිරීම (මී 15, තනි පරාසය) 2014/58	15	ගාල්ල	80%
7	නාගොඩ,කොන්ඩගල, හෝමා දොල හරහා පාලමක් ඉදිකිරීම (මී 24, තනි පරාසය) 2014/61	24	ගාල්ල	59%
8	හිනිඳුම බටහිර, යද්දෙහි කන්ද ඇල හරහා පාලමේ ඉතිරි වැඩ නිම කිරීම. (මී16) 2014/18	16	ගාල්ල	97%
9	දඹාන, මීගොඩ, තට්ටගල්යායඇල හරහා පාලමක් ඉදිකිරීම (මී 12, තනි පරාසය) 2018/004	12	බදුල්ල	75%
10	හක්මන, කිත්සිරිපුර, නයිගල දොල හරහා පාලමේ ඉතිරි වැඩ නිම කිරීම (මී 8, තනි පරාසය)	8	මාතර	97%
11	තෙල්දෙණිය, පහුරුගොල්ල ග්‍රාමයේ උඩවල - ගල්වල මාර්ගයේ පාලමේ පුළුල් කිරීම(2018/06 A)	17	මහනුවර	60%

ඇමුණුම 12

විගණන වාර්තාව

මගේ අංකය எனது இல. My No. ආර්සීටී/ඒ/එම්ආර්එච්/එෆ්ඒ/2019/02 | මෙහේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2020 ජූනි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය

මහාමාර්ග, මාර්ග සංවර්ධන හා බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

මහාමාර්ග, මාර්ග සංවර්ධන හා බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහාමාර්ග, මාර්ග සංවර්ධන හා බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහාමාර්ග, මාර්ග සංවර්ධන හා බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතයයි.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම

විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

(i) වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

(ii) අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

(iii)හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

(iv) සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **භාණ්ඩාගාර පොත් සමඟ එකඟ නොවීම**

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව අමාත්‍යාංශයේ බණිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාළ භාණ්ඩාගාර පොත්වල සඳහන් එකතුව රු. 123,418,859 ක ගාස්තු ආදායම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි. ඒ හේතුවෙන්, මුළු ආදායම් ලැබීම්ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.1.2 ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්

අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 67,600,247,550 ක් වුවද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු. 67,887,468,424 ක් ලෙස දක්වා තිබුණි.

(ii) **තැන්පතු ලැබීම්**

භාණ්ඩාගාර පොත් අනුව, තැන්පතු ලැබීම් රු. 1,373,147,081 ක් ලෙස සඳහන් වුවද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු. 1,351,879,462 ක් ලෙස දක්වා තිබුණි.

(iii) අත්තිකාරම් ලැබීම්

භාණ්ඩාගාර පොත් අනුව, අත්තිකාරම් ලැබීම් රු.42,287,268 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම අගය රු.13,220,824 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු.29,066,444 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) වෙනත් ලැබීම්

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ කිසිදු ලැබීමක් දක්වා නොතිබුණු නමුත් වෙනත් ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු. 163,802,015 ක් රැස් කර තිබුණු අතර, ඉන් රු. 12,616,139 ක් ආදායමෙන් ආපසු ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අනුව, වෙනත් ලැබීම් ලෙස රු. 151,185,876 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර ආකෘති පත්‍රයේ සඳහන් නොවූ ආදායමෙන් ආපසු ගෙවීම් ලෙස රු. 12,616,139 ක් දක්වා තිබුණි.

1.6.1.3 තැන්පතු ගෙවීම්

භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් රු.1,617,026,030 ක් ලෙස සඳහන් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම අගය රු.1,661,942,323 ක් ලෙස දක්වා තිබුණි.

1.6.1.4 අත්තිකාරම් ගෙවීම්

භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.39,228,348 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එම අගය රු.23,674,180 ක් ලෙස දක්වා තිබුණි

1.6.1.5 අග්‍රිම ශේෂය

ඉහත සඳහන් නිරීක්ෂණ අනුව, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය අවාසි රු. 89,209,564,017 ක් විය යුතු වුවත් එය රු. 79,696,188 ක් වැඩියෙන් රු. 89,289,260,205 ක අවාසි ශේෂයක් දක්වා තිබුණි.

1.6.2 අක් මුදල් ගැලැපුම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පොත් සහ අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අතර අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් අතර වෙනස වූ රු.12,875,249 ක වටිනාකම අක්මුදල් ගැලපුම් ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වූ තැන්පතු ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු. 1,351,646,095 ක් සහ රු. 1,371,636,310 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එය පිළිවෙලින් රු. 1,373,147,081 ක් සහ රු. 1,617,026,030 ක් වී තිබුණි. ඒ අනුව අක් මුදල් ගැලපුම් ගිණුමේ එම වෙනස පිළිවෙලින් රු. 245,389,720 ත් හර වශයෙන්ද රු. 21,500,986 ක් බැර වශයෙන් ද ගැළපිය යුතුව තිබුණත්, එය පිළිවෙලින් රු. 290,306,013 ක් සහ රු. 233,366 ක් වශයෙන් ගැළපීම් කර තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, අග්‍රිම ලැබීම් රු.67,600,247,550 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.67,887,468,424 ක් ලෙස සඳහන් කර තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.29,418,965 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.28,781,939 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අංශයට අදාලව රැස් කර ගත් ගාස්තු ආදායම වන රු.123,418,859 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගාස්තු ලැබීම් යටතේ සටහන් කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, ආදායම් නොවන වෙනත් ලැබීම් ලෙස රැස් කර තිබූ රු.151,185,875 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

(ඉ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු. 333,596,037 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් විය යුතු වුවත් එය රු. 11,990,241 ක් අඩුවෙන් රු. 321,605,796 ක් ලෙස දක්වා තිබුණි.

1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

(අ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අය කර ගැනීම් රු. 31,108,736 ක් වී තිබුණත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 1,230,582 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 29,878,154 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, අත්තිකාරම් ගෙවීම් රු. 40,925,066 ක් වී තිබුණත් එය රු. 17,250,886 ක් අඩුවෙන් රු. 23,674,180 ක් ලෙස දක්වා තිබුණි.

1.6.3.3 මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව නැන්පතු ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු.1,351,646,095 ක් සහ රු.1,371,636,310 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම අගයන් පිළිවෙලින් රු.1,351,879,462 ක් සහ රු. 1,384,485,816 ක් ලෙස සටහන් කර තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැබිය යුතු නිළධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ඔක්තෝබර් 25 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් නැව්තෙල් ව්‍යාපාරයේ නියැලෙන ව්‍යාපාරිකයන්ගෙන් දැනට අයකරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව 2019 වර්ෂයේ සිට ඇමෙරිකානු ඩොලර් 1,000 සිට ඇමෙරිකානු ඩොලර් 5,000 දක්වා ඉහළ දැමීමට ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය වෙත අනුමැතිය ලබා දී තිබුණි. මුදල් රෙගුලාසි 85 (2) (ආ) ප්‍රකාරව මෙන්ම 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව කිසියම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ හේතු සහ කළ යුතු සංශෝධන පිළිබඳව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු නමුත් එසේ වාර්තා කර නොතිබුණි. එමෙන්ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණ බැවින් ආදායම් ඇස්තමේන්තුව හා රැස්කළ ආදායම අතර රු. 31,418,859 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු. 92,000,000 සමඟ සැසඳීමේ දී සියයට 34 ක් විය.

(ආ) 2018 වර්ෂය තුළ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් රු. 2,000,000 ක් වූ හිඟ ආදායම්, අතහැර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 113 (3) (ආ) හා (ඇ) ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අවසරය ලබා ගෙන නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීමට වග බලාගත යුතුවේ. එහෙත් නිසි ඇගයීමකින් හා සැලසුම් කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන මාරුකිරීම හේතුවෙන් අමාත්‍යාංශයේ වැය විෂයයන් 07

කට අදාලව ලබාදී තිබූ රු.මිලියන 10.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයකට අදාලව වෙන් කර ඇති ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී පමණක් පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන ලබාගත යුතු වුවත් නිසි ඇගයීමකින් තොරව පරිපූරක ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් වැය විෂයයන් 03 කට අදාලව පරිපූරක ප්‍රතිපාදන මඟින් අනුමත කරවාගෙන තිබූ එකතු වටිනාකම රු.මිලියන 15,696 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණු අතර වැය විෂයයන් 06 කට අදාලව පරිපූරක ප්‍රතිපාදන සියයට 70 ත් සියයට 90 ත් අතර උපයෝජනයකින් තොරව ඉතිරිවී තිබුණි. තවද, එක් වැය විෂයකට අදාලව රු.මිලියන 225 ක පරිපූරක ප්‍රතිපාදන මුළුමනින්ම වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය මඟින් අයවැය ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 11 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 9,166.7 ක ප්‍රතිපාදන එකී වැය විෂයය සඳහා කිසිදු වියදමක් නොදරා සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි 66/69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ඈ) එකතු වටිනාකම රු.මිලියන 168,567.2 ක ශුද්ධ ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 72 කට අදාලව නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් සියයට 25 සිට සියයට 99 දක්වා පරාසයක විහිදුනු එකතු වටිනාකම රු. මිලියන 100,347.3 ක ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඉ) අමාත්‍යාංශය විසින් ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා හේතුවෙන් මූලික වියදම් ඇස්තමේන්තු හා සංශෝධන වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 25 සිට සියයට 900 ක් දක්වා පරාසයක පැවතුණි.

(ඊ) වැය විෂයයන් 12 කට අදාලව මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 5,076.6 ක එකතු වටිනාකමකින් යුත් අතිරේක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

2.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම

මු.රෙ.214 ප්‍රකාරව බැරකම් ලේඛන නිතිපතා පරීක්ෂා කොට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට නොපියවූ බැඳීම් හා බැරකම්වල එකතුව රු.මිලියන 40,465 ක් විය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි අංක 104(3)	අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබූ සියළුම වාහන අනතුරුවල ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දින 09 ත් මාස 04 ත් අතර කාලයක් ගතවී තිබූ අතර වාහන 3 ක අනතුරු සඳහා ප්‍රාරම්භක වාර්තාවක් හෝ ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ 2019 වර්ෂය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 08 න් අනතුරු 04 ක් සිදු වී වසරකට ආසන්න කාලයක් ගත වී තිබුණ ද අදාළ ප්‍රාරම්භක වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි අංක 104(4)	වාහන අනතුරු පිළිබඳ පූර්ණ වාර්තාවක් අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් වර්ෂය තුළ මහාමාර්ග අංශයේ සිදුවූ අනතුරු 11 ක් සම්බන්ධයෙන් සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ සිදුවූ අනතුරු 04 ක් සම්බන්ධයෙන් වූ අදාළ පූර්ණ වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 156 (5)	සමහර ගෙවීම් වවුචර වෙනස් කිරීම සඳහා මකන දියර භාවිතා කර තිබුණ අතර එම වෙනස් කිරීම් නිවැරදි කිරීම් වගකිව යුතු නිලධාරීන් විසින් සහතික කර නොතිබුණි.

(ආ)	2019 අගෝස්තු 20 දිනැති අංක EC/EDR/01/2019 දරන මැතිවරණ කොමිෂන් සභා සභාපතිගේ වක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 128 (1) (ඒ)	මැතිවරණ කාලසීමාවේ දී හා ඡන්ද විමසීම් නිවේදනයට පූර්වාසන්නයෙන් වූ කාලසීමාව තුළ මහජන මුදල් අධික ලෙස වැය කරමින් විවිධ ව්‍යාපෘති හෝ වෙනත් සංවර්ධන කටයුතු පිළිබඳව හෝ කාරණා සම්බන්ධයෙන් ප්‍රචාරක දැන්වීම් මුද්‍රිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් නොකළ යුතු නමුත් ඊට පටහැනිව බනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු. 5,553,154 ක වියදමක් දරා තිබුණි.
(ඇ)	2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වා දී නොතිබූ අතර අදාළ ප්‍රඥප්ති පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇඟයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.
(ඈ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 03 (ඇ) ඡේදය	බනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ "වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම" පිළියෙල කර නොතිබුණි.
(ඉ)	2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 03 ඡේදය	2018 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නියමිත කාල වකවානු තුළ සිදුකර නොතිබුණි.

2.5 තැන්පතු

මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කිරීම හෝ ඉක්මණින් ආපසු ගෙවීම සිදු කළයුතු වුවත් පහත සඳහන් අවස්ථාවලදී එසේ සිදු කර නොතිබුණි.

(අ) බණිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාල හිටපු අමාත්‍යවරයෙකු වෙත නිකුත් කරන ලද වට්ටෝරු භාණ්ඩ නැවත භාර නොදීම නිසා, අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්ගේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් ප්‍රදානය වන රු.233,366 ක මුදල 2015 දෙසැම්බර් 17 වන දින සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) මහාමාර්ග අංශයට අදාලව සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශයක් වූ ත්‍රිකුණාමලය පුල්මුඩේ මාර්ගයේ පාලමක් ඉදිකිරීම වෙනුවෙන් ලද රු. මිලියන 88.23 ක මුදලක් අදාල කාර්යය ඉටුනොකර 2016 මාර්තු 31 දින සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2011 අප්‍රියෙල් 01 දින සිට හානිවූ මාර්ග ප්‍රතිස්ථාපනය සඳහා රඳවාගෙන තිබූ රු.මිලියන 5.7 ක තැන්පතු අදාල කාර්ය ඉටුනොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේදී ව්‍යාපෘතීන්ට අදාලව ප්‍රායෝගිකව ලභාකරගැනීමට අසීරු ඉලක්කයන් නිර්ණය කර තිබුණි. තවද, 2019 වර්ෂයේ ඇස්තමේන්තුවේ සඳහන් මූල්‍ය වෙන්කිරීම් පිළිබඳ නොසලකා අයවැය වෙන්කිරීම් ලෙස වෙනත් අගයන් යොදා තිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බනිජතෙල් සම්පත් සංවර්ධන අංශයට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් 07 ක් අතුරින් රු. මිලියන 50 ක ඇස්තමේන්තු වෙන් කිරීම් සහිත ක්‍රියාකාරකම් 05 ක් 2019 දෙසැම්බර් 31 වන දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද රු. මිලියන 10 ක ඇස්තමේන්තු වෙන් කිරීම් සහිත ක්‍රියාකාරකම් 02 ක් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළ අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ පාලන, සංවර්ධන, ප්‍රසම්පාදන, මූල්‍ය හා අභ්‍යන්තර විගණන යන අංශ ආවරණය වන පරිදි පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 35 ක් අතුරින් ක්‍රියාකාරකම් 05 ක් අවසන් කර නොතිබුණි.

3.1.3 අමාත්‍යාංශයේ අරමුණු ප්‍රකාරව කටයුතු නොකිරීම

ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමේ එක් අරමුණක් වේ. මේ සඳහා අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය පසුවිපරම් කිරීම හා ඇඟයීම අමාත්‍යාංශය මඟින් ඉටුකළ යුතුය. ඉන්ධන අලෙවි කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් 1461 ක් පැවති අතර ඉන් ඉන්ධන පිරවුම්හල් 1254 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට හා ඉතිරි ඉන්ධන පිරවුම්හල් 207 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත්ව තිබුණි. මෙම ඉන්ධන පිරවුම්හල් වල කටයුතු සොයා බැලීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ විශේෂ අධීක්ෂණ කණ්ඩායමක් යොදා තිබූ අතර එම කණ්ඩායම විසින් ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් 1461 අතුරින් ඉන්ධන පිරවුම්හල් 73 ක් පරීක්ෂා කර තිබූ අතර ඉන් පිරවුම්හල් 28 ක් හෙවත් සියයට 38 ක් දුර්වල තත්ත්වයක පැවතුණි. තවද, 2018 වර්ෂය තුළ ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් පිරවුම්හල් 207 ක් අතුරින් 03 ක් පමණක් භෞතිකව පරීක්ෂා කර තිබූ අතර ඉන් පිරවුම්හල් 02 ක් සාමාන්‍ය තත්ත්වයේ හා දුර්වල තත්ත්වයේ පැවතුණි. විගණනය මඟින් ගම්පහ හා ගාල්ල දිස්ත්‍රික්කවල ඉන්ධන පිරවුම්හල් 24 ක් සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේ දී එයින් ඉන්ධන පිරවුම්හල් 21 කම ඉන්ධන සැපයුම් සේවාවේ ප්‍රමාණාත්මක අඩුපාඩු පැවතුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මාර්ග නඩත්තු භාරකාර අරමුදල මඟින් ජාතික මහාමාර්ග කි.මී.12,220 ක්, පාලම් 4,660 කට ආසන්න ප්‍රමාණයක් සහ ගුවන් පාලම් 12 ක සාමාන්‍ය නඩත්තු කටයුතු, කාලානුරූප නඩත්තු කටයුතු, ව්‍යූහාත්මක ඉදිකිරීම් නඩත්තු කටයුතු, සංඥා ලාම්පු නඩත්තු කටයුතු සහ හදිසි වැඩ යන වැඩ විෂයයන් සියයට 100 ක භෞතික ඉලක්කයක් ලඟාකර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරී කාර්යාල යටතේ පවතින එම නඩත්තු කටයුතුවලින් සමාලෝචිත වර්ෂය තුලදී නඩත්තු කර තිබුණේ පළාත් 9 ක් ආවරණය කරමින් කි.මී.357.63 ක් පමණකි.

(ආ) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 500 ක අයවැය ප්‍රතිපාදනයක් සිදු කර තිබූ බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණද භෞතික ප්‍රගතිය පිළිබඳ ඉලක්ක සඳහන් කර නොතිබුණි. තවද, 2019 වාර්ෂික ඇස්තමේන්තුව අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සිදුකර තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 50 ක් පමණක් බව නිරීක්ෂණය වූ අතර ඉන් රු.මිලියන 14 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කුළුණු මත ඉදිවන මාර්ග ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයට අදාලව ඉදිකිරීම් කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණ අතර සියයට 20 ක භෞතික ප්‍රගතියක් ඉලක්කගත කර තිබුණි. වාර්ෂික ඇස්තමේන්තුව අනුව රු.මිලියන 125 ක් වෙන් කර තිබුණත් වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව ලභා කර ගත් භෞතික ප්‍රගතියක් සඳහන් කර නොතිබුණි.

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම තුළින් නාගරික ප්‍රදේශයන්හි මාර්ග තදබදය අවම කිරීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිසංස්කරණය කටයුතු සිදුකල ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පළමු අදියර ඉලක්කගත ප්‍රගතිය සියයට 45 වුවත් සත්‍ය ප්‍රගතිය සියයට 29 ක් වූ අතර, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ දෙවන අදියර ඉලක්කගත ප්‍රගතිය සියයට 10 වුවද සත්‍ය ප්‍රගතිය සියයට 0.2 කි. කෝට්ටේ - බෝපේ මාර්ගයේ ඉලක්කගත ප්‍රගතිය සියයට 34 වුවත් සත්‍ය ප්‍රගතිය සියයට 25 ක් ද, කොට්ටාව තලගල මාර්ගයේ ඉලක්කගත ප්‍රගතිය සියයට 49 වුවත් සත්‍ය ප්‍රගතිය සියයට 29 ක් විය. නාවින්න - බොරලැස්ගමුව මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක නොකිරීමටද තීරණය කර තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තය ද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ නියාමනයට ලක් කෙරෙන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම් මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට

අදාළ මූලික කටයුතු 2006 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මඟින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබා දී තිබුණි. මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2018 ජූනි මාසය වන විට සකස් කර අවසන් කිරීමට සැලැසුම් කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර තිබූ තෙල් ටැංකි පද්ධතිය දැව සෘණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට ඉතිරිව ඇති මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කර නොතිබුණි.

(ඈ) කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව සතු භූමියේ පිහිටුවා තිබූ තෙල් තොග ගබඩාව නවීකරණය සඳහා 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. නමුත් ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු. මිලියන 142.98 ක හිඟ මුදල ගෙවා නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) අතර 2015 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට ඇතුළත්වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 28 දින වන විට ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත්තු මිල වූ රු.37,165,183 ක් නාරා ආයතනය වෙත ගෙවා තිබුණි. නමුත් දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිළධාරීන් නොමැතිවීම හා අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ඛණිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය තුල 2019 වර්ෂය අවසන් වන විටත්, ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ JS 5 සහ JS 6 බිම් කොටස්වල ගවේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශයේ ටොටාල් සමාගම, 2016 පෙබරවාරි 18 වන දින එළඹෙන ලද ඒකාබද්ධ ගවේෂණ ගිවිසුම අත්සන් කිරීමේදී, සපුරා තිබිය යුතු පූර්ව අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා 2019 අගෝස්තු 27 දින නැවත සංශෝධිත ඒකාබද්ධ ගිවිසුමකට ඇතුළත් වන තෙක් කලින් අත්සන් කරන ලද ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී තිබුණි.

(උ) ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා බටහිර අක්වෙරළ තීරය ආශ්‍රිතව ද්විමාන හා ත්‍රිමාන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් මස 06 දින පැවති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික වශයෙන් විශේෂිත ව්‍යාපෘතියක් වන බැවින් ප්‍රමුඛතා පදනම මත කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ආර්ථික කළමනාකරණය සඳහා වූ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් උපදෙස් ලබා දී තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලද දිනයේ සිට ගිවිසුම අත්සන් කරන ලද දිනය වන 2018 මැයි 30 දක්වා වසර 1 ½ කට වැඩි කාලයක් ගත වී තිබුණි.

(ඌ) මන්නාරම් ද්‍රෝණියේ M_2 ගවේෂණ බිම් කොටසේ බනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා 2007 වසරේ දී සිදු කරන ලද ජාත්‍යන්තර ලංසු කැඳවීමේ වටයකින් පසු කෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම තෝරා ගෙන තිබුණු අතර 2011 වසරේ දී සිදු කරන ලද කැණීම්වලින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. මෙම සමාගම මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ කටයුතු අතරමඟ නවතා 2015 ඔක්තෝබර් 15 දින ගිවිසුම අවසන් කර තිබුණි. එතැන් සිට මෙම බිම් කොටසේ ගවේෂණ කටයුතු 2015 වසරේ සිට වසර 04 ක පමණ කාලයක් මුළුල්ලේ කිසිදු ප්‍රගතියක් අත් කර නොගෙන අතරමඟ නැවතී තිබුණි.

(එ) මන්නාරම් ද්‍රෝණියේ M_2 බිම් කොටසේ ගවේෂණ කටයුතු හා ස්වාභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේදී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් අයි.එච්.එස්. ග්ලෝබල් සමාගම තෝරාගෙන තිබුණි. ඒ සඳහා 2016 දෙසැම්බර් සිට 2018 අගෝස්තු දක්වා අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 300,000 ක් එනම් ශ්‍රී ලංකා මුදලින් රු.46,610,853 ක් දරා තිබුණද අලෙවි ප්‍රවර්ධන කටයුතු අසාර්ථකවී තිබුණි.

(ඒ) මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන්ගතව සිදු කරන ගුරුත්ව හා චුම්භක සමීක්ෂණ මඟින් දත්ත රැස් කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු, 2012 වර්ෂයේ දී ආරම්භ කලද මෙම

ව්‍යාපෘතිය වසර 07 ක් පුරා ලංසු කැඳවීම, ලංසුකරුවන් තෝරා ගැනීම ආදී කටයුතු හැර වෙනත් ප්‍රගතියක් අත්පත් කර ගෙන නොතිබුණි.

3.2. විදේශ ආධාර ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ, තාක්ෂණික පිරිවිතරයේ 401.7.1 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, අධිවේගී මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය කිලෝමීටරයකට මීටර් 1.5 - 2.3 ක පරාසයක පැවතිය යුතු අතර තාක්ෂණික පරීක්ෂණ වාර්තාවන්හිදී කොන්ත්‍රාත්කරුවන් විසින් එම අදාල දර්ශකයන් ලඟාකරගෙන තිබුණි. කෙසේවුවත්, භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි අධිවේගී මාර්ගයේ සමහර කොටස්වල මාර්ගයේ සුමටතාවය ධාවනය වන මෝටර් රථවල යහපත් ධාවන තත්ත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වී නොතිබුණි.

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියට අදාල ශක්‍යතා වාර්තාවේ 8.33 වගන්තියට අනුව, සේවා ප්‍රදේශයන් කිහිපයක් හඳුනාගෙන තිබුණද, සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිදු සැලැස්මක් හෝ ප්‍රමාණ පත්‍ර මඟින් මූල්‍ය ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. ඒ අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ 46 වන කිලෝමීටරයෙහි පිහිටි වැලිපැන්න සේවා මධ්‍යස්ථානයෙන් අනතුරුව කි.මී.173 ක් වූ අධිවේගී මාර්ගයේ අවසානය දක්වා භාවිතා කරන මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබා ගත නොහැකි තත්ත්වයක් පැවතුණි.

(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ උපවගන්ති 2.4 සහ 2.6 ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීමේ කමිටුව විසින් ලංසු ලියවිලි විධිමත් පරිදි ඇගයීමක් සිදුකල යුතු වුවද, දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ කොන්ත්‍රාත් පැකේජ 02 කට අදාලව මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඒ අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු පත්‍ර සහ ප්‍රමාණ පත්‍ර අතර රේට් විෂමතා සහ වැඩ විෂයන් සඳහා වන වැරදි අර්ථ නිරූපණ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28.73 ක අලාභයක් ව්‍යාපෘතියට සිදුවී තිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 31 දිනට නිකුත් නොකරන ලද ණය මුදල් ප්‍රභවය මත ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට අදාලව රු. මිලියන 1,180.44 ක් සහ දෙවන ඒකාබද්ධ මාර්ග

ආයෝජන වැඩසටහනට අදාලව රු.මිලියන 206.03 ක මුදලක් කැපකරු කොමිස් ලෙස ණය සැපයුම් නියෝජිතායතනය වෙත ගෙවා තිබුණි.

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.4(iii) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබාදෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අදාල කොන්ත්‍රාත්තුවේ මුළු ගෙවීම් වලින් සියයට 90 ක් සම්පූර්ණ වීමට ප්‍රථම අය කර ගත යුතුය. නමුත් පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය අදියර III වෙනුවෙන් ලබා දුන් අත්තිකාරම් මුදලින් රු.මිලියන 870 ක් එම කොන්ත්‍රාත්තුවේ මුළු ගෙවීම් වලින් සියයට 99 ක් ගෙවා තිබියදී සහ අදාල ණය ගිවිසුම 2019 දෙසැම්බර් 10 දින අවසන් වීමට පෙරද අය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඊ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3:1 වගන්තිය හා 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සියළුම පිරිවැය ඇතුලත්වන පරිදි ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතුය. එහෙත් දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ පැකේජ 01 හා 03 ට අදාලව වැඩ ප්‍රමාණ පත්‍රයේ දක්වා තිබූ පිරිවැය පිළිවෙලින් රු.මිලියන 134.32 හා රු.මිලියන 150 ක් වූ අයිතම 235 න් අයිතම 198 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ඉටුකර නොතිබුණු අතර ඒ අනුව ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 42.65 ක් වූ සවලීකරණ අත්තිකාරම් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(උ) ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය)

(i) ශ්‍රී ලංකා රජය, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව වෙතින් යෙන් මිලියන 12,381ක ණය මුදලක් ලබා ගැනීම සඳහා 2013 මාර්තු 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 ඔක්තෝබර් වන විට ණය ගිවිසුම අත්සන්කර වසර 6ක් සම්පූර්ණ වී ඇතත් ඉතිරි පාලම් 19ක් ඉදි කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කර නොතිබූ අතර 2019 දෙසැම්බර් 31 දින වන විට ඉහත ණය මුදලින් සියයට 57 කට සමාන රු.9,206ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම ණය ගිවිසුම 2021 ජූලි 05 දින අවසන් වීමට නියමිත අතර එම කාලසීමාව දීර්ඝ කිරීමට බැංකුව එකඟ නොවීම නිසා ණය ගිවිසුම යටතේ ලබා ගැනීමට නියමිත ඉතිරි යෙන් මිලියන 5,378 එනම් රු.මිලියන11,708 ක් හෙවත් මුළු ණය මුදලින් සියයට 43ක් ලබා ගැනීමට නොහැකිව තිබේ.

(ii) එම ණය ගිවිසුමට අනුව පළාත් 05ක පැකේජ් 05ක් යටතේ පාලම් 37ක් ඉදිකිරීමට යෝජිතව තිබුණි. එහෙත් ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සැලසුම් නොකිරීම,

කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාද සහ පාලම් ඉදිකිරීමේ කටයුතුවල සිදුවූ ප්‍රමාදයන් නිසා අපේක්ෂිත පාලම් 37න් පාලම් 18ක් පමණක් 2018 දෙසැම්බර් 31 වන විට අවසන්කර තිබූ අතර පලාත් 3ක පැකේජ 3ක් යටතේ ඉදිකිරීමට යෝජිත පාලම් 19 ක ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි.

(උ) කොන්ත්‍රාත්තු පැකේජ 01 යටතේ වූ ඉංගිරිය රත්නපුර මාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් 2018 පෙබරවාරි 27 දින නොඑකඟවීම් 07 ක් වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව රු.මිලියන 1,687 ක වන්දි ඉල්ලා තිබූ අතර ඉන් රු. මිලියන 903.10 ක් 2018 අප්‍රේල් 30 දිනට පොලී ගාස්තුවලින් සමන්විත වී තිබුණි. මෙම හිමිකම් පෑමට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත් කාලය දින 911කින් වැඩිවීම බවත් එම දින දීර්ඝ වීමට ව්‍යාපෘතියේ වැඩ විෂයපථය වෙනස්වීම සහ වැඩ සැලසුම් අනුමත කිරීම ප්‍රමාදවීම හේතුවී තිබූ බවටත් කොන්ත්‍රාත්කරු විසින් බෙරුම්කරණයේදී කරුණු දක්වා තිබුණි. 2019 ඔක්තෝම්බර් 16 දිනැති අංක අමප/19/2683/119/095 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රු.මිලියන 1,000 ක් සහ ඊට අදාල බදු මුදල් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි.

(ඒ) ශ්‍රී ලංකාවේ රුපියලේ අගය අඛන්ඩව පිරිහෙමින් තිබෙන බැවින් විදේශ අරමුදල් ව්‍යාපෘතිවල විනිමය අලාභ වැඩිවෙමින් තිබේ. ව්‍යාපෘති නියමිත කාලය තුල නිම නොකිරීමත් මෙම විනිමය අලාභ වැඩිවීමට හේතු වී තිබුණි. ඒ අනුව ණය අරමුදල් වලින් කොටසක් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද ව්‍යාපෘති 4 ක සිදු වී තිබූ මුළු විනිමය අලාභ රු.මිලියන 10,161 ක් විය.

	ව්‍යාපෘතිය	විනිමය අලාභය රු.මි
	---	---
01.	මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) III අදියර	9,521
02.	ජාතිකමාර්ගජාලයේප්‍රධානපාලම්ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය)	194
03.	මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) II අදියර	421
04.	ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය)	25
	එකතුව	**10,161**

(ඒ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කර ඇති නමුත් ව්‍යාපෘති වත්කම් හා වගකීම් භාර දීමට කටයුතු නොකිරීම.

සමහර ව්‍යාපෘතිවල කටයුතු අවසන් වීමෙන් පසු එම ව්‍යාපෘති වල වත්කම් හා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන ආයතනය වෙත භාර දී එම ව්‍යාපෘති කාර්යන් කඩිනමින් අවසන් කර නොතිබුණ බැවින් අනවශය ලෙස අතිරේක අරමුදල් ව්‍යාපෘති වෙතුවෙන් වැය තිබුණි. එසේ ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇති නමුත් වත්කම් හා වගකීම් භාරනොදී පැවති ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.

ව්‍යාපෘතියේ නම	වැඩ නිම කල දිනය
ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය P1	2016.12.31
ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය P2	2017.12.31
විවිධ විදේශ අධාර යටතේ පාලම් 46 ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	2017.12.31
මහාමාර්ග ආංශ සහායක ව්‍යාපෘතිය	2015.06.30

(ඔ) අදියර 4 කින් සමන්විත මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම පිණිස ඕස්ට්‍රේලියානු සමාගමක් වෙත රු. මිලියන 1,759 ක් ගෙවා තිබියදී අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන වාර්තාවන් එකී සමාගමෙන් සිදුකරවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව හා උක්ත සමාගමෙන් අවසන් ශක්‍යතා අධ්‍යයන වාර්තාව ලබාගැනීමට කටයුතු නොකොට තවදුරටත් සම්බන්ධිත ශක්‍යතා අධ්‍යයනයන් සඳහා දේශීය ආයතන කිහිපයක් සමඟ රු.මිලියන 97 ක අගයකට ගිවිසුම් ගතවී තිබුණි.

(ඕ) මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටස වන පොතුහැර සිට ගලගෙදර දක්වා කොටසෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2018 මැයි 04 දින කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය නිකුත් කර තිබූ ජපාන කොන්ත්‍රාත්කරු සමඟ එකඟවූ ක්‍රියාවලිය සහ ටෝකියෝ මිට්සුබිෂි යූඑෆ්ජේ ලිමිටඩ් බැංකුව සමඟ පැවති මූල්‍ය සම්පාදන එකඟත්වය අවසන් කිරීම සඳහා 2020 මාර්තු 01 වන දින අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද, ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ 2019 ජූලි 12 දිනැති ලිපිය මඟින් උපදේශක සමාගම සමඟ පැවති ක්‍රියාවලියද අවසන් කර තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් විගණනයට ගැටළුකාරී විය.

(ක) ශ්‍රී ලංකා මහ බැංකු අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ පෙන්නුම් කරන ලද අග්‍රිම අරමුදල් නැවත අගය කිරීමේ ලාභ සහ අලාභ අදාල ලෙජර් ගිණුම් තුළ වරදවා ගිණුම් ගත කිරීම නිසා ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ යටතේ ගිණුම් වලට පහත බලපෑම් සිදු වී තිබුණි.

(i) සමාලෝචිත වර්ෂය තුළ වරදවා ගිණුම් ගත කරන සමුච්චිත ශුද්ධ බලපෑම රු. 1,389,156 ක් වූ නැවත ඇඟයීමේ ලාභ සහ අලාභ වල නිවැරදි අගය රු.2,378,196 ක් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ මහ බැංකු අග්‍රිම ගිණුමේ ශේෂය, අග්‍රිම අරමුදල් නැවත ඇගයීමේ ගිණුමේ ශේෂය සහ මුළු ජංගම වත්කම් රු. 3,767,352 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) 2019 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ රු. 2,778,312 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) මහ බැංකු අග්‍රිම ගිණුමේ ශේෂය සහ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂය අතර වටිනාකම රු. 3,767,354 ක වෙනසක් පැවතුණි.

3.3 වත්කම් කළමනාකරණය

2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම යන මැයෙන් නිකුත් කළ අයවැය වක්‍රලේඛ ප්‍රකාරව වියදම් ඒකක වලට ලබාදී තිබූ සම්පත් නිකරුනේ නැබීමෙන් වන පිරිවැය වැළැක්වීම සඳහා සෑම පියවරක්ම ගත යුතු බව සඳහන් වුවද, අමාත්‍යාංශය සතුව පැවති වාහනවලින් භාවිත කළ හැකි තත්ත්වයේ පවතින වාහන 07 ක් සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් තොරව අනාරක්ෂිතව ගාල් කර තිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 (i) සහ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතේ 612 වැනි අධිකාරය ප්‍රකාරව අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ මෙන්ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් කිසිවෙකු ඇප තැන්පත් කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය තුළ 2019 දෙසැම්බර් 31 දිනට කපා නොහල ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් වශයෙන් එකතුව රු. 1,064,226 ක් වූ රිය අනතුරු 17 ක් වාර්තා කර තිබුණි. එම රිය අනතුරු සිදු වී අවම වශයෙන් වසර 02 ක් ඉක්ම වී තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ශේෂයන් අයකර ගැනීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ඉලක්ක සඳහා සුදානම් වීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහාමාර්ග අංශය

වාර්ෂික වැඩසටහනෙහි තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් ඇතුලත් කර නොතිබුණු නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු 03 කට අදාලව පමණක් ඉලක්කයන් සහ දර්ශකයන් සඳහන් කර එම දර්ශකයන්ට අදාලව ප්‍රගතියක් නිශ්චිතව සඳහන් කර නොතිබුණි.

(ආ) බණිජතෙල් සම්පත් සංවර්ධන අංශය

(i) 2017 ජූලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු වක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා බනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට සෘජුවම අදාල වන තිරසර සංවර්ධන අරමුණ ලෙස "දැරිය හැකි පිවිතුරු බලශක්තිය" හඳුනාගෙන තිබුණ ද එම තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට 2019 වර්ෂය තුළ කිසිදු ව්‍යාපෘතියක් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය මෙහෙයවීම සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අභ්‍යන්තර වක්‍රලේඛයක් හෝ මහපෙන්වීමක් නිකුත් කොට නොතිබුණ අතර

ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ දී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හා දර්ශක නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තව ද ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණ අතර ඒ සඳහා නිලධාරියෙකු යොදවා නොතිබුණි.

(iv) ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

මහාමාර්ග අංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 වර්ෂයට අදලව සකස් කර තිබූ විගණන සැලැස්ම තුළ විගණන පැවරුම් 32 ක් ඇතුළත් කර තිබූ නමුත් ඉන් පැවරුම් 16 ක අභ්‍යන්තර විගණන කටයුතු ඒ ඒ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක වෙත පවරා තිබුණි. ඉතිරි විගණන පැවරුම් 16 අතුරින් අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 වර්ෂයේදී පැවරුම් 08 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය තුල අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලඟාකර ගැනීමට අභ්‍යන්තර විගණන අංශය අපොහොසත්වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශයෙහි ගිණුම් වර්ෂය අවසාන දිනට කාර්යමණ්ඩල සංයුතිය පහත පරිදි වේ.

(අ) මහාමාර්ග අංශය

සේවක වර්ගය	අනුමත කාර්යමණ්ඩලය	තථ්‍ය කාර්යමණ්ඩලය	පුරප්පාඩු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	31	26	05
තෘතීය මට්ටම	03	02	01
ද්විතීය මට්ටම	283	175	108
ප්‍රාථමික මට්ටම	39	30	09
	---	---	---
එකතුව	**356**	**233**	**123**
	===	===	===

කාර්යමණ්ඩලය පිළිබඳ පරීක්ෂාවේදී මහාමාර්ග අංශයේ ද්විතීයික මට්ටමේ තනතුරක් වන සංවර්ධන නිළධාරීන් 86 ක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය වූ අතර අමාත්‍යාංශයේ කාර්යභාරයට සෘජු සම්බන්ධතාවයක් නොමැති මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයන්හි රාජකාරී සඳහා අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිළධාරීන් 87 දෙනෙකු නිදහස් කර අමාත්‍යාංශය ඒ වෙනුවෙන් රු. 12,593,794 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරියට බඳවා ගන්නා ලද නිළධාරීන් 30 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. ඒ අනුව, සැලකීමේදී අනුමත කාර්යමණ්ඩලය නිසි ඇගයීමකින් හා සේවා අවශ්‍යතා නිර්දේශ ගැලපීමකින් තොරව වැඩිකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) බණිජතෙල් සම්පත් සංවර්ධන අංශය

තාත්ත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 04 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 02 ක් ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 18 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් ද, වශයෙන් පුරප්පාඩු 32 ක් පැවතුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආයතනයේ පුරප්පාඩු සංඛ්‍යාව ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී සියයට 33 ක් විය.

6.2 මානව සම්පත් සංවර්ධනය නිසිපරිදි සැලසුම් නොකිරීම

(අ) මහාමාර්ග අංශය

2019 වර්ෂය සඳහා ප්‍රධාන පුහුණු වැඩසටහන් 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර තිබුණත් එම සැලසුමේ සඳහන් වැඩසටහන් 02 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. පුහුණු සැලැස්ම සැකසීමේදී එක් එක් පුහුණු වැඩසටහන සඳහා ඇස්තමේන්තු පිරිවැය, සහභාගී වන නිළධාරීන් ගණන, වැඩසටහන පවත්වනු ලබන කාලසීමාව පිළිබඳව නිවැරදිව සැලසුම් කර පුහුණු සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශය

(i) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ පහත ඡේද ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සඳහා නිසිපරිදි සැලසුම් කර නොතිබුණි.

- 01 ඡේදය ප්‍රකාරව සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

- 02 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කාර්යමණ්ඩලය යොදවන ලබනු ආකාරය පිළිබඳ සැලසුම් සකස් කර නොතිබුණි.

- 03 ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරීන්ගේ නිපුණතා වෙන් වෙන්ව හඳුනා ගැනීමක් සිදු කර නොතිබුණ අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ii) 2019 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 22 ක් අතුරින් පුහුණු වැඩසටහන් 14 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) 2019 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 79 ක් උපයෝජනය කර නොතිබුණි.

එස්.එම්.එන්.තිලකරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

S. M. N. Thilakarathna
Assistant Auditor General
National Audit Office

සැලසුම් හා මෙහෙයුම් අංශය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය